FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

# රංගිරි ශ්‍රී ලංකා

RANGIRI SRI LANKA NEWSPAPER

FM 104.4,105.7
ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව
"රංගිරි ශ්‍රී ලංකා"
සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු

ශ්‍රී.බු.ව. 2564- ක්‍රි.ව. 2020
ඔක්තෝම්බර්(වප්)

මාසික බෞද්ධ සාර සංග්‍රහය ~ අන්තර්ජාල කලාපය

23




## ඇතුළු පිටු

බලගතු පින්කම් තුළින් කුඩා අකුසල් නැතිවේ

රුදුරු දිවිමඟ සොඳුරු කරවන අමාදම් දිව ඔසු

ජන සමාජය යහමඟට යොමු කිරීමට සඟරුවන පෙරමුණ ගත යුත්තේ ඇයි?

## අතිරේකය :-

තෙලිතුඩක් නැති සිත්තරාවිය

දහම් අධ්‍යාපනය සෑම බොඳු දරුවෙකුටම අනිවාර්ය විය යුතුයි

කරන කලට පව් මිහිරිය මීසේ
විඳින කලට දුක් දැඩි වෙයි ගිනිසේ

## රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය

රංගිරි ශ්‍රී ලංකා
RSL TELEVISION

UHF CH 60
PEO TV CH 22
Dialog Tv 21
Dish Tv 2532

## රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය
දේශයේ රන් හඬ

රංගිරි ශ්‍රී ලංකා
RSL RADIO

FM 104.4 - 105.7

වෙබ් : www.rangirisrilanka.lk

රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ ප්‍රකාශනයකි.




වස්සාන ඍතුවට අයත් වෙන ''වප් පෝය'' බෞද්ධ ජනතාවට වැදගත් වන්නේ වස් සමය තුළ දාන, ශීල, භාවනා යන පුණ්‍ය ක්‍රියාවන්හි වැඩි කාලයක් ගත කිරීමට අවස්ථාවක් ලැබීම නිසාමය.තම විහාරස්ථානයෙහි වස් සමාදන් වූ භික්ෂුන් වහන්සේලාගේ අනුශාසනා පරිදි ආමිස මෙන්ම ප්‍රතිපත්ති පූජාවන් සිදුකිරීමට අවස්ථාවන් වැඩි ප්‍රමාණයක් සැලසීම මෙහි ඇති විශේෂත්වයකි. වස් සමාදන් වූ භික්ෂූන් වහන්සේලාද තම වස්විසූ ස්ථානයෙහිම රැඳී සිටිමින් විවිධ පුණ්‍ය කර්මයන් සඳහා අනුබල හා ආධාර ලබාදීමද විශේෂ දෙයකි.ගරු කුසල කර්මයන්හි යෙදීම බහුලව සිදුවන්නේද මෙම කාලපරිච්ඡේදයේ දීය.

බුදුරජාණන් වහන්සේ දම්සභා මණ්පයේ දී රැස් වූ භික්ෂූන් වහන්සේලාගෙන් අසන ලද පැනයට නිවරැදි පිළිතුරක් ලබාදුන් සැරියුත් මහරහතන් වහන්සේට ශ්‍රාවකයන් අතරින් ප්‍රඥාවෙන් අගතනතුර ප්‍රදනය කරන ලද්දේද වප් පොහෝ දිනකය. ලංකාවාසී බෞද්ධ ජනතාවගේ පරම පූජනීයත්වයට පාත්‍ර වී ඇති ජයශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ලක්දිවට වැඩම කරවීම සඳහා ඉන්දියාවට ධර්මදූත කණ්ඩායමක් යවන ලද්දේ ද වප් පොහෝ දිනකය.

මහින්දාගමනයෙන් පසු ලංකාවේ පළමුවෙන්ම පැවිදි වූ අරිට්ඨකුමරු ධර්මය ඉගෙනගෙන පළමුවරට එය සංගායනා කරන ලද්දේ ද වප් පොහෝ දිනකය. මෙම පෙහොය නිමිති කරගෙන විහාරස්ථානයන්හි ආමිස පූජා ප්‍රතිපත්ති පූජාවන්හි යෙදීම දක්නට ලැබේ. මේ අනුව ලංකාවාසී බෞද්ධ ජනතාවට ඉතා වැදගත් පොහොයක් ලෙස සඳහන් කිරීමට පුළුවන.

ඇම්.ඩී.විජයවර්ධන

## පුදබිමක අසිරිය

# රැස්වෙහෙර

කුරුණෑගල හෙවත් ඇතුගල්පුරවරයට අයත් රැස්වෙහෙර හතළිස්පස් කෝරළයේ වන්නිපත්තුවේ පිහිටා ඇත. සේවානම්පියතිස්ස රජතුමා විසින් මෙම ස්ථානයේ දෙතිස්ඵලබෝධීන් වහන්සේ රෝපණය කර තිබේ. එම බෝධීන් වහන්සේගෙන් රශ්මි මාලාවන් විහිදුන නිසා මෙම ස්ථානයට රැස් වෙහෙර යන නාමය යෙදූ බවට ජනප්‍රවාදයක් පවතී. රැස්වෙහෙර ප්‍රතිමාව පිහිටි ගලෙහි එය නිර්මාණය කිරීමෙහිදී ගල් පර්වතය ඇතුළට හාරාතිබූ නිසා ''සැස්සේරුව'' යන නම භාවිතයට ගත්බව තවත් මතයකි.
මෙම විහාරස්ථානයේ ආරම්භය ගැන ඉතිහාසයේ සඳහන් වන්නේ දෙවනපෑතිස් රජතුමා විසින් බෝධි රෝපණය කිරීම මගින් පුණ්‍ය භූමියක් බවට පත් වූ බවයි. මෙම ස්ථානය පිළිබඳ තොරතුරු වංශකථාවෙහි සඳහන් වෙයි. මෙම විහාරස්ථානය අවට ස්වාභාවික ලෙන් රාශියක් දක්නට ලැබේ. එම ලෙන් භික්ෂුන්වහන්සේලා භාවනානුයෝගීව වාසය කළ බවට සෙල්ලිපි සාක්ෂි දරයි.



මෙම සෙල්ලිපි අතරින් ක්‍රි.පූ.1 සහ 2 වන සියවස් වලට අයත් ලිපි විසිහතරක් දක්නට ලැබේ.මෙම සෙල්ලිපිවලට අනුව ස්ථිර වශයෙන් ම රහතන් වහන්සේලා වැඩ සිටි බවට තොරතුරු අනාවරණය වී තිබේ.මෙම ලෙන් පසුකාලීන භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා යොදාගත් බවට තොරතුරු හෙළිවී තිබේ. වළගම්බා රාජ්‍ය සමයේද මෙම ස්ථානය දියුණු තත්ත්වයකට පත්ව තිබූ බවට මෙම සිද්ධියම හේතු වේ. මහනුවර රාජධානියේ රජකළ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ද මෙම විහාරස්ථානය පිළිසකර කර ආරක්ෂාකල බවට සාක්ෂි තිබේ.

මෙම විහාරස්ථානයේ ඇති පුරාවිද්‍යාත්මක ස්මාරක අතර දෙතිස්ඵල බෝධිය වැදගත් තැනක් ගනී.මෙයට අමතරව හිටි පිළිමය ද පිහිටා ඇති ආකාරයට අනුව වැදගත් තැනක් ගනී. සිරුරට ඇලෙන ආකාරයට චීවරය දක්වා ඇති අතර අභය මුද්‍රාවට අනුව පිළිමය සකස්කර තිබේ. මෙම පිළිමය උසින් අඩි 39ක්ද වන අතර සිරස් පතක්ද මෙම ප්‍රතිමාවට සවිකර තිබූ බවට නටඹුන් සාක්ෂි දරයි.මෙම ස්ථානය අවට ඉතිරිව ඇති නටඹුන් වලින් පැහැදිලි වන්නේ විහාර ආරාම රාශියක් පැවැති ස්ථානයක් බවට පත්ව තිබූ බවයි.මහායාන ධර්මයට අනුව ගොඩනැගූ පිං බිමක් ලෙසට ප්‍රකටය.සත්පිළිම විහාරයත් මෙම විහාර සංකීර්ණයට අයත්ව තිබේ.මුල්ම යුගයට අයත් සඳකඩපහණක්ද කොරවක් ගලක්ද හමු වී ඇත.

විහාර අභ්‍යන්තරයේ හිඳි පිළිමයක්ද දේවරූප කිහිපයක්ද දක්නට ලැබේ. මෙම ප්‍රතිමාවන්ට ඉහළින් මකර තොරණක්ද දක්නට ලැබේ. විහාර අභ්‍යන්තරයේ මහනුවර යුගයට අයත් චිත්‍ර කිහිපයක්ද දක්නට ලැබේ.පසු කාලීන රජවරුන් කිහිපදෙනෙකුගේ අනුග්‍රහය ලැබීමෙන් පසු විහාරාංගයන්ගෙන් පරිපූර්ණ ස්ථානයක් බවට පත්ව තිබේ. විවිධ පාලකයන්ගේ ගෞරවාදරයට භාජනය වූ මෙම ඓතිහාසික පුදබිම ආරක්ෂාව අපසතු වගකීම වන්නේය.

විජය තලවත්තේගෙදර

**පුහුදුන් පුද්ගලයින් වශයෙන් සෑම දෙනෙක් තුළම කුඩා අකුසල් සිදුවීමේ හැකියාවක් පවති. ඒවායේ විපාකද කෙලවරක් නොමැත. එබැවින් මෙවැනි මහා බලගතු පිංකම් කරගැනීම, ඒවාට සම්බන්ධ වී පුණ්‍ය ශක්තිය වැඩිදියුණු කරගෙන ඒ තුළින් කුඩා අකුසල් වල විපාක යටපත් කරගැනීමට හෝ උත්සාහවත් වන්නේ නම් නිවන් දකින තුරු හෝ ලැබෙන දුක් විදීමේ ප්‍රවණතාවය අඩුකරගැනීමට හැකියාවක් ඇත.**

**" කඨින දානං දත්වාන සංඝෙ ගුණ වරුත්තමේ ඉතො තිංසේ මහා කප්පේ නාභි ජානාගමි දුග්ගතිං"**



# බලගතු පිංකම තුළින් කුඩා අකුසල් නැතිවේ....

බුදුරජාණන් වහන්සේ විවිධ පිංකම් වර්ග දේශනා කොට ඇත. එම පිංකම් වල ආනිසංස ද විවිධය. දාන වශයෙන් සලකන කොට ආමිස දානය, අභය දානය, ධර්ම දානය වශයෙන් කොටස් තුනකට බෙදා වෙන් කළ හැකිය. දානය පාරමිතාවක් ලෙසටද දසරාජ ධර්ම අතර රාජ ධර්මයක් ලෙසට ද, සතර සංග්‍රහ වස්තු අතර වතක් වශයෙන් ද, දස පුණ්‍ය ක්‍රියා අතර පින්කමක් වශයෙන් ද දක්වා ඇත.

එසේ දේශනා කළ පින්කම් අතර මහා පින්කම් අටක් පිළිබඳව දේශනා කොට ඇත. එයින් පළමු අංකයට ගැනෙන්නේ කඨින පිංකමයි. එහි අනුසස් අනන්ත අප්‍රමාණ වශයෙන් දක්වා ඇත. කඨින චීවර පූජාව බුදු දහමේ පෙන්වා ඇති බලගතුම පින්කමයි. බුදු දහමේ ප්‍රධාන අකුසල් 05 ක් පිළිබඳ දක්වා ඇත. එනම්,

01. මව මැරීම
02. පියා මැරීම
03. රහතුන් මැරීම
04. බුදු සිරුරේ ලේ සෙලවීම
05. සංඝ බේදය

ආදී වශයෙනි.

මෙම අකුසල් 05 සිදුකළ කෙනෙකුට සසරින් කිසිදා මිදෙන්නට පුළුවන් කමක් නැත. ඒ තරමටම එම අකුසල් බලවත්ය. මුගලන් මහ රහතන් වහන්සේ අජාසත් රජු, දේවදත්ත යන ගිහි පැවිදි පිරිස් එම අකුසලයට හසු වූ අය වෙති. ඒ හැර සුළු සුළු අකුසල කර්ම කළ කෙනෙකුට කඨින චීවර පූජා පිංකමක් කර ගැනීමෙන් ඒවා යටපත් කරගැනීමට පුළුවන. එයට හේතුව වන්නේ සුළු සුළු අකුසල කර්ම වලට විපාක දීමට තරම් කාලයක් නොමැති වීමය. එම අකුසල කර්ම අහෝසි කර්ම ගණයට අයත් වේ.

කඨින චීවර නම් වූ එම බලගතු පින්කම පිළිබඳ දීර්ඝ විස්තරයක් නාගිතාපදානය තුළින් දැකගත හැකිය. එහි වැඩි දුරටත් සඳහන් වන්නේ බුදු රජාණන්වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන කාලයක බ්‍රාහ්මණ මහාසාර කුලයක උපන් නාගිත නම් කුමරුවෙකු සසර කළ කඨින පින්කම්වල අනුසස් බලෙන් බුදු රදුන් හමුවට ගොස් බණ අසා පැහැදී එහි භික්ඛු භාවයෙන් පැවිදි වී සිව්පිළිසිඹියාවට පත්ව රහත් වීමේ කතා පුවතකි.

අප බුදුරජාණන් වහන්සේ නාගිත හිමිගේ මෙම සුවිශේෂී සිදුවීම උන්වහන්සේ ලවාම ප්‍රකාශ කරවනු වස් ආනන්ද හිමියන් කැඳවා, ආනන්දය, අද ඒහි භික්ඛු භාවයෙන් පැවිදි බව ලැබූ 500 ක් රහතන් වහන්සේලා හිමාලයෙහි අනවතප්ත විලට රැස් කර වන්න" යැයි ආනන්ද හිමියන්ට දැන් වූහ. එම ඉල්ලීම ඉටුකරනු වස් ආනන්ද හිමි ද බුද්ධ නියමය ඉටු කළහ. කහ වතින් බැබලී ගිය අනෝතප්ත විල අවට අසිරිය දකීමට දෙව් බඹුන් ද රැස් වූහ.

පසුව බුදුරජාණන් වහන්සේ භික්‍ෂූන් අමතා මහණෙනි, නුඹලා අතුරින් පෙර භවයක බුදු, පසේ බුදු, මහ රහතන් වහන්සේලා උදෙසා විශේෂ පුණ්‍ය කර්මයක් සිදු කළ යම් භික්‍ෂුවක් වේ නම් මෙහිදී එය ප්‍රකාශ කරන ලෙස වදාළහ. අනතුරුව නාගිත හිමි දොහොත් මුදුන් දී තමන් කළ එම මහ බලගතු පිංකම ප්‍රකාශ කළහ. මම මෙයට අනූ එක් කල්පයකට පෙර විපස්සී බුදුන් කළ බන්දුමතී නුවර ඉපිද දානපතියෙකු වී බොහෝ දුගී මගී යාචකාදීන් උදෙසා දන්දී පින් සිදු කරමින් සිල් ආරක්‍ෂා කරමින් දැහැමින් විසුවෙමි.

ඒසේ සිටි කල්හි දිනක් විපස්සි බුදුරදුන්ගෙන් බණ අසා පැහැදී බුදුපාමොක් මහ සඟනට සපිරිකර සහිත මහ දන් පිළිගැන්වූවෙමි. එක් වස් කාලයක භික්‍ෂූන් වහන්සේලා වස් වසවා ගෙන සිව්පසයෙන් උවටැන් කොට අවසන බොහෝ සපිරිකර සහිතව කඨින චීවර පූජාවක් පවත්වා එයින් ලැබෙන කුසලය සියලු කෙලෙසුන් දුරු කිරීමට උපකාරී වේවායි ප්‍රාර්ථනා කළෙමි.

එම මහා බලගතු පිංකම හේතුවෙන් සතර අපායෝත්පත්තියකට නොවැටී සදෙව් ලොව හා මිනිස් ලොව ඉපිද නොයෙක් සැප සම්පත් ලැබූ ආකාරය බුදුන් ප්‍රමුඛ රහතන් වහන්සේලාත් දෙව් බඹුන් ඉදිරියේත් විස්තර කළේය.

"කඨින දානං දත්වාන -
සංඝෙ ගුණ වරුත්තමේ
ඉතො තිංසේ මහා කප්පේ -
නාභි ජානාගමි දුග්ගතිං"

සීලයෙන් හා ගුණයෙන් උතුම් මහා සංඝයා විෂයෙහි කඨින චීවර පූජාව දන් දීමේ අනුහසින් මහා කල්ප 30 ක් දුගතියක් නොම දනිමි ආදී වශයෙන් එම බලගතු පිංකමේ අනුසස් පිළිවෙලින් වර්ණනාත්මකව ගාථා සමූහයකින් ඉදිරිපත් කළහ.

මේ අයුරින් එම බලගතු පිංකම පිළිබඳ කරුණු ඉදිරිපත් වෙද්දී බෞද්ධයින් වශයෙන් එම පිංකම කරගැනීමට අපහසු නම් එයට සම්බන්ධ වීමටවත් උත්සහවත් විය යුතුය. මහ පොළොව මෙන් කම්පා නොවන, මහා මේරු පර්වතය මෙන් අධික සුළඟකින් නොසෙල්වෙන ඒක ඝන වජ්ජ පර්වතය මෙන් නොබිදෙන මහා බලගතු එකම පින්කම කඨින චීවර පූජාවයි.

සාමාන්‍ය පුහුදුන් පුද්ගලයින් වශයෙන් සෑම දෙනෙක් තුළින්ම සුළු සුළු අකුසල් සිදු වීමේ ප්‍රවණතාවය ඉතා විශාලය. ඒවායේ විපාකද කෙලවරක් නොමැත. එබැවින් මෙවැනි මහා බලගතු පිංකම් කරගැනීම, ඒවාට සම්බන්ධ වී පුණ්‍ය ශක්තිය වැඩිදියුණු කරගෙන ඒ තුළින් සුළු සුළු අකුසල් වල විපාක යටපත් කරගැනීමට හෝ උත්සහවත් වන්නේ නම් නිවන් දකින තුරු හෝ ලැබෙන දුක් විදීමේ ප්‍රවණතාවය අඩුකරගැනීමට හැකියාවක් ඇත.

ඉදිරියෙහි එළඹෙන වප් පොහොයේ සිට ඉල් පොහොය දක්වා එම බලගතු පින්කමට අතහිත යොදවා පුණ්‍ය ශක්තිය වඩා වර්ධනය කරගැනීමට අවස්ථාව උදවනු ඇත. එබැවින් පසුබට නොවී එම බලගතු පින්කම කර ගැනීමට සෑම දෙනෙක්ම උත්සහවත් වීම ප්‍රඥාගෝචර ක්‍රියාවකි. ඒ තුළින් සංසාරයේ හමුවන සතර අපා දුක්වලින් මිදී, සදිව්‍ය ශ්‍රී සම්පත් අනුභව කොට එයින් නොනැවතී නිවන් ලැබගෙන ඉපදීම අවසන් කිරීමටත් උත්සහවත් විය යුතුය.

පූජ්‍ය ගලගෙදර
රතනවංශ හිමි

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER



# යහපත් ගුණවත් දිවියකට නොවරදින බොදු මඟ ...

## සිඟාලෝවාද සූත්‍රය කියාපාන දහම් කරුණු

ජන සමාජයේ උසස් පුරවැසියෙකු ලෙස ජීවත් වීම කාගේත් අපේක්ෂාවය. වඩාත් හොඳ දිවි පෙවතක් උදාකරගැනීම පිණිස එදා මෙදා තුර විසුවෝ විවිධාකාර දේ පිහිටට ගත්හ. ආගම දහම ඒ අතරින් ප්‍රමුඛය. ඒ හැර සරල අභිචාර විධීන්ගේ පටන් යාග හෝම හා යන්ත්‍ර මන්ත්‍ර ආදියේ පිහිට පතන්නෝ බොහෝ වෙති.

චීන ගරුකම්, වස්තු, ග්‍රහා වස්තු සහ ධනාත්මක චින්තන ආදී තවත් සංකල්ප රැසක්ද ඊට අද එක්ව තිබේ.

බුදුරජාණන් වහන්සේ විසින් වඩාත් චරිතවත් වඩාත් සදාචාරවත් හා අංගසම්පූර්ණ ජීවිතයක් ළඟාකරගැනීමේ මාර්ගය සකළ ලෝක සත්වයා හටම පෙන්වා දෙනු ලැබූ සේක. මෙලොව පමණක් නොව පරලොව ජීවිතයද වඩාත් සුඛිත මුදිත කරගැනීමේ නිවැරදි මාර්ගය උන්වහන්සේ මැනවින් පෙන්වා දුන් සේක.

ප්‍රාග් බෞද්ධ යුගයේ භාරතයේ මෙන්ම යුරෝපාකරයේද ජන සමාජය ඉතා අසාධාරන හා යුක්ති සහගත නොවන සමාජ බෙදීම් රැසකින් යුක්ත විය. ඉන්දියාවේ එය බ්‍රහ්මණ, ක්‍ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර සහ පංචම කුල ලෙස ඉතා පැහැදිළි බෙදීමක් දක්නට ලැබුණි. එක් එක් අංශයන්ට අයත් විවිධ කාර්යයන්ද, සමාජ වගකීම්ද විය.

එකී සියලු සමාජයන්හි වඩාත් පීඩා ලැබූවෝ කාන්තාවෝය. භාරතයේද කාන්තාවන්ට ලැබුනේ ඉතා අඩු සැළකිල්ලකි. දරුවන් බිහිකිරීම, ඔවුන් රැකබලා ගැනීම ඔවුන්ගේ ප්‍රමුඛ කාර්ය වූහ. අධ්‍යාපනික හා ආගමික කටයුතු වලට එක්වීමේ අවස්ථාවද කාන්තාවන්ට අහිමි කළ අවස්ථා එමටය.

මහා සමාජ සංශෝදනයක් සිදුකළ බුදුරජාණන් වහන්සේ එවැනි සමාජ බෙදීම් ඉවතලා භික්‍ෂු භික්‍ෂුණී, උපාසක උපාසිකා යන සාධාරණ හා පොදු සිව්වනක් පිරිසකට සමාජය ගොණු කළහ.

කාන්තාවන්ට නිසිතැන මෙන්ම සමතැනද හිමිවූහ. ශාසනයට ඇතුළත් වීමට මෙන්ම රහත් බව ලැබීමට හා නිවන් ලැබීමටද ඔවුන්ට මංපෙත් විවර විය.

බුදුරජාණන් වහන්සේ දේශනා කළ ශ්‍රී සද්ධර්මය තුළින් යහපත් ස්ත්‍රී පුරුෂ සමාජ භාවයක් ලැබීමේ ඒකායන මාර්ගය පෙන්වන දහම් කරුණු බොහෝය. ඒ අතරින් ගෘහ ජීවිතය සරු කරවන මහා දායාදයක් වැනි විශ්ව නීති සමුදායක් අඩංගු සූත්‍රයක් ලෙස සිඟාලෝවාද සූත්‍රය හැඳින්විය හැකිය. එය හුදු සූත්‍ර දේශනාවක් නොව මහා අධ්‍යාපනික න්‍යායක් ලෙස ද සැළකිය හැකිය.

සිඟාලෝවාද සූත්‍රය චරිත සංවර්ධනය හා සමාජ සංවර්ධනය යන ප්‍රධාන අංශ දෙකට නිවැරදි හා නිශ්චිත මඟ පෙන්වීම ලබා දෙයි.

මිනිසා ගේ සංවර්ධනය ප්‍රධාන වශයෙන් අංශ තුනකින් සිදුවිය යුතුය.

01. ආගමික හෙවත් අධ්‍යාත්මික අංශය
02. සමාජීය අංශය
03. ආර්ථික අංශය

මේ එක් එක් අංශ ඔස්සේ ජන ජීවිතය සරු කරගන්නා ආකාරය සිඟාලෝවාද සූත්‍රය අපට මැනවින් පෙන්වා දෙයි. එකී උපාය මාර්ග සරලය, සුගමය, අර්ථචර්යාත්මකය අනුගමනය පහසුය. එම මොහොතේදීම ප්‍රතිඵල ලැබිය හැකිය. අත්දුටුය. හස්තසාරය.

දැන් අපි ඒ එක් එක් ක්‍ෂේත්‍රවලට අයත් අනු කරුණු එකිනෙක සළකා බලමු

01. අධ්‍යාත්මික සංවර්ධනය

මේ සඳහා ඕනෑම පුද්ගලයකු විසින් අත්හල යුතු ප්‍රමුඛ විෂමතා දෙකක් බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් සේක. ඉන් පළමු වැන්න සතර කර්ම ක්ලේෂයන්ය. දෙවැන්න සතර අගතීන්ය. සතර කර්ම ක්ලේෂයන්ගේ අදහස වන්නේ පුද්ගලයකුගෙන් සිදුවිය හැකි මූලික අකුසලයන්ය. එනම්,

i. සතුන් මැරීම
ii සොරකම
iii. පරදා සේවනය
iv. බොරුකීම

කෙසේ වුවද බොරු කීම යටතේ වචනය මඟින් සිදුවන අකුසල් සතරම විස්තර වෙයි. ඒවා බොරු කීම, කේලම් කීම හා හිස්වචන කීමය, රළුවචන කීම සතර අගති යන්නෙන් හැඳින්වෙන්නේද මිනිසා ගොදුරුව සිටින දූෂිත තත්වයන්ය. ඒවාද සතරකි.

1. ඡන්දය (ආශාව, ප්‍රේමය) නිසා සිදුකරන සිදුවන විනාශය
2. ද්වේෂය (තරහා, ඊර්ශ්‍යාව) නිසා සිදුවන විනාශය
3. භය (බිය) නිසා සිදුවන විනාශය
4. මෝහ (මුළාව) නිසා සිදුවන විනාශය

ඉහත සඳහන් අගතීන් හේතුවෙන් මිනිසා නොමිනිසුන් මෙන් හැසිරෙති. ගහමරා ගනිති. වත්මන් ජනමාජයෙත් සෑම ක්‍ෂේත්‍රයක් පුරාම පැතිර පවතින විෂමාචාර දූෂණයන්, අපයෝජන හා මංකොල්ල ආදී සියලු වැරදි සිදුවීම් මෙකී අගති නිසා සිදුවන බව ඉතා පැහැදිළිය.

දෙවනි කරුණ බෝග විනාශ මුඛයන්ය. ඒවා ගණනින් 36 කි. සිහිනුවණින් කටයුතු කළ කල්හි ඉන් මිදීම අපහසු නැත. අවදිවූ සිහියෙන් යුතුව මෙකී කරුණු සළකා බැලීම ඔබට භාරය.

1. මත්පැන් පානය හා එහි විපාක හයකි.
2. අවේලාවේ වීදි සංචාරය හා එහි විපාක හයකි.
3. සමාජ ශාලාවන්හි හැසිරීම හා එහි විපාක හයකි.
4. සූදු ක්‍රිඩාවන්හි යෙදීම හා එහි විපාක හයකි.
5. පව්ටු මිතුරු ඇසුර හා එහි විපාක හයකි.
6. අලසකම හා එහි විපාක හයකි.

කියූ පමණින් ඔබට මෙය වැටහෙනු නිසැකය. සම්පත් විනාශය, චරිත හානිය මෙන්ම සමාජ පරිහානියද ඒවායේ ප්‍රතිඵලයන්ය.

මෙකී වැරදි වලින් මිදී කටයුතු කරීමෙන් උදර පුද්ගලයකු විය හැකිය.

මීළඟට අප සලකා බැලිය යුත්තේ පුද්ගලයාගේ සමාජ සංවර්ධනය පෙර කී පරිදි ආකාර දෙකකි.

1. සමාජ සබඳතා
2. ආර්ථික සබඳතා

පුද්ගලයාගේ සමාජ චර්යාව නැතහොත් භූමිකාවන් සිඟාලෝවාද සූත්‍රයට අනුව, මෙලෙස විග්‍රහ කළ හැකිය.

1. මාපිය දූදරු සම්බන්ධතාවය - පවුල
2. ගුරු සිසු සම්බන්ධතාවය - පාසල
3. ස්වාමි භාර්යා සම්බන්ධතාවය - කුටුම්භය
4. මිතුරු සබඳතාවය -සම කණ්ඩායම් අතර
5. ස්වාමි සේවක සම්බන්ධතාවය - රැකියා
6. ගිහි පැවදි සම්බන්ධතා - ආගම දහම

සදිසාවන් ලෙස නම් කොට ඇති මෙම සබඳතා වලින් මඟහැරුණු එකම සබඳතාවයක්වත් අපට හමු නොවේ. එය ඕනෑම මිනිසෙකුට, කාන්තාවකට පොදුය. මෙකී සියලු අවස්ථාවන්හි යුතුකම් හා වගකීම් 05 බැගින් දෙපාර්ශවය විසින් පිළිපැදිය යුතුය. එම කරුණු අදාළ සම්බන්ධතාවට සෑම අතින්ම සම්බන්ධය. ඒවා පිරිපුන්ය. එහි දක්වෙන සුළු කරුණු පවා අතිශය වැදගත්ය.

අවසන් ක්‍ෂේත්‍රය ආර්ථික අංශයයි. ඒ පිළිබඳව බෞද්ධ විග්‍රහයද සිඟාලෝවාද සූත්‍රයෙන් අපට හමුවෙයි.එකෙන භොගෙ භුඤ්ජෙය්‍ය
ද්වීහි කම්මං පයෝජයෙ
චතුත්ථඤ්ච නිධාපෙය්‍ය
ආපදසු භවිස්සති'

15 පිටුවට...

නිමල් ආනන්ද



# බුදුන් දහම් සඟුන් වඳිමු තෙරුවන් බලයෙන් නිවන් දකිමු

**ධර්මයට මවක් පියෙක් නැත. ධර්මය සත්වයාට ආරක්ෂාව සරණ පිහිට ලබාදේ. ඒ අනුව හැසිරෙන්න**

බුදුරජාණන්වහන්සේ ලෝකයාගේ හිත සුව පිණිස හතලිස්පස් වසක් මුළුල්ලේ දේශනා කළ ධර්මය පර්යාප්ති ධර්මය, ධර්ම විනය වශයෙන් කොටස් වන්නේද ප්‍රථම බුද්ධ වචනය, මධ්‍යම බුද්ධ වචනය, පශ්චිම බුද්ධ වචනය යනාදී වශයෙන් මෙය කොටස් කළ හැකිය.

ධර්මය යනු සත්වයා සතර අපායට වැටෙන්නට ඉඩ නොදී රැකගැනිම යන අර්ථයයි.. එසේ වූ ධර්මයේ ගුණ 6ක් ගැන සඳහන් වේ.
ධම්මං විනා නත්ථි පිතාචමාතා
තමේව තාණං සරණං පතිට්ඨා
තස්මාහි භෝ කිච්ච මඤ්ඤප්පහාය
සුනාථ ධාරේථ චරාථ ධම්මේ
ධර්මය හැර මවක් පියෙක් නැත. ධර්මය සත්වයාට ආරක්ෂාව සරණ පිහිට ලබාදේ. ධාරණය කර ගන්න. ඒ අනුව හැසිරෙන්න.

<u>ස්වාක්ඛාත ගුණය ඃ-</u>
බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද ධර්මය සර්වඥතා ඥානයෙන් ප්‍රත්‍යක්ෂ වශයෙන්ම දැන දේශනා කරන ලද්දකි. මේ ධර්මය ලෝකයේ අනිත්‍ය ස්වාභාවය, දුක්ඛ ස්වාභාවය, අනාත්ම ස්වාභාවය දැක ඉන් මිදීම පිණිස ප්‍රත්‍යක්ෂයෙන්ම දේශනා කළ සේක. ඒ ධර්මය පිළිපදින්නවුන්ට ලෞකික, ලෝකෝත්තර, සම්පත්තියම දැකිය හැකිය. ඒ නිසාම මේ ධර්මය ස්වක්ඛාතයි.

සන්දිට්ඨික ගුණය ඃ-
මේ ධර්මය තමන් විසින්ම දැක තම තමන් විසින්ම ප්‍රත්‍යක්ෂ කරගත හැකි ධර්මයකි. මේ ධර්මය නිතර ධාරණය කරන අයට මෙලොව වශයෙන්ද උසස් ඵල දැකිය හැක. රතන සූත්‍රයෙහි සඳහන් මහානුභාව සම්පන්න බලය විශාලා මහනුවර තුන්බිය දුරු කළේය. කරණිය මෙත්ත සූත්‍රයේ බලයෙන් අමනුෂ්‍ය උපද්‍රව දුරු කළේය. කිසා ගෝතමී පටාචාරා ආදී කොටි ප්‍රකෝටි ගණන් දුකට පත් වූවන් සැනසීම ලැබුවේත් ආයුෂ පිරිහුණු සක් දෙව් රජු ආයුෂ වර්ධනය කරගත්තේත් මේ ධර්මයෙහි තිබෙන සන්දිට්ඨික ගුණ නිසයි.

අකාලික ගුණය ඃ- බුදුරජාණන් වහන්සේ දෙසූ මේ ධර්මය තමන් පළමුව ප්‍රත්‍යක්ෂ කළා. ඕනෑම කෙනකුට ඕනෑම විටෙක මේ ධර්මය විමසන්නට පිළිවනි. එහි හැසිරෙන්නට පුළුවනි. මේ ධර්මය පැහැදීමෙන් යහපතක් මිස අයහපතක් සිදුවන්නේ නැත.

ඒහිපස්සිකෝ ඃ-
බුදුරජාණන්වහනසේ දේශනා කළේ ඒකාන්තයෙන්ම විද්‍යාමාන වූ ධර්මයකි. ඒ නව ලොකෝත්තර වූ ශ්‍රී සද්ධර්මය ප්‍රත්‍යක්ෂ වශයෙන් බුදුරජාණන්වහන්සේ දැක, දැන අවබෝධකරගත් නිසායි. බිය සැක නැතිව 'එන්න බලන්නැයි' දේශනා කර ත්බේ.

ඕපනයික ගුණය ඃ-
මේ ධර්මය තමාගේ සිතේ ධාරණය කර ගන්නට සන්තානයේ තැන්පත් කරගන්නට සුදුසුයි. තථාගතයන්වහන්සේ සාරසංඛ්‍ය කල්ප ලක්ෂයක් කල් දස පෙරුම් පිරූ සේක. දුක්වින්දේ මේ උත්තරීතර ධර්මය කෙලෙසක හෝ තම ජීවිතයට සමීප කර ගන්නටයි. කොපමණ දුක් විඳ හෝ එය අවබෝධ කරගැනීම සුදුසු නිසයි බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා අපමණ වෙහෙස ගෙන ඒ ශ්‍රී සද්ධර්මය වෙසෙසින්ම නවලෝකෝත්තර ධර්‍මය ස්ව සන්තානයෙහි රෝපණය කරගැනීමට උත්සහ වූයේය.

පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහීති ඃ-
මේ ධර්මය ප්‍රඥාවන්තයින් සඳහා මිස මෝඩයින් සඳහා නොවේ. නුවණැති අය මේ ධර්මය තම හිස පැළඳි රන් ආභරණයක් සේ අරක්ෂා කෙරේ. එහි අගය වටිනාකම දැනගත්තේ නුවණැත්තන් පමණි. ලොව්තුරා දහම ධ්‍යානාංග ආදිය උත්තරීතර පුද්ගලයන් බුද්ධිමතුන් විසින්ම අවබෝධ කරගත යුත්තක්. එයද තම තමන් වෙන වෙනම අවබෝධකරගත යුත්තක්. ඒ නිසයි මේ ධර්මය ප්‍රඥාවන්තයනට ගෝචර වන බව පැහැදිළි කර දී තිබෙන්නේ.

## සඟ ගුණ

'සුපටිපන්න' ඃ-
' සු' යනු සුන්දරවූ ඉතාම හොඳ වූ කියන එකයි. 'පටිත්ත' කියන්නේ ප්‍රතිපදාවකට පිළිගන්නාවූ එකට කියන එකටයි. බුදුපියාණන්ගේ ශ්‍රාවක සංඝයා අතුරෙන් කෙළෙස් ඇති පිරිස නිවනට යොමු වූ ඒ සුන්දර ශිලාදී ප්‍රතිපදාවන් පුරණා බැවින්ද නිකෙලෙස් ආර්ය උතුමන් ඒ ප්‍රතිපදව පිරූ බැවින්ද 'සුපටිපන්න' ගුණයෙන් යුක්තයි.

උජුපටිපන්නෝ ඃ-
යන්නෙහි අර්ථය වනුයේ භාග්‍යවතුන් වහන්සේ විසින් අවබෝධ කොට ශ්‍රාවකයන් උදෙසා මධ්‍යම ප්‍රතිපදාව නම් වූ මේ ඍජුවම නිවන් සුව සළසා දෙන ආර්ය අෂ්ඨාංගික මාර්‍ගය අනුගමනය කරන ආර්ය මහ සංඝයා ඍජු වූ පතිපදවට පිළිපන් උජුපටිපන්න ගුණයෙන් යුක්තයි. ඒ අනුව පිළිපදින ආර්ය මහා සංඝරත්නය කාය, වචී, මනෝ, දුෂ්චරිතයන් ප්‍රහාණය කිරීම පිණිස ආර්ය මහා සංඝරත්නය පිළිපන් බැවින්ද උන්වහන්සේලා 'උජුපටිපන්න' ගුණයෙන් යුක්තය.

ආර්ය මහා සංඝරත්නය ' ඤායපටිපන්න' ගුණයෙන් යුක්තයි. අධි ශීල, නිවනට හේතුවන ප්‍රතිපත්තියෙහි පිහිටියා වූ බැවින් 'ඤායපටිපන්න' නම් වේ. 'ඤාය' කියන්නේ නිවනටයි. නිවන පිණිස නිවනට අනුව ඒකාන්තයෙන්ම නිවනට පමුණුවන ත්‍රිශික්ෂාවෙන් සමන්නාගත වූ ආර්ය අෂ්ඨාංගික මාර්‍ග ප්‍රතිපත්තිය පුරන බැවින් භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රාවක සංඝයා 'ඤායපටිපන්න' නම් වේ.

ගුණවත් පුද්ගලයන්ට කරදීමට සුදුසු ක්‍රියා 'සාමීචි' කර්ම යනුවෙන් හැඳින්වේ. දුටුවිට හුනස්නෙන් නැගිටීම අසුන් පනවා දීම, පා සේදීම, නෑම සඳහා උණු පැන් ඇල් පැන් සකස් කර දීම, පා සිවුරු සෝදා දීම, සෙනසුන පිරිසුදු කර දීම යනාදී වශයෙන් සාමීචි කර්ම රාශියක් තිබේ. දායකයන්ගේ සිව්පසයෙන්ම පමණක් යැපෙන කුරා කුහුඹුවෙකුටවත් වරදක් නොකරන හැමටම මෙත් වඩන අවිහිංසක වූ ප්‍රතිපදාවක් අනුගමනය කරන අර්ය මහා සංඝරත්නය දායකයන්ගේ 'සාමීචි' කර්මයනට හැම අතින්ම යෝග්‍යවන බැවින් 'සාමීචිපටිපන්න' නම් වේ.

යමෙකක් විශේෂයෙන්ම පිළයෙළ කරගත් දානයක් බොහෝ දුර වසන්නාවූ භික්ෂූන්වහන්සේ නමකට පිරිනමන්නේ සංඝයා සතු වූ 'ආහුනෙය්‍ය' ගුණය නිසාමයි. බුදුරදුන් දවස යොදුන් සිය ගණන් මඟ ගෙවා ගෙන විත් බුදුපාමොක් මහසඟනට දන් පිරිනමා ඇති අයුරු හරිම අසිරිමත්.

ආගන්තුකව පැමිණෙන ඕනෑම කෙනෙකුට සංග්‍රහා කිරීම සඳහා පිළියෙළ කළ ආහාර ආදිය පිළිගැන්වීම සඳහා ශ්‍රාවක සංඝයා සුදුසු වන නිසාත් එසේ පිළිගැන්වීමෙන් ආගන්තුක සත්කාරයට වඩා උසස් ආනිසංසයක් ලැබිය හැකි නිසාත් 'පාහුණෙය්‍ය' ගුණයෙන් යුක්ත වන්නේය.

යමෙක් පින් පව් හා විපාක පිළිගෙන මෙලොව හා පරලොව යහපත වෙනුවෙන් සිල්වතුන් උදෙසා දන්පිරිනමනවා නම් එම දක්ෂිණා පිළිගත් විට දායක පක්ෂයට එහි උපරිම ආනිසංස ලැබේ. ත්‍රිශික්ෂා වඩන කෙලෙස් දුරු කළ දුරු කරමින් සිටින ශ්‍රාවක සංඝයා මෙළොව යහපත වෙනුවෙන් හා මියගිය ඥාතීන් වෙනුවෙන් දෙන දක්ෂිණාවන් පිළිගැනීමට වඩාත්ම සුදුසු පිරිස වන්නේය. ඒ නිසා ශ්‍රාවක සංඝයා දක්ඛිණෙය්‍යය ගුණයෙන් යුක්ත වන්නේය.

දෝත නගා වැදීමට හැම අතින්ම සුදුසුවන බැවින් මහසඟරුවන 'අඤ්ජලිකරණීය' වේ. ආර්ය ශ්‍රාවක භික්ෂු භික්ෂූණීන් වහන්සේලාට නමස්කාර කරන්නන්ට මහත් විපාක ලැබේ. ඒ උන්වහන්සේලා සතු ශිලාදී ප්‍රතිපත්ති සමුදාය නිසායි. පිළිවෙත් සරු වූ මහ සඟරුවනට මුළු හදින්ම වැඳ නමස්කර කිරීමට යෝග්‍යවන බව සත්‍යයි. ඒ නිසාම උන්වහන්සේලා අඤ්ජලිකරණීය ගුණයෙන් හඳුන්වනු ලැබේ.

බුදුරජාණන්වහන්සේගේ ආර්ය ශ්‍රාවක මහා සංඝයා 'අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස' ගුණයෙන් යුක්ත වෙනවා කියන්නේ මහ සඟරුවනද ලෝවැසි මනුෂ්‍යන්ගේ පුණ්‍ය බීජයක් වැපිරීමට සුදුසු වන කුඹුරක් බඳුයි. එයට උපමාකළහැකි සමකළහැකි කිසිවක් තවත් ඇත්තේ නැහැ. ඒකයි අනුත්තර යන වචනය යෙදී තිබෙන්නේ.

මෙත්තානි අසේකා මෙහෙණින් වහන්සේ

# අට සිල් මෙනෙහි කරමු



**පො**හෝ දින වනාහි බොදු ජනයාටම වෙන්වූ සුවිශේෂී දිනකි. එකී දිනය තුළ හෝ වේවා බොහෝ දනන් තිදොර සංවර කර ගැනීමට උත්සුක වීම පැසසිය යුත්තකි. සිල් සමාදන් වනු පිණිස උගත්, නූගත් භේදයක් නැත්තේමය. ළමා, තරුණ, මහළු, ස්ත්‍රී, පුරුෂ භේදයක් ද නැති අතර කුලගෝත්‍ර භේදයක් ද නැත්තේය. බුදු දහම වනාහි මෙසේ කිසිදු භේද භින්නතාවයකට අත හිත නොදෙන්නකි. කුඩා කළ සිටම බොදු ජනයා සිල් සමාදන් වීමට පෙළඹීම ඉතා වැදගත්ය. පැය කිහිපයකට හෝ අට සිල් සමාදන්වීම යහපත් දිවි පෙවෙතක් ගත කිරීමට මෙන්ම පරලොව දිවියට ද බෙහෙවින් වැදගත්ය.

එවන් වැදගත් වටිනා වූ සීලය සමාදන්වීම පමණක් ප්‍රමාණවත් නොවන අතර සමාදන් වූ සීලය රැකගැන්ම මෙන්ම මෙනෙහි කිරීම ද ඉතා වැදගත්ය. ඊට මත්තෙන් අට සිල් මැනවින් දත යුත්තේය. ඒ මෙසේය,

1. පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි
2. අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
3. අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛාපදං සමාදියාමි
4. මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි

   සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
6. විකාල භෝජනා වේරමණී සික්ඛාපදං සමාදියාමි
7. නච්ච ගීත වාදිත විසූක දස්සන මාලාගන්ධ විලේපනධාරණ මණ්ඩන විභූසනට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි
8. උච්චාසයන මහාසනා වේරමණී සික්ඛාපදං සමාදියාමි

ඉහතින් සමාදන් වූ අට සිල් මෙනෙහි කළ යුතු පිළිවෙලක් ඇත. එය බොදු ජනයා නිවැරදිව දත යුත්තේය. එකී සීලය මෙනෙහි කළ යුත්තේ මේ අයුරින්ය.

පළමු සිල් පදය වනාහි සතුන් මැරීමෙන් වෙන් වීමේ සිල් පදයයි. එය මෙනෙහි කළ යුත්තේ මේ අයුරටය. සියලු බුදු, පසේ බුදු, මහ රහතන් වහන්සේලා දිවි හිමියෙන් සතුන් මැරීමෙන් වෙන් වුනු සේක. මම ද අද උන්වහන්සේලා අනුගමනය කරමින් සතුන් මැරීමෙන් වෙන්ව සැම සතුන් කෙරෙහි අනුකම්පා සහගතව වාසය කරමි. යනුවෙන් සිතමින් මෙනෙහි කළ යුතුය. සතුන් මැරීම කිසිවකු කිසිවිටෙක දිරි නොගන්වන්නකි. එපමණකුදු නොව එහි විපාක ද සුළු පටු නොවනු ඇත. තවද සතුන් මැරීමේ පාප කර්මයට ලක්වීමේදී සපිරෙන්නා වූ කරුණු කාරණා පිළිබඳව ද බුදු දහමේ වැඩි දුරටත් සඳහන්ය.

අට සිල් හි දෙවන සිල් පදය වනුයේ සොරකමෙන් වෙන්වීමේ සිල් පදයයි. එකී සිල් පදය මෙනෙහි කළ යුත්තේ සියලු බුදු, පසේ බුදු, මහ රහතන් වහන්සේලා දිවි හිමියෙන් සොරකමෙන් වෙන් වුනු සේක. මම ද අද උන්වහන්සේලා අනුගමනය කරමින් සොරකමෙන් වෙන්ව වාසය කරමි. යනුවෙනි. සොරකම වනාහි නොකළ යුත්තේමය. තමාගේ වස්තුවක් තවෙකෙකු ගන්නවාට තමා අකමැති සේ අනුන්ගේ දෑ ගැනීම ද නුසුදුසුය. නොකළ යුත්තෙකි. එකී පාප කර්මයේ ආදීනව ද සුළු පටු නොවනු ඇත. එසේ හෙයින් අට සිල් සමාදන් වූ තැනැත්තා මැනවින් මෙම සීලය ද මෙනෙහි කළ යුත්තේමය.

> **සතුන් මැරීම කිසිවකු කිසිවිටෙක දිරි නොගන්වන්නකි. එපමණකුදු නොව එහි විපාක ද සුළු පටු නොවේ. තවද සතුන් මැරීමේ පාප කර්මයට ලක්වීමේදී සපිරෙන්නා වූ කරුණු කාරණා පිළිබඳව ද බුදු දහමේ වැඩි දුරටත් සඳහන්ය**

තෙවන සිල් පදය ලෙස ගනු ලබනුයේ අබ්‍රහ්මචර්යාවෙන් වෙන් වීමේ සිල් පදයයි. එම අබ්‍රහ්ම චර්යාවෙන් වෙන් වීමේ ශික්ෂාපදය මෙනෙහි කළ යුත්තේ, සියලු බුදු, පසේ බුදු, මහ රහතන් වහන්සේලා දිවි හිමියෙන් ලාමක හැසිරීමෙන් වෙන් වූ සේක. මම ද අද උන්වහන්සේලා අනුගමනය කරමින් ලාමක හැසිරීමෙන් වෙන්ව වාසය කරමි යනුවෙනි.

බොරු කීමෙන් වෙන් වීමේ ශික්ෂා පදය සිව්වන ශික්ෂා පදය වන අතර අට සිල් රැකීමෙහි නිරත වන තැනැත්තා මෙම සිල් පදය මෙනෙහි කළ යුත්තේ, සියලු බුදු, පසේ බුදු, මහ රහතන් වහන්සේලා දිවි හිමියෙන් බොරු කීමෙන් වෙන් වූ සේක.

මම ද අද උන්වහන්සේලා අනුගමනය කරමින් බොරු කීමෙන් වෙන්ව වාසය කරමි. යනුවෙනි. බොරු කීම වනාහි පුද්ගලයා සත්‍ය ගරුක සමාජයක ජීවත්වීමේ අයිතිය නැති කිරීමකි. කෙනෙකු රැවටීමකි. එය නොකළ යුත්තකි. එකී පාප කර්මය සිදු කිරීම තුළින් කෙනෙකු අසීරුතාවයට පත්වීම සිදුවනු දැකීම නොවැළැක්විය හැක්කකි. එබැවින් ඉන් වැළකීම මෙන්ම එම සිල්පදය මෙනෙහි කිරීම ද ඉතා වැදගත් වූවකි.

පස්වන ශික්ෂා පදය වනුයේ මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකී සිටීමේ ශික්ෂා පදයයි. සියලු බුදු, පසේ බුදු, මහ රහතන් වහන්සේල දිවි හිමියෙන් මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීමෙන් වෙන් වූ සේක. මම ද අද උන්වහන්සේලා අනුගමනය කරමින් මත්ද්‍රව්‍ය පාවිච්චියෙන් වෙන්ව වාසය කරමි යනුවෙන් සිතමින් අට සිල් රැකීමෙහි නිරත වන තැනැත්තා මෙකී පස්වන ශික්ෂා පදය මෙනෙහි කළ යුත්තේමය.

මත් උවදුර වනාහි තමාත් අන්‍යනුත් විනාශ මුඛයට ම ඇද දමන්නා වූත් මෙලොව පරිහාණිය ගෙන දෙන්නා වූත් කරුණකි. මත්ද්‍රව්‍ය හේතු කොට ගෙන පුද්ගලයා ශාරීරික, මානසික, ආර්ථික, සමාජීය ආදී වශයෙන් වූ සැම අංශයකින්ම පිරිහීමට පත්වනු නියතයි. එසේ හෙයින් ඉන් ඉවත්විය යුතුමය.

සයවන ශික්ෂා පදය වන අවේලාවේ ආහාර ගැනීමෙන් වැළකී සිටීමේ ශික්ෂා පදය මෙනෙහි කළ යුත්තේ මෙසේය. එනම්, සියලු බුදු, පසේ බුදු, මහ රහතන් වහන්සේලා දිවි හිමියෙන් අවේලාවේ ආහාර ගැනීමෙන් වෙන්වූ සේක. මම ද අද උන්වහන්සේලා අනුගමනය කරමින් අවේලාවේ ආහාර ගැනීමෙන් වෙන්ම වාසය කරමි යනුවෙනි.

අට සිල් රැකීමෙහි නිරත තැනැත්තා මෙකී සයවන ශික්ෂා පදය ඒ අයුරින් මෙනෙහි කිරීම ඉතා වැදගත් වනු නොඅනුමානය.


සත්වන සිල්පදය ද සුවිශේෂී වූවකි. මෙය අට සිල් සමාදන් වූවකුට තවත් වැදගත් වූ ශික්ෂා පදයකි. එනම් නැටීම්, ගී කීම්, බෙර ආදිය වාදනය කිරීම්, විසුලු බැලීම්, මල් පැළඳීම්, සුවඳ දැරීම්, විලවුන් ගැල්වීම්, සැරසීම් යන මේවායින් වෙන්වීමය.

එම ශික්ෂා පදය රකින තැනැත්තා එය මෙනෙහි කළ යුත්තේ සියලු බුදු, පසේ බුදු, මහ රහතන් වහන්සේලා දිවි හිමියෙන් නැටීම්, ගී කීම්, බෙර ආදිය වාදනය කිරීම්, විසුලු බැලීම් , මල් පැළඳීම්, සුවඳ දැරීම්, විලවුන් ගැල්වීම්, සැරසීම් යන මේවායින් වෙන් වූ සේක. මම ද අද උන්වහන්සේලා අනුගමනය කරමින් නැටීම්, ගී කීම්, ආදියෙන් වෙන්ව වාසය කරමි. යනුවෙනි.

අවසාන වශයෙන් අටවන සිල්පදය වන උස් ආසන හා මහා සයන වලින් වෙන්වීමේ ශික්ෂා පදය රකින අට සිල් සමාදන් වූ තැනැත්තා එය සියලු බුදු, පසේ බුදු, මහ රහතන් වහන්සේලා දිවි හිමියෙන් පමණට වඩා උස් ආසන වලින් හා පුළුන් ගුදිරි ආදී මහා සයන වලින් වෙන් වූ සේක. මම ද අද උන්වහන්සේලා අනුගමනය කරමින් උස් ආසන වලින් හා මහා සයන වලින් වෙන්ව වාසය කරමි. යනුවෙන් මෙනෙහි කළ යුත්තේමය.

ලුහුඬින් වුවත් අට සිල් මෙනෙහි කරන්නා වූ ආකාරය ඉහත පරිදි දත යුතුය. අට සිල් සමාදන් වන බොදු උවසු උවැසියන් එකී තමා සමාදන් වූ අට සිල් රැකගනිමින් මෙනෙහි කිරීම තුළින් සමාදන් වූ ශිලයෙහි මහත් ඵල උදාකර ගැනීමට හැකි වීම මතු දිනක හෝ සිදුවනවාට කිසිදු සැකයක් නැත. එසේ හෙයින් අට සිල් මෙනෙහි කිරීමට උකටලී නොවිය යුත්තේමය.

ආර්. එන්. එච්. එම්.
සමන් ජයරත්න




සම්බුද්ධ පරිනිර්වාණයෙන් වර්ෂ දෙදහස් හයසීයක් ගතවන මෙම අවස්ථාවේ ඒ භාග්‍යවත් සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ උතුම් ත්‍රිවිද රත්නයේ ගුණ පිළිබඳව අප සතු අවබෝධය වර්ධනය කරගැනීම ඉතාම වැදගත් කාර්යයකි.

"රුවන්" යනු අප කවුරුත් දක්නා පරිදි අනර්ඝ වටිනා කමකින් යුතු මාණික්‍යය යන්නයි. බබළන ගතිය මැණික්වල තිබෙන විශේෂ ගුණයකි. අනෙකුත් ස්භාවික වස්තූන් හා සසදා බලනවිට මැණික්වල විශේෂ දීප්තිමත් බවක්, විසිතුරු බවක් දක්නට ලැබේ. ඒ විසිතුරු දීප්තිමත් ස්වාභාවය තුණුරුවන් සතු වේ. එසේම ලොව සියළු දෙනා හා සියළු ධර්මයන් අතර තුණුරුවනට හිමිවන්නේ උත්තරීතර, පූජනීය ස්ථානයකි. තථාගත සම්මාසම්බුදු රජාණන් වහන්සේ බුද්ධ ධර්මය මහසඟරුවන කිසිඳු ධර්මයකට සමකළ නොහැක.

තුනුරුවන් සතු ගුණාංග සැදූහැවත් බොදුනුවන් නිතර සිහිකරගත යුතුයි. එහි නියම අවබෝධය අප හැමදෙනාම සතුවන්නේ නැහැ. ත්‍රිවිධ රත්නයේ ගුණ විසිහතරක් සඳහන්වන අතර ත්‍රිවිධ රත්නය හැඳින ගතහැකිවන්නේ මේ පිළිබඳ අවබෝධය ලබාගතහොත් පමණයි. එම අවබෝධය හා ශ්‍රද්ධාව නිසා හොඳ බෞද්ධයෙකු බවට පත් වේ.

"අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං
භාවේ තබබංච භාවිතං
පහා තබබං පහීනං මේ
තස්මා බුද්ධෝති බ්‍රාහ්මණං"

යනුවෙන් බුදුරජාණන් වහන්සේ බ්‍රාහ්මනයෙකුට තමාව හඳුන්වා දුන්නේ ලොව දැනගත යුතු යමක් ඇත්නම් ඒ සියල්ල ආර්යය අෂ්ඨාංගික මාර්‍ගය වඩනාලද බවත් ප්‍රහීණ කළ යුතු යමක් වේ නම් සියල්ල ප්‍රහීන කළ බවයි. ඒ නිසාම මම (බුද්ධ) සම්මා සම්බුද්ධ වෙමි.

විජ්ජා :- යනු ආයර්‍ය විද්‍යාව චතුරාර්ය සත්‍යය ඇති සැටියට දන්නා ඥාණයයි. චරණ යනු ඒ ආයර්‍ය විද්‍යාව හා නිවන් අවබෝධය සඳහා උපකාර වන සීලාදී ගුණධර්මයයි. එම චරණයේ පිහිටා ආයර්‍ය විද්‍යාව ලැබිය යුතුයි.

සුගතෝ :- යහපත් මාර්‍ගයේ ගිය හෙයින් පරම සුන්දර වූ නිවනට පැමිණි හෙයින්ද මනා ලෙස කථා කරන නිසාද 'සුගත' නම් වන සේක. සුපිරිසිදු වරදින් තොර අංග අටකින් සමන්විත වූ මධ්‍යම ප්‍රතිපදව නම් වූ මාර්‍ගය නිවනට යන මාර්‍ගයයි.

ලෝකවිදූ යන අවිඤ්ඤාණික සවිඤ්ඤාණික සියල්ල මමයි. පරමාර්ථ වශයෙන් නාම හා රූප දෙකයි. බුද්ධ කාලයේ පහළ වූ ඇතැම් දාර්ශනිකයින් ලෝකය දෙවියෙකුගේ බ්‍රහ්මයෙකුගේ මැවීමක් බව උගන්වා තිබුණ නමුත් ලෝකය යනු කිසිවෙකුගේ මැවීමක් නොවන බවත් කර්මයේ විපාකත්, විපාක නිසා කර්මත් , හේතුව නිසා ඵලයත් ඵලය නිසා හේතුවත් ඇති වීමෙන් සසර නොසිඳී පවතින බව අවබෝධ කළ සේක.

අනුත්තරෝ පුරිසධම්මසාරථී යනු ලෝකයේ සිටින ඕනෑම තරාතිරකම නපුරු ගරුකළ යුත්තන්ට ගරු නොකරන අන්‍යයන්ට කරදර කරන අහංකාර, කපටි, අවිද්‍යාවෙන් අන්ධව රාගාදී කෙලෙසුන්ට වසඟව පස්කම් සැප සොයන ඕනෑම පුද්ගලයෙක් දමනය කිරීමට සමත්වන බැවින් තථාගතයන්වහන්සේ මෙම ගුණයෙන් යුක්තවන සේක. ශිලාචාර වන පරිදි, නැවත වෙනස් නොවන පරිදි, රුදුරු නොවන පරිදි, අංගුලිමාල, සච්චක අන්‍ය තීර්ථකයන් නාලාගිරි, ආලවක, අදින්න පුබ්බක, මච්ඡරිය කෝසිය, බක බ්‍රහ්ම දෙවියන් බ්‍රහ්මයන් ආදී යක්‍ෂයන්, නාගයන් ආදීන් විශාල පරිසක් ඉතා විනීත ලෙස දමනය වූයේ මෙම උතුම් බුදුගුණය නිසායි.

සත්ථා ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ දෙව් මිනිසුන්ට ශාස්තෘ වන සේක. ලෝකයේ විවිධ ශාස්තෘවරු සිටියද සත්වයා සසරින් එතෙරව නිවන් ලබන්නට අනුශාසනා කිරීමට භාග්‍යවතුන්වහන්සේ හැර වෙනත් ශාස්තෘවරයෙක් නැත.

බුද්ධෝ චතුරාර්ය සත්‍යය අවබෝධ කළ බැවින්ද චතුරාර්ය සත්‍යය සසර දුක් විඳින ජනතාවට අවබෝධ කරවන බැවින්ද සියල්ල දත් බැවින්ද අන්‍යයන් විසින් අවබෝධ යුත්තක් බැවින්ද තථා ගුණයෙන් යුක්ත බැවින්ද රාග, ද්වේෂ, මෝහ, දුරු කළ බැවින්ද ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ගමන් කළ බැවින්ද තනිවම සම්මා සම්බෝධියට පත් වූ බැවින්ද බුද්ධ නම් වන සේක.

භගවා යනු ශ්‍රේෂ්ඨ උත්තම ගරුකළ යුතු පුද්ගලයෙකු හැඳින්වීම සඳහා භාවිතා කරන වචනයකි. තථාගත බුදුපියාණන් වහන්සේට වඩා උත්තම කෙනෙකු ශ්‍රේෂ්ඨ කෙනෙකු හෝ සමාන කෙනෙකු ලොවේ නැත. ඒ නිසා ලොව මනුෂ්‍යයින් විසින් පමණක් නොව දේව, බ්‍රහ්ම, ශක්‍ර ආදීන් විසින්ද ගරු බුහුමන් දක්වති.

සත්ථා දේවමනුස්සානං නිවන් අරහයා අනුශාසනා කළ එකම ශාස්තෘවරයාණන් වහන්සේ බුදුරාණන් වහන්සේමය. එනම් ජාති, ජරා, ව්‍යාධි, මරණාදී දුක්ඛයන්ගෙන් මිදෙනු වස් කරන අනුශාසනාවයි. නිවන් අරහයා කළ ඒ අනුශාසනය බුදුරජාණන්වහන්සේගේ උසස්ම ප්‍රාතිහාර්යයි. තථාගතයන්වහන්සේ ප්‍රාතිහාර්යයන් අතර අනුදැන වදාළේ අනුශාසනා ප්‍රාතිහාර්යය පමණි. ඒ තුළින් මනුශ්‍ය සම්පත්, දිව්‍ය සම්පත්, රූපාවචර, අරූපාවචර ධ්‍යානයත් හා අභිඥද සතර මාර්‍ග සතරඵල නිර්වාණ ධාතුවෙන් සසර දුක් කෙළවර කළ හැකි බැවිණි. සතළිස් පස් වසරක් පුරාවට දේශනා කළ ෘධර්මස්කන්ධයෙන් මෙම බුදුගුණ මැනවින් පැහැදිළිවේ. පිරිනිවන් මංචකයේදී කළ අවසාන අනුශාසනාව නොපමාව කුසල් කරන්න. අප්‍රමාදීවන්ත යනුයි. බොහෝ සූත්‍රවල සඳහන් පරිදි දෙවියන්, මරුන්, බඹුන් මිනිසුන් සහිත ලොවෙහි තමන්වහන්සේම ස්වකීය ඥානයෙන් ප්‍රත්‍යක්‍ෂ කොට කේවල පරිපූර්ණවූ ව්‍යඤ්ජන සහිතව මුල,මැද,අග කළණවූ දහමක් දෙසූ එකම ශාස්තෘවරයාණන් වන බැවින්ද තවත් බුදුවරයෙකුට පමණක් සමවන අනෙකකුට අසම සම වන හෙයින්ද දෙව් මිනිසුන්ට ශාස්තෘ වූ සත්ථා දේවමනුස්සානං වූ ප්‍රතිමූර්තිය සම්මා සම්බුදුන්මය.

ධර්මරත්නයේ ගුණ

බුදුරජාණන්වහන්සේ ලෝකයාගේ හිත සුව පිණිස හතළිස්පස් වසක් මුළුල්ලේ දේශනා කළ ධර්මය පර්යාප්ති ධර්මය, ධර්ම විනය වශයෙන් කොටස් වන්නේද ප්‍රථම බුද්ධ වචනය, මධ්‍යම බුද්ධ වචනය, පශ්චිම බුද්ධ වචනය යනාදී වශයෙන් මෙය කොටස් කළ හැකිය.

ධර්මය යනු සත්වයා සතර අපායට වැටෙන්නට නොදී රැකගැනීමයි. එසේ වූ ධර්මයේ ගුණ 6ක් ගැන සඳහන් වේ.

ධම්මං විතා නත්‍ථි පිතාච මාතා
තමේව තාණං සරණං පතිට්ඨා
තස්මානි හෝ කිච්ච මඤ්ඤප්භාය
සුනාථ ධාරේථ චරාථ ධම්මේ

ධර්මයට මවක් පියෙක් නැත. ධර්මය සත්වයාට ආරක්‍ෂාව සරණ පිහිට ලබාදේ. ඒ නිසා අන් සියළු වැඩ නවත්වා ධර්මය අසන්න. ධාරණය කර ගන්න. ඒ අනුව හැසිරෙන්න.

ස්වාක්ඛාත ගුණය ඃ- බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද ධර්මය සර්වඥතා ඥානයෙන් ප්‍රත්‍යක්‍ෂ වශයෙන්ම දැන දේශනා කරන ලද්දකි. මේ ධර්මය ලෝකයේ අනිත්‍ය ස්වාභාවය, දුක්ඛ ස්වාභාවය, අනාත්ම ස්වාභාවය දැක ඉන් මිදීම පිණිස ප්‍රත්‍යක්‍ෂයෙන්ම දැක දේශනා කළ සේක. ඒ ධර්මය පිළිපදින්නවුන්ට ලෞකික, ලෝකෝත්තර, සම්පත්තියම දැකිය හැකිය. ඒ නිසාම මේ ධර්මය ස්වක්ඛාතයි.

සන්දිට්ඨික ගුණය ඃ- මේ ධර්මය තමන් විසින්ම දැක තම තමන් විසින්ම ප්‍රත්‍යක්‍ෂ කරගත හැකි ධර්මයකි. මේ ධර්මය නිතර ධාරණය කරන අයට මෙලොව වශයෙන්ද උසස් ඵල දැකිය හැක. රතන සූත්‍රයෙහි සඳහන් මහානුභාව සම්පන්න බලය විශාලා මහනුවර තුන්බිය දුරු කළේය. කරණිය සූත්‍රයේ බලයෙන් අමනුෂය උපද්‍රව දුරු කළේය. කිසා ගෝතමී පටාචාරා ආදී කොටි ප්‍රකෝටි ගණන් දුකට පත් වූවන් සැනසීම ලැබුවේත් ආයුෂ පිරිහුණු සක් දෙව් රජු ආයුෂ වර්ධනය කරගත්තේත් මේ ධර්මයෙහි තිබෙන සන්දිට්ඨික ගුණ නිසයි.

අකාලික ගුණය ඃ- බුදුරජාණන් වහන්සේ දෙසූ මේ ධර්මය තමන් පළමුව ප්‍රත්‍යක්‍ෂ කළා. ඕනෑම කෙනකුට ඕනෑම විටෙක මේ ධර්මය විමසන්නට පිළිවනි. එහි හැසිරෙන්නට පුළුවනි. මේ ධර්මය පැහැදීමෙන් යහපතක් මිස අයහපතක් සිදුවන්නේ නැත.

ඕපනයික ගුණය ඃ- මේ ධර්මය තමාගේ සිතේ ධාරණය කර ගන්නට සන්තානයේ තැන්පත් කරගන්නට සුදුසුයි. තථාගතයන්වහන්සේ සාරසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් කල් දස පෙරුම් පිරූ සේක. දුක්වින්දේ මේ උත්තරීතර ධර්මය කෙලෙසක හෝ තම ජීවිතයට සමීප කර ගන්නටයි. කොපමණ දුක් විඳ හෝ එය අවබෝධ කරගැනීම සුදුසු නිසයි බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා අපමණ වෙහෙස ගෙන ඒ ශ්‍රී සද්ධර්මය වෙසෙසින්ම භවලෝකෝත්තර ධර්‍මය ස්ව සන්තානයෙහි රෝපණය කරගැනීමට උත්සහ වූයේ.

පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහීති ඃ- මේ ධර්මය ප්‍රඥාවන්තයින් සඳහා මිස මෝඩයින් සඳහා නොවේ. නුවණැති අය මේ ධර්මය තම හිස පැළඳි රන් ආභරණයක් සේ අරක්‍ෂා කෙරේ. එහි අගය වටිනාකම දැනගත්තේ නුවණැත්තන් පමණි. ලොව්තුරා දහම ධ්‍යානාංග ආදිය උත්තරීතර පුද්ගලයන් බුද්ධිමතුන් විසින්ම අවබෝධ කරගත යුත්තක්. එයද තම තමන් වෙන වෙනම අවබෝධකරගත යුත්තක්. ඒ නිසයි මේ ධර්මය ප්‍රඥාවන්තයනට ගෝචර වන බව පැහැදිළි කර දී තිබෙන්නේ.

ඒහිපස්සිකෝ ඃ- බුදුරජාණන්වහනසේ දේශනා කළේ ඒකාන්තයෙන්ම විද්‍යාමාන වූ ධර්මයකි. ඒ නව ලොකෝත්තර වූ ශ්‍රී සද්ධර්මය ප්‍රත්‍යක්‍ෂ වශයෙන් බුදුරජාණන්වහන්සේ දැක, දැන අවබෝධකරගත් නිසායි. බිය සැක නැතිව 'එන්න බලන්නැයි' දේශනා කළේ.

08 පිටුවට....

-මෙත්තානි අසේකා මෙහෙණින් වහන්සේ-

යො බාලො මඤ්ඤති බාලයං - මෝඩයා තමාගේ මෝඩකම නොදන්නෙක් වේ

රංගිරි ශ්‍රී ලංකා
RSL NEWSPAPER



# භික්ෂූන් වහන්සේලාට සිව්පසයෙන් උවටැන් කරන ගිහියන්ට ධර්ම දානයෙන් සංග්‍රහ කළ යුතුය



බුදුරජාණන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රය තුළින් දේශනා කළ ගිහි පැවිදි සම්බන්ධතාවය සමාජ සංස්ථාවේ ප්‍රගමණයට ඉතා වැදගත් වේ. මුළු සමාජ සංස්ථාවම පවතින්නේ යුතුකම් හා වගකීම් මතය. එහි ප්‍රධාන අංගයක් වශයෙන් ගිහි පැවිදි දෙකොටස පෙන්නා දීමට පුළුවන. මේ දෙපිරිස අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවය ශක්තිමත්ව ගොඩනැගුණ හොත් එය ගමක, පළාතක, රටක පමණක් නොව මුළු ලෝකයටම යහපතක්ම සිදුවන බව නියතය.

බුදුරජාණන් වහන්සේ දේශනා කළ ආකාරයට ගිහි පිරිස විසින් භික්ෂූන් වහන්සේලා උදෙසා ආමිස දානයෙන් සංග්‍රහ කළයුතුව ඇත. චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස යන සිව් පසයෙන් භික්ෂූන් වහන්සේලාට සංග්‍රහ කරනු ලැබේ. ඊට අමතරව තවත් කරුණු පහකින්ද සංග්‍රහ කරනු ලැබේ. එනම්,

1. මෛත්‍රී සහගතව ක්‍රියාවෙන්
2. මෛත්‍රි සහගත කතාවෙන්
3. මෛත්‍රී සහගත සිතුවිල්ලෙන්
4. නිවසෙහි දොර භික්ෂූන්ටවිවෘතව තැබීමෙන්
5. ආමිසයෙන් සංග්‍රහ කිරීමෙන්

මේ ආදී කරුණු වලින් ගිහි පිරිස් භික්ෂූන් වහන්සේලාට සංග්‍රහ කරනු ලබන්නේ කිසිදු ලාභ ප්‍රයෝජන හෝ කීර්ති ප්‍රශංසා බලාගෙන නොවේ. එලෙස ගිහි ජනතාවගේ කුදු මහත් කටයුතු කරගැනීමේ අදහසින්ද නොවේ. කිසිම අවස්ථාවක ගිහි පිරිස් භික්ෂූන් වහන්සේලා සඳහා ඔවුන්ගේ නිවස හෝ ඔවුන්ගේ පෞද්ගලික කටයුතු සඳහා හෝ කතා නොකරති. එසේනම් ඔවුන් බලාපොරොත්තු වන්නේ කුමක්ද?

**ගිහි පිරිසගේ ශ්‍රද්ධාව ගෞරවය වැඩි වන අයුරින් ධර්මය දේශනා කිරීමෙන් උපකාරය කළ යුතුය. ගිහි පිරිසගේ ශ්‍රද්ධාව ගෞරවය වැඩිවන අයුරින් චර්යාමය වෙනසක්ද භික්ෂූන් වහන්සේලා විසින් ඇති කරගත යුතුව ඇත. ඒ සඳහා විනය ප්‍රාතිමෝක්ෂය තුළ දේශිත කරුණු අනුගමනය කළ යුතුවේ.**

බුදුරජාණන්වහන්සේ මෙහිදී ගිහි පිරිස භික්ෂූන් වහන්සේලාගෙන් බලාපොරොත්තු වන දෙය මැනවින් පැහැදිළි කරදී ඇත. එනම්,

ගිහීනමූප කරොන්තානං
නිච්ච මාදිස දානතො
කරෝථ ධම්ම දානෙන
තෙසං පච්චුප කාරකං

ආමිස දානයෙන් සංග්‍රහ නොහොත් උපකාර කරන ගිහියන්ට ධර්ම දානයෙන් උපකාර කිරීම භික්ෂූන්ගේ වගකීම බව එම ගාථාව තුළින් පැහැදිළි කොට ඇත. ගිහි පිරිසට භික්ෂූන් වහන්සේලා ආගමික සහනශීලී තාවය වර්ධනය වන අයුරින් ධර්මය තුළින් සිදු වියයුතු උපකාර කළ යුතුය. ගිහි පිරිසගේ ශ්‍රද්ධාව ගෞරවය වැඩි වන අයුරින් ධර්මය දේශනා කිරීමෙන් ප්‍රති උපකාරය කළ යුතුය. ගිහි පිරිසගේ ශ්‍රද්ධාව ගෞරවය වැඩිවන අයුරින් චර්යාමය වෙනසක්ද භික්ෂූන් වහන්සේලා විසින් ඇති කරගත යුතුව ඇත. ඒ සඳහා විනය ප්‍රාතිමෝක්ෂය තුළ දේශිත කරුණු අනුගමනය කළ යුතුය. තවද භික්ෂූන් වහන්සේලා විසින් ගිහි පිරිස උදෙසා මෙම කරුණු වලින්ද සංග්‍රහ කළ යුතුය.

1. පවින් වැළැක්වීම
2. යහපතෙහි යෙදවීම
3. හොඳ හිතින් අනුකම්පා කිරීම
4. නොදන්නා දේ කියා දීම
5. දන්නා දේ තහවුරු කිරීම
6. දෙව් ලොවට යන මඟ කියා දීම

මෙම කරුණු මැනවින් ඉෂ්ට සිද්ධ වීම තුළින් ගිහි පැවිදි සම්බන්ධතාවය වඩ වඩාත් ශක්තිමත් වනු ඇත. ඒ තුළින් දෙඅංශයම නිවනේ දොරගුලුද විවර කරගනු ඇත. එනිසා භික්ෂූන් වහන්සේලා වශයෙන් අප නිරන්තරයෙන් ගිහි ජනතාවට ධර්ම දානයෙන් සංග්‍රහ කොට උතුම් සතුට ලබා ගැනීමට උත්සාහවත් වෙමු.

පූජ්‍ය ගලගෙදර රතනවංශ හිමි

07 පිටුවෙන්....

'සු' යනු සුන්දරවූ ඉතාම හොඳ වූ කියන එකයි. 'පටිත්ත' කියන්නේ ප්‍රතිපදාවකට පිළිගන්නාවූ එකට කියන එකටයි. බුදුපියාණන්ගේ ශ්‍රාවක සංඝයා අතුරෙන් කෙලෙස් ඇති පිරිස නිවනට යොමු වූ ඒ සුන්දර ශිලාදී ප්‍රතිපදාවන් පුරණා බැවින්ද නිකෙලෙස් ආර්ය උතුමන් ඒ ප්‍රතිපදව පිරූ බැවින්ද 'සුපටිපන්න' ගුණයෙන් යුක්තයි.

උජුපටිපන්නෝ යන්නෙහි අර්ථය වනුයේ භාග්‍යවතුන් වහන්සේ විසින් අවබෝධ කොට ශ්‍රාවකයන් උදෙසා මධ්‍යම ප්‍රතිපදාව නම් වූ මේ සෘජුවම නිවන් සුව සළසා දෙන ආර්ය අෂ්ඨාංගික මාගීය අනුගමනය කරන ආර්ය මහ සංඝයා සෘජු වූ පතිපදවට පිළිපත් උජුපටිපන්න ගුණයෙන් යුක්තයි. ඒ අනුව පිළිපදින ආර්ය මහා සංඝරත්නය කාය, වචී, මනෝ, දුෂ්චරිතයන් ප්‍රහාණය කිරීම පිණිස ආර්ය මහා සංඝරත්නය පිළිපත් බැවින්ද උන්වහන්සේලා 'උජුපටිපන්න' ගුණයෙන් යුක්තය.

ආර්ය මහා සංඝරත්නය 'ඤායපටිපන්න' ගුණයෙන් යුක්තයි. අධි ශීල, අධි චිත්ත, අධි ප්‍රඥා සංඛ්‍යාත නිවනට හේතුවන ප්‍රතිපත්තියෙහි පිහිටියා වූ බැවින් 'ඤායපටිපන්න' නම් වේ. 'ඤාය' කියන්නේ නිවනටයි. නිවන පිණිස නිවනට අනුව ඒකාන්තයෙන්ම නිවනට පමුණුවන ත්‍රිශික්ෂාවෙන් සමන්නාගත වූ ආර්ය අෂ්ඨාංගික මාගී ප්‍රතිපත්තිය පුරන බැවින් භාග්‍යවතුන්වහන්සේගේ ශ්‍රාවක සංඝයා 'ඤායපටිපන්න' නම් වේ.

ගුණවත් පුද්ගලයන්ට කරදීමට සුදුසු ක්‍රියා 'සාමීචි' කර්ම යනුවෙන් හැඳින්වේ. දුටුවිට හුනස්නෙන් නැගිටීම අසුන් පනවා දීම, පා සේදීම, නෑම සඳහා උණු පැන් ඇල් පැන් සකස් කර දීම, පා සිවුරු සෝදා දීම, සෙනසුන පිරිසුදු කර දීම යනාදී වශයෙන් සාමීචි කර්ම රාශියක් තිබේ. දායකයන්ගේ සිව්පසයෙන්ම පමණක් යැපෙන කුරා කුහුඹුවෙකුටවත් වරදක් නොකරන හැමටම මෙත් වඩන අවිහිංසක වූ ප්‍රතිපදාවක් අනුගමනය කරන අර්ය මහා සංඝරත්නය දායකයන්ගේ 'සාමීචි' කර්මයනට හැම අතින්ම යෝග්‍යවන බැවින් 'සාමීචිපටිපන්න' නම් වේ.

යමෙකක් විශේෂයෙන්ම පිළයෙළ කරගත් දානයක් බොහෝ දුර වසන්නාවූ භික්ෂූන්වහන්සේ නමකට පිරිනමන්නේ සංඝයා සතු වූ 'ආහුනෙය්‍ය' ගුණය නිසාමයි. බුදුරදුන් දවස යොදුන් සිය ගණන් මඟ ගෙවා ගෙන විත් බුදුපාමොක් මහසඟනට දන් පිරිනමා ඇති අයුරු හරිම අසිරිමත්.

ආගන්තුකව පැමැණෙන ඕනෑම කෙනෙකුට සංග්‍රහා කිරීම සඳහා පිළියෙළ කළ ආහාර ආදිය පිළිගැන්වීම සඳහා ශ්‍රාවක සංඝයා සුදුසු වන නිසාත් එසේ පිළිගැන්වීමෙන් ආගන්තුක සත්කාරයට වඩා උසස් ආනිසංසයක් ලැබිය හැකි නිසාත් 'පාහුණෙය්‍ය' ගුණයෙන් යුක්ත වන්නේය.

යමෙක් පින් පව් හා විපාක පිළිගෙන මෙලොව හා පරලොව යහපත වෙනුවෙන් සිල්වතුන් උදෙසා දන්පිරිනමනවා නම් එම දක්ෂිණා පිළිගත් විට දායක පක්ෂයට එහි උපරිම ආනිසංස ලැබේ. ත්‍රිශික්ෂා වඩන කෙලෙස් දුරු කළ දුරු කරමින් සිටින ශ්‍රාවක සංඝයා මෙළොව යහපත වෙනුවෙන් හා මියගිය ඥාතීන් වෙනුවෙන් දෙන දක්ෂිණාවන් පිළිගැනීමට වඩාත්ම සුදුසු පිරිස වන්නේය. ඒ නිසා ශ්‍රාවක සංඝයා දක්ඛිණෙය්‍ය ගුණයෙන් යුක්ත වන්නේය.

දෝත නගා වැදීමට හැම අතින්ම සුදුසුවන බැවින් මහසඟරුවන 'අඤ්ජලිකරණීය' වේ. ආර්ය ශ්‍රාවක භික්ෂූ භික්ෂූණීන් වහන්සේලාට නමස්කාර කරන්නන්ට මහත් විපාක ලැබේ. ඒ උන්වහන්සේලා සතු ශිලාදී ප්‍රතිපත්ති සමුදාය නිසායි. පිළිවෙත් සරු වූ මහ සඟරුවනට මුළු හදින්ම වැඳ නමස්කර කිරීමට යෝග්‍යවන බව සත්‍යයි. ඒ නිසාම උන්වහන්සේලා අඤ්ජලිකරණීය ගුණයෙන් හඳුන්වනු ලැබේ.

බුදුරජාණන්වහන්සේගේ ආර්ය ශ්‍රාවක මහා සංඝයා 'අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස' ගුණයෙන් යුක්ත වෙනවා කියන්නේ මහ සඟරුවනද ලෝවැසි මනුෂ්‍යන්ගේ පුණ්‍ය බීජයක් වැපිරීමට සුදුසු වන කුඹුරක් බඳුයි. එයට උපමාකළහැකි සමකළහැකි කිසිවක් තවත් අත්තේ නැහැ. ඒකයි අනුත්තර යන වචනය යෙදී තිබෙන්නේ.

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER

රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.

දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 5361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: rangirinewspapers@gmail.com
වෙබ් අඩවිය: www.rangirisrilanka.lk

# බුදු දහමින් ලොව දකිමු

සොබාදහමට ඉතා සමීපම දහම බුද දහම බව එදාමෙදා තුර මෙලොව පහළ වූ බොහෝ ශ්‍රේෂ්ඨ දාර්ශනිකයින් විසින් එකහෙළා පිළිගනු ලැබ ඇත.

සියලු සංස්කාරයන් අනිත්‍ය බවත් එය ජීව අජීව ලෝකයේ කාහටත් උරුම වන පොදු ධර්මතාවයක් බවත් බුදුරජාණන් වහන්සේ මැනවින් පෙන්වා දුන්හ. ඒ අනුව සියලු බෞද්ධයෝ මෙකී ධර්මතාව වඩාත් හොඳින් දන සිටියහ. අනිත්‍ය, දුක්ඛ අනාත්ම යන ත්‍රිලක්ෂණය ජන වහරේ සුලභ කියමනක් බවට පත්වූයේද මිනිස් චින්තනය ලෝකයේ අස්ථිර ස්භාවයට හොඳින් හැඩගස්වනු පිණිසය.

මෙලොව ඇති අන් බොහෝ ආගම් මඟින් මිනිසාගේ ස්වාමීත්වය දෙවියන්ට, බඹුන්ට, කර්මයට හෝ වෙනත් අදෘෂ්‍යමාන බලවේගයන්ට පවරා දුන්හ. නමුත් මිනිසාගේ ස්වාමීත්වය මිනිසාටම භාරකළ බුදුරජාණන්වහන්සේ සසරින් එතෙර වීමේ මාර්ගයද පෙන්වා දුන් සේක.

මිනිසා ප්‍රමඛ සත්වයින්ගේ පිළිවෙල හෙවත් සංසාරයට පටන්ගැන්මක් නැති බව කියාදුන් බුදුරජාණන්වහන්සේ පෘතුවිය සක්වළ හා විශ්වයේ පැවැත්ම පිළිබඳවද කරුණු සූත්‍ර රැසක සඳහන් කළ සේක.

මේ ග්‍රහලොව විනාශවේද? සක්වළට කුමක්වේද? ජීවයට කුමක් වේද? යන ප්‍රශ්න අද කාතුළත් පවතින බව මෙරට පවා ජනමාධ්‍ය එකී ප්‍රස්තුතයට ලබාදී ඇති සැළකිල්ලෙන් පෙනී යයි. ඇතැම් මාධ්‍ය ලෝක විනාශයට දින ගැනීමද අරඹා ඇති බව දකගත හැකිය.

ලෝක ජනමාධ්‍ය මෙන්ම මිනිසාගේ වෙනස්වීමද ලෝක සත්වයාහට පුදුම කරුණක් වුවද බෞද්ධ මතය පිළිගත් කවරෙකුටවත් එය පුදුමයට කරුණක් නොවන්නේය.

චතුරාර්ය සත්‍යය, පුනර්භවය, කර්මය, පටිච්චසමුප්පාදය, ආර්‍ය අෂ්ඨාංගික මගීය, අටලෝ දහම ආදී බුදුදහමේ මූලිකාංග අල්පමාත්‍රයක් හෝ දන ඉගෙන ඇත්නම් බණක් පිරිතක් ශ්‍රවණය කර ඇත්නම් ඒ සියලු දෙනා සසරින් එතෙර වන ආකාරය එක්වරක් හෝ අසා ඇතිවාට සැක නැත.

නමුත් වර්තමානයේදී ඒ සියල්ල යටපත්ව ජනප්‍රිය සංස්කෘතියේ සහ ජනප්‍රිය ආගම් මතවාදයන්හි ඇලී ගැලීම නිසා ලෝකය හා තමා පිළිබඳ යථාර්ථය යළිත් පෙර කී දෙවියන්ට, බඹුන්ට හෝ අදෘෂ්‍යමාන බලවේගයන්ට පඬුරු පාක්කුඩම් සහිතවම පූජාකරන අයුරු දූන් දූන් විලාසිතාවක්ව පැතිර යනු දකගත හැකිය.

බෞද්ධයන්හට සාර අසංඛකල්ප ලක්ෂ ගණනක ඉතිහාසයක් පවතී. එය ආරම්භ වන්නේ සුමේධ තාපසතුමන් දීපංකර පාද මූලයෙහි නියත විවරණ ලත්දා සිටය. ඒ හැර බුදුරජාණන් වහන්සේලා 28 නමක් පිළිබඳව අඛණ්ඩ ආගමික ඉතිහාස කථාවක්ද අප සතුය.

ඒ අනුව ලෝකවිෂයත් මිනිසා ප්‍රධාන සත්වයින්ගේ සසර ගමනත් පිළිබඳව ඇති ඉතා පැහැදිළි බෞද්ධ මතය අප විසින් මනා සිහියෙන් යුක්තව අවබෝධකරගතයුතු කාලයක් එළඹ ඇත්තේය.

ලොව පුරා වෙසෙන බුද්ධ පුත්‍රයින් වහන්සේලාත් බෞද්ධ සන්නිවේදකයින් විසිනුත් එම වගකීම නොවලහා ඇරඹිය යුතු වන්නේය. ගණක මොග්ගල්ලාන සූත්‍රයේ දක්වෙන මේ බුදු වදනද සිහිකරනු වටී.

"අථ ච පන මම සාවකා මයා
එවං ඔවදියමානා, එවං අනුසාසියමානා
අපෙපකච්චෙ අඛන්ත නිට්ඨං
නිබ්බාණං ආරාධෙන්ති එකච්චෙ
නාරාධෙනති එතථ ක්‍යහං
බ්‍රාහ්මණ කරොමි මග්ගකඛයීහං
බ්‍රාහ්මණ තථාගතෝති

(මා මේ අයුරින් අවවාද අනුශාසනා කරද්දී, ඇතැම් දෙනා පරම අදහස වන නිවන ළඟා කර ගනිති. ඇතැම් දෙනා නොලබති. එහිලා මා කුමක් කරම්ද? තථාගතයන්වහන්සේ මඟ, කියාදීම පමණි)



# සමගිය බලය වේ

සමගිය ගැන ලෝකයාට පළමුවෙන්ම දේශනාකොට වදාළේ සම්බුදු රජාණන් වහන්සේය. තම සිව්වනක් පිරිසට අනුශාසනාකළේ 'භික්ඛවෙ සමග්ගා හොථ මා විවදථ' යනුවෙනි. මෙයින් අදහස් වන්නේ ඔවුනොවුන් විවාද කරගනිමින් වාද පවත්වමින් ක්‍රියා නොකළ යුතු බවයි. බුදුරජාණන් වහන්සේ එවකට සිටි රාජ්‍ය පාලකයින්ට අනුශාසනා කළේ ජනතාව සමඟ සමගිව පාලන කටයුතු සිදුකල යුතු බවයි. ශාක්‍යයන් අතර ජලය බෙදාගැනීම සඳහා ඇතිවූ කෝලහාලයක් සංසිඳවූ බුදුරජාණන් වහන්සේ සමඟිව කටයුතු කිරීමේ වැදගත්කම අගය කළ සේක.

අසමගිය සත්ව, මිනිස් යන දෙවර්ගයන්ගේම පරිහානියට හේතුවන බව බුදු දහමින් පෙන්වා දී තිබේ. 'වට්ටක ජාතකය' එබඳු තැනකට කදිම නිදසුනකි. බෝසතාණන් වහන්සේ වටු කුලයක ඉපිද තම වටු පිරිසට නායකත්වය දෙමින් ජීවත් විය. වටුවන් මරණ වැද්දෙකු ජීවනෝපාය සඳහා වටුවන් මරයි. තම පිරිස දිනෙන් දින අඩු වී යන බව දුටු වටුනායකයා (බෝසත් වටුවා) තම පිරිස කැඳවා උපදෙස් ලබාදුන්නේ වටු වැද්දා දූල දමූ කළ සමගියෙන් යුත්තව එය ඔසවාගෙන ගොස් ඈතට දමන ලෙයසි. වටුනායකයාගේ උපදෙස් පිළිගත් සෙසු වටු රැළ එලෙසින් ක්‍රියා කර ජීවිත බේරාගත්හ. මෙසේ කල් ගෙවන අතරෙදි වටුවන් දෙදෙනෙකු අතර ගැටුමක් ඇති විය. එය ඔවුන්ගේ සමගියට බාධාවක් වූ අතර, අනෙක් වටුවන් අතරේ භේදයක්ද හටගත්තේය.

දිනක් වටු වැද්දා වටුවන් අල්ලා ගැනීම සඳහා දූලක් දමීය. වටුවන් අතරේ අසමඟියක් ඇති වූ බැවින් වටුවැද්දා දමූ දූල එකතු වී ඔසවාගෙන නොගියහ. එම අවස්ථාවෙන් ප්‍රයෝජනගත් වටු වැද්දා දූල තුළ සිටි සියළුම වටුවන් අල්වාගෙන තම අභිලාෂය ඉටු කර ගත්තේය. ඉතා සුළු ප්‍රශ්නයක් නිසා (එක වටුවෙකු තවත් වටුවෙකුගේ පය පෑගීම) ඔවුනොවුන් අතර අසමඟිය ඇතිවීමෙන් සිදු වූයේ මහා විනාශයකි. එනම් වටුවන් සියල්ල මරණයට පත් වීමය. අසමඟි වූ භික්ෂු පිරිසක් උදෙසා බුදුරාණන් වහන්සේ මේ ජාතක කතාව දේශනා කළ සේක.

භික්ෂූන් වහන්සේලා පිරිසක් තුළ ඇති වූ කලහයක් හේතුවෙන් අසමගියක් ගොඩනැගීමෙන් පසු එම පිරිස දෙපිරිසක් බවට පත් වූහ. සමඟිවන ලෙසට එම දෙපිරිසට බුදුරජාණන් වහන්සේ අනුශාසනා කළ සේක. නමුත් එයින් ප්‍රයෝජනයක් නොවීය. ප්‍රායෝගික වශයෙන් අවබෝධයක් ලබාදීම සඳහා බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාගෙන් ඈත්වී පාරිලෙය්‍ය වනයට වැඩම කළ සේක. (10-වන වස්සාන සමය) ලිච්ඡවී රජ දරුවන් අනුගමනය කරන සප්ත අපරිහානි ධර්ම කරුණු අතරින් සමඟිව රැස්වීම, සමඟිව විසිර යෑම යන ප්‍රධාන කරුණු දෙක වැදගත් වේ. කිසිවෙකුට ලිච්ඡවී රජදරුවන් පරජය කිරීමට නොහැකි වන්නේ මෙම කරුණු අනුගමනය කිරීම නිසා බව බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. දම්සභා මණ්ඩපයේදී දේශිත ධර්මයන්ගේ අවසානයෙහි සමගිව වාසය කරමින් නිවන් මඟ සලසාගත යුතු බව 'සමග්ගානං තපො සුඛොති' යන දේශනාවෙන් පැහැදිළිකළ සේක. සමගිව කටයුතු කරන භික්ෂූන් වහ්නසේගේ ජීවිතය සාර්ථක වීමෙන් නිවන් මගට යොමුවන බව එයින් පැහැදිළි වේ. භික්ෂු සමාජයේ පමණක් නොව සෙසු සමාජයන්ගේද දියුණුව සැලසෙන්නේ සමගියෙන් යුක්තව ක්‍රියා කිරීමෙනි. බුද්ධකාලයේත් ඉන්පසුවත් ගිහි පැවිදි සමාජයේත් පරිහානියට පත්ව ඇත්තේ අසමගිය හේතුවෙන් බව කිවහැකිය. ශ්‍රී ලංකාවේ අතීතය දෙස බලන විට පැහැදිළිව දක්නට ලැබෙන්නේ අසමගිය හේතුවෙන් සතුරු බලවේග වලට ලක්දිව යටත් වීමට සිදුවූ බවයි. මෙරට ආක්‍රමණය කළ සොලී, පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රිසි ආදී පරසතුරන් ඉතාපහසුවෙන් බලය පතුරවාගනු ලැබුයේ එකළ විසූ ජනනායකයන් තුළ තිබූ අසමගිය නිසයි. බලලොභය නිසා ඔවුනොවුන් අතර විවිධ මත ගැටුම් ඇති විය. පිල් බෙදී කටයුතු කළ අතර එයින් සිදු වූයේ විදේශීය බලවේග සාර්ථක ලෙසින් මෙරට බලය ව්‍යාප්ත කරලීමය. මෙරට ස්වාධීනත්වයක් ගොඩ නැගුනේ සමගි සම්පන්නව ක්‍රියාකළ අවස්ථාවන්හීදී පමණි. තිස් වසරක කුරිරු ත්‍රස්ත්‍රග්‍රහණයෙන් ශ්‍රී ලංකාව බේරා ගැනීමට හැකි වූයේ රජයත් මහජනතාවත් ත්‍රිවිධ හමුදාවත් සමගිසාමදානයෙන් එකමුතු වී ක්‍රියා කළ නිසාය. එකම රටක වෙසෙන ජනතාව සැමවිටම සමගියෙන් යුක්ත වූ විට කිසිදු බලවේගයකට යටත් නොවනු ඇත.

සමගිවීමේ ඇති වටිනාකම අපට අවබෝධකර ගැනීමට නිතර දක්නට ලැබෙන මී මැස්සන්, වේයන්, කුහුඹුවන් වැනි කුඩා සතුන්ගේ ක්‍රියා කලාපයන් ප්‍රමාණවත් වේ. මෙම කුඩා සතුන් අලංකාර නිර්මාණයන් බිහිකරමින් ප්‍රයෝජනවත් ලෙස ක්‍රියා කරන්නේ ඔවුන් තුළ පවතින සමගි දහම නිසාමය.

දෙවන ලෝක සංග්‍රාමයේදී දරුණු ලෙස විනාශයට පත්වූ 'ජපානය' කෙටි කලකින් යළි ගොඩනැගුනේ එරට ජනතාව තුළ පැවති ජාතික සමගිය නිසාය. ලෝකයේ බොහෝ රටවල් දියුණු වී ඇත්තේද එම රටවල වෙසෙන ජනතාව තුළ පැවති සමගිය නිසායි. සමගිව කටයුතු කළහොත් සැම සතුරු බලවේගයක්ම පහසුවෙන්ම ජයගත හැකිය. බුදු දහම අනුව ක්‍රියා කරන අප සියළුම දෙනා සමඟිය නැමති මල්දම පළඳවාගෙන ජාතියත්, ආගමත් ආරක්ෂා කර ගනිමු. විවිධ මතභේද ඉවතලා ඒ සඳහා අදිටනින් යුක්තව කැප වෙමු. එවිට සැමට ජය නියතය.

**අජන්තා දිසානායක**

රංගිරි ශ්‍රී ලංකා
RSL NEWSPAPER

# සඳ සිසිල

සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.




## පන්සලයි පින් සතයි

සුදු වැලි අතුළ පන්සල් බිම පුරා රැඳී
දිදුලන සඳ කිරණ මිණි කැට සේම බැඳී
පිදු මල් සෙමින් පරවන සඳ පෙති ද සිඳී
බුදු හිමි නිසසලව අප දෙස බලා හිඳී

දළුලන බෝ පතක පහනක සිලක
නෙළුමක පිණි බිඳක තතු ඇත බණ පොතක
රළු නැති හදක සැනසුම වේ පුදසුනක
මුළු පින් බිමක සැදැහැති වත සමවතක

අහසට දිනිඳුමයි තෙද බල පතුරන්නේ
පවසට පැන් පොදයි අම දහරක් වන්නේ
මනසට දහමමයි පිළිසරණට එන්නේ
තපසට සති සිතයි මගඵල ලැබ දෙන්නේ

දිනුදා සිතත් කය වචනය සොඳින් මතු
පෝදා සඳුන් සුවඳ ද පින් සිතට නතු
කිසිදා නොම තැවී කඳුලින් තෙමා නෙතු
සැමදා එක ලෙසම තුන් දොර රැකිය යුතු

ඉසි කෝ මාන මද පව් ගති දුරලන්න
විසි කොට කෙලෙස් කුසලෙහි සිත පහදන්න
රිසි සේ නිවන් මග අසිරිය විඳගන්න
නිසි කල උදාවිය බවයෙන් සමුගන්න

දමයන්ති වීරසේකර
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

## සුබ පැතුම

තත්පරයෙන් තත්පරය
ගෙවී යයි කාලය
නොනැවතී ගලා යන
නදියක් සේ...
සිහිල් මද මාරුතය
සිඟිති මුදු දිය කඩිති
විටෙක සැඩ මාරුතය
චණ්ඩ දිය රළ පහර
හමුවේවි නැතිවම
වෙනසක් ඔබට මට...
ඉන් උගත් පාඩම්
මතක මං තලාවක ලියා තබමින් නැවත
ආවෙමු අපි
නවත් එක් නවාතැන් පොළකට...
දන්නවද...
ඒ...
ජීවිත ගමනකි...

මහව සිරිධම්මචාරී මෙහෙණින් වහන්සේ

## යථාර්ථය

පහළ වූදා පටන් මෙලොවට
වෙනස් වන කුණු කයක් අරගෙන
සසර ගමනක නතර වූ එක්
නවාතැන්පලකි මේ ජීවිතය...
පහළ වන හැමදෙයම
අනිසි බව කිය කියා
ළදරු විය. ළමා විය. තරුණ විය. මහලු විය
ගෙවා දමනා සෙමෙන්
සසර ගමනේ දුවන
ගමන් එක් නවාතැන් පලකි
මේ ජීවිතය....
විටෙක සොඳුරුයි විටෙක රුදුරුයි
විටෙක සියුමැලි විටෙක හැඩි දැඩි
කෂණ යකින් වෙනස් වන සිතක්
අරගෙන දුවන
සසර ගමනේ නතර වූ එක්
නවාතැන්පලකි මේ ජීවිතය...
ලබාගත් සියලු දෙය
හැරදමා නිහඬවම
මරණයෙන් නිමා වී
සසරටම යළි ඇදෙන
දිවිමගේ තවත් එක්
නවාතැන්පලකි මේ ජීවිතය...

ඇරැවුල පේමානන්ද හිමි
ශ්‍රී නිග්‍රෝධාරාම පුරාණ විහාරය

## මිනිස් ඉරණම

දිවි අතරේ හමුවන
තැවේ කිසිදා නොමැකෙන
සැම හදවත් තුල රැඳනා
ගලායන ජීවිත මං කතරේ
විඳිය යුතුම වේ...
නැතත් එය ජීවිතයක් නොවේ
සිතට දැනේ නොයෙක්
කල්පනා සයුරේ...
නමුදු එය මිනිස් ඉරණමකි
මෙලොවේ...
සැම හදවත් තුල රැව්දෙන
ජීවිත අර්ථය නොවැටහෙන
එක් මංපෙතකි
මෙය ලොවේ...
ආගම දම් අනුව
බුදුසමිඳුගේ ධර්මය අනුව
එක් කොටසක් වේය
මෙලොවේ...
සමිඳුනේ ඔබයි..
අප හදවත් තුළ
දුකින් මුදවා...
පහන් දැල්විය යුතු වන්නේ...

සෙනාලි මධුෂිකා

## බුදුපුන් වප්පිය උපහාර

මහවැලි කැළණි වලවේ කව ගංගානි
සම්බුදු ශ්‍රී පාද දෝසිං ඇදහැලුනි
දම්දිනු බෙංගමුවෙ නායක හිමි සඳුනි
සදහම් දියෙන් වප්පිය දාහය නිවනී

චංචලයි සිත චංචලයි ගත පහන් සිළුවේ රැශ්මි පාවී
අනියතයි ජීවිතය මලසුන මත පිදූ සුදු මල කියාවී
නිසසලයි කය දිනකදි මතු දැවී වැටි සඳුනෙන් පෙණෙවී
පන්සලයි ගත සිත නිවන තැන ගුණ සුපිවන මිනිසා රකිවී

දරන්නට සම්බුද්ධ සම්පිළි ගත වසා පෙරුමන් පුරාලා
රකින්නට තුන් සරණ මනසේ සිතුම්ණක් සේ බැතින් පුදලා
ගයන්නට ඇත උතුලෙ සතපා පුතුට සම්බුදු සරණ පතලා
පුදන්නට බුදු සසුන වෙත පුතු හතර වරිගෙම සුපිංකරලා

පිංසර බුදු පුතු දැඩි කරන්නට හෙලූ දහදිය නිව්යේවා
සංසාර සයුරට පීන පිනූ කඳුළු ගඟා සිඳියේවා
මං පාරනා රුදුන් කිසිදා පුතුනි දිවියට ලං නොවේවා
මං එතෙර වී එනතුරා පුත ඔබ එතෙර වී මම දකිවා

ගල්හේන්ගොඩ සුමනසිරි ගමනේ - ඌරුගමුව

## සසර

පෙර පින් බෙලෙන්ලත් ලද
මේ මිනිස්කම
වටිනා බව නොදැන් පතී ජනයා
සසර දුක් විඳින්නේ මැයි
නිවණ සැනසුමයි
එය ලැබගැනුමට
වෙර දරමු අපි සැවොම...!

චන්ද්‍රා - ගම්පහ

## රකිමු දිවි පූජාසනේ........

සිත් සතන් සනසා අපේ
මදනළත් පණිවිඩ ගෙනේ...
දම් පාසලින් නැණ ලබා
රකිමු දිවි පූජාසනේ....

ලෝකයම සනසනු හැකි
උතුම් බණ පදයක් වෙමු....
දැන ඉගෙන ගුණ දම් වඩා
ලොවට හිරු සඳු අපි වෙමු....

යශෝ ගී මල් පිබිද වූ
අතීතයේ ගීයක් වෙලා....
අපේ හෙළ ගති සදා සුරකිමු
ගුණෙන් සරු මිනිසෙකු වෙලා

එම්. සිරිධම්මාචාරි
මෙහෙණින් වහන්සේ
පොල්පිතිගම

## (පසුගිය කලාපයෙන් ඉතිරි කොටස)

"කොතරම් අගහිඟකම් තිබුණත් ආර්ථික අපහසුකම් තිබුණත් බෞද්ධ ජනයා විසින් බුදුන් වහන්සේ උදෙසා ආමිස පූජාවක් පැවැත්වීමත් භික්ෂු භික්ෂුණී යන සංඝයා වහන්සේලාටත් උපාසක උපාසිකා යන දෙපිරිසටත් රෝගී වූවන්ට දුගී මගී යාචකයින්ට සහ තිරිසන් සතුන්ටද වශයෙන් සහ තම මළගිය ඥාතීන්ට පිංපෙත් අනුමෝදන් කිරීමටද, නොයෙක් අවස්ථාවල විවිධවූ දානමය පිංකම් කරනු ඇත"

මීට ප්‍රථම කලාපය කියවා ඔබ යම් අවබෝධයක් ලබාගත්තා නම් ත්‍රිවිද දාන සම්පත්ති ගැන එකිනෙක මතකයට නැගෙනු ඇත.

රතන සූත්‍රයෙහි සඳහන් වන ආකාරයට "තෙ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා- ඒතෙසූ දින්නානි මහප්ඵලානි'' යනුවෙන් ප්‍රකාශ වන්නේ බුද්ධ ශ්‍රාවකයන්ට පිරිනමනු ලබන දානය මහත්ඵල ගෙන දෙන බවයි.

දක්ඛිණාවිභංග සූත්‍රයෙහි දානය පිළිගන්නා ප්‍රතිග්‍රාහකයන් ගැන කරන විස්තරයක පුද්ගලික දාන දාහතරක් සහ සඟසතුදාන හතක් වශයෙන් දේශනාකොට ඇත.

දානය

මීළඟට <u>සඟසතු දාන හත</u> ගැන ඔබට අවබෝධය



ලැබේවි.

1. බුද්ධ ප්‍රමුඛ භික්ෂු භික්ෂුණී යන උභතෝ සංඝයා වෙනුවෙන් දෙන දානය.
2. තථාගතයන් වහන්සේ

දියහැකි ක්‍රමය මේ ආකාරයට අටුවාව විස්තර කරයි.

භික්ෂු භික්ෂුණී සංඝයා දෙපස හිඳුවා මැද ධාතු සහිත ප්‍රතිමාවක් හෝ කරඬුවක් උස් අසුනක තබා සියළු පුදපූජා පැවැත්වීමෙන් එම දානය සිදුකළ හැක.

සංඝරත්නය වෙනුවෙන් දෙන දානයේ ගතවන වසර වලට අනුව දනය දීමටය.

සමහර අවස්ථාවලදී සාමණේර භික්ෂූන් වහන්සේලා වැඩිවශයෙනුත් මහ ස්ථවීරයන් වහන්සේලා නොලැබුණහොත් ඔබට සිතන්නට පුළුවන් මට ලැබුණේ සාමණේර වහන්සේලානේ කියා. එසේ

භික්ෂුවක් ලබාදුන්හ. එම උපාසක තෙමේ ගෙය මනා කොට සරසා ආසනයක් පනවා උඩුවියන් බඳවා සුවඳ මල් පුද පා සෝද තෙල් ගා බුදුරජාණන් වහන්සේට ගෞරව කරන්නාක් මෙන් සංඝයා කෙරෙහි ආදරයෙන් ගෞරවයෙන් දුෂ්ශීල භික්ෂුවට දානය පූජා කළේය.

එකී භික්ෂුව දන් වළඳ විහාරයට ගොස් නැවත සවස්භාගයේදී විහාරය පිරිසිදු කිරීම සඳහා උදැල්ලක් ඉල්ලාගැනීමට දන්දුන් උපාසකයා වෙත පැමිණියේය. එවිට උපාසක තෙමේ හුන් තැනින් නොනැගිට පයින්ම උදැල්ල තල්ලු කොට උදැල්ල ගන්නැයි කීය. භික්ෂුව උදැල්ල රැගෙන විහාරයට ගියේය. මෙම සිද්ධිය දුටු අසල්වැසි මිනිසුන් උපාසයාකගෙන් මෙසේ ඇසූහ.

පෙරවරුවේ මහත් ගෞරවයෙන් ගෙට වැඩමවා සියළු සත්කාරකර දන් වැළඳීමට සලසන ලද භික්ෂුවට පසුව මේ ආකාරයෙන් අවමන් කළේ ඇයිද?

උපාසක තෙමේ පින්වත්නි මා සත්කාර කළේ

# " සිල්වත් ගුණවත් උතුමන්ට දැහැමින් උපයාගත් දෙයින් දන් දෙන්න"

පුද්ගලික දාන දාහතර

1. සම්මා සම්බුද්ධ තථාගතයන් වහන්සේට දෙන දානය
2. පසේ බුදුරජාණන්වහන්සේට දෙන දානය
3. රහතන් වහන්සේනමකට දෙන දානය
4. රහත් මඟට පිවිසුන පුද්ගලයාට දෙන දානය
5. අනාගාමී පුද්ගලයාට දෙන දානය
6. අනාගාමී මඟට පිවිසුන පුද්ගලයාට දෙන දානය
7. සකෘදාගාමී පුද්ගලයාට දෙන දානය
8. සකෘදාගාමී මඟට පිවිසුන පුද්ගලයාට දෙන දානය
9. සෝවාන් පුද්ගලයාට දෙන දානය
10. සෝවාන් මඟට පිවිසුන පුද්ගලයාට දෙන දානය
11. ශාසනයෙන් බැහැර නිකලෙස් අයෙකුට දෙන දානය
12. පෘතජ්ජන සිල්වතෙකුට දෙන දානය
13. පෘතජ්ජන දුස්සීලයෙකුට දෙන දානය
14. තිරිසන් සතෙකුට දෙන

පිරිනිවන් පෑ කල්හි උභතෝ සංඝයා කෙරෙහි දෙන දානය

3. භික්ෂූන් වෙනුවෙන් දෙන දානය
4. භික්ෂුණීන් වෙනුවෙන් දෙන දානය
5. මෙතෙක් භික්ෂු භික්ෂුණී මට ලැබේවායි ආරාධනා කොට දෙන දානය
6. මෙතෙක් භික්ෂූන් ලැබේවායි ආරාධනාකොට දෙන දානය
7. මෙතෙක් භික්ෂුණීන් ලැබේවායි ආරාධනා කොට දෙන දානය

සඟසතු දානයෙහි බුද්ධ ප්‍රමුඛ උභතෝ සංඝයා යනුවෙන් හඳුන්වා ඇති පළමුවන සඟසතු දානයෙහි එක් පැත්තක භික්ෂු සංඝයාද අනෙක් පැත්තේ භික්ෂුණී සංඝයාද මධ්‍යයේ බුදුන් වහන්සේද වඩා හිඳුවා දෙන දානයයි. මෙය කියවන ඔබට මේ වනවිටත් ප්‍රශ්ණයක් පැන නැගී ඇත. මේ කාලේ අපි කොහොමද පළමුවැනි සඟසතු දනය පූජාකරගන්නේ කියලා.

බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ කල්හිද මේ පළමුවැනි සඟසතු දානය

" මම සංඝයා වහන්සේලා උදෙසා දානය දෙමියි සිතුවහොත් ඒ චේතනාවෙන්ම දානය දෙන්නේ නම් ඒ දානය සාංඝික දානයක්ම වන බව බුදුන් වහන්සේ වදාළ සේක "

අප්‍රමාණ අනුසස් ලැබෙන බව වදාළ බුදුරජාණන් වහන්සේ

මෙමෙ ස්ද

ප්‍රකාශ කොට වදාළ සේක. ආනන්දය පුද්ගලික දානයට වඩා හැම අතින්ම සඟ සතු දානය මහත්ඵල ඇත්තේ යයි මම ප්‍රකාශ කරමි"

මේ වස්සාන කාලය අවසාන වීමට ඇති ඉදිරිමාස වලදී ශ්‍රී ලංකාවේ සහ සෑම රටකම සිටින බෞද්ධ ජනයා කඨින පිංකම් සහ සාංඝික දාන පිරිනැමීමට මේ වන විටත් සූදනම් වනවා වියහැකියි. ඔබේ විහාරස්ථානයේත් මෙය සිදුවනවා ඇති. මෙවැනි පිංකම් වලදී සහ මළගිය ඥාතීන් උදෙසා කරන සාංඝික දානවලදී ඔබ ඔබේ විහාරස්ථානවලට ගොස් ආරාධනා කර සිටින්නේ වැඩි පුර භික්ෂූන් වහන්සේලා වැඩමවා ගැනීමට හෝ මිය ගිය ඥාතියා මිය ගොස් දනට

සිතා සිත දූෂ්‍ය වුවහොත් එය සාංඝික දානයක් නොවන බවත් මට ලැබුණේ මහා ස්ථවීර භික්ෂූන් යැයි උද්ධාමයට පත් වූවත් එයද සාංඝික දානයක් නොවන බවත් යම් භික්ෂුවක් සාමණේර නමක් හෝ උපසම්පදා භික්ෂුවක් හෝ බාලයෙක් පණ්ඩිතයෙක් හෝ විශේෂත්වයක් නොසිතා මම සංඝයා වහන්සේලා උදෙසා දානය දෙමියි සිතුවහොත් ඒ චේතනාවෙන්ම දානය දෙන්නේ නම් ඒ දානය සාංඝික දානයක්ම වන බව බුදුන් වහන්සේ වදළ සේක.

එයටම නිදසුන් කතාවක් අටුවාවෙහි මෙසේ සඳහන් වේ.


එක්තරා සැදැහැවත් උපාසකයෙක් සාංඝික දානයක් දෙන්නෙමෙයි සිතා විහාරයට ගොස් එහි සංඝ ස්ථවීරයන් වහන්සේගෙන් ස්වාමිනි, සාංඝික දානයකට එක් භික්ෂුවක් දෙනු මැනව"යි ආරාධනා කළේය. මහ තෙරණුවෝ ඔහුට දුෂ්ශීල

සංඝයාටය. මේ දුෂ්ශීල භික්ෂුවට නොවේ. යයි පිළිතුරු දුන්නේය. මෙයින් පෙනීයන්නේ සංඝයා කෙරෙහි හෝ පුද්ගලිකවම රහතන් වහන්සේ එක් නමකට හෝ දෙන දානයට වඩා මුළු මහත් සංඝයාම යැයි සිතා දුශ්ශීල භික්ෂුවක වූවත් දෙන දානයෙහි විශේෂ විපාක ඇති බවයි.

දක්ෂිණා විභංග සූත්‍රයෙහි බුදුරජාණාන් වහන්සේ විසින් දේශනා කරනලද දාන විශුද්ධි හතරෙන් පළමුවන විශුද්ධිය වන සිල්වත්වූ යමෙක් දැහැමින් ලද දෙය කම්ඵල අදහමින් දුෂ්ශීලයන්ට දානයක් දෙයිද ඒ දානය දායකයා නිසා පිරිසිදුවේ" මේ අනුවත් ඉහත උපාසකගේ දානය ඔහු නිසා පිරිසිදු වී ඇතිබව ඔබට වැටහෙනු ඇත.

උතුම්වූ ශීලයක පිහිටා අග්‍රවූ සංඝරත්නයට දන්දෙන්නාවූ නුවණැති තෙම දෙවියෙක්ව හෝ මනුෂ්‍යයෙක්ව ඉපිද සැපසම්පත් හා ලෝකෝත්තර ඵලයද ලබයි"

ලලිතා හෙට්ටිආරච්චි



# ජන සමාජය යහමඟට යොමු කිරීමට සඟරුවන පෙරමුණ ගත යුත්තේ ඇයි?

ඉක්මණින් නරකට පෙළඹෙන ජන සමාජය යහමඟට යොමු කිරීම පිණිස මහා සඟරුවන පෙරමුණගෙන ක්‍රියා කළ යුතු බවත් ජාති ආගම් කුලභේද අමතක කර දමා එක්සත්ව ක්‍රියා කළහොත් සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහිකර ගැනීම ඉතා පහසු බවත් ශ්‍රී ලංකා ජපන් මිත්‍ර සංස්කෘතික සංගමයේ අධ්‍යක්ෂ ජෙනරාල් පැල්පොල විපස්සී හිමියන් විසින්ද එදා කර ඇති ප්‍රකාශය ජනතා ප්‍රතිචාරය හිමිවිය යුතු කරුණකි.

අතීතයේ හැමවිටම භික්ෂූන්ගේ මඟපෙන්වීම රටටත් ජාතියටත් ශක්තියක් වූ බැව් ප්‍රකටය. එබැවන් අර්ථවත් හරවත් පදනමක් මත පිහිටා කටයුතු කිරීමට අප අදිටන් කරගත යුතුය.

අද වැනි ගැටළු බහුල සංකීර්ණ සමාජයක් ඉදිරියේ වඩාත් ප්‍රබල කැපවීමකින් යුක්තව සඟරුවන ඉදිරියට ආ යුතුය. එසේ එක් පෙරමුණකට ආ යුත්තේ සකලවිධ සමාජ ව්‍යසනයන්ටම විරුද්ධවය. සමාජයට එරෙහිව පවතින කෙබඳු හෝ ප්‍රබල තර්ජනයක් වුවද ධර්ම සංග්‍රාමයකින් මැඩලිය හැකි බැව් බුද්ධ දර්ශනය අනුව අප පිළිගත යුතුය.

විදේශීය හා දේශීය සමාජ සතුරන් බලවත් වන්නේ ජනතාව භේද බින්න වුවහොත් පමණි. සියලු ජනතාව භික්ෂු පරපුර සමඟ එකමුතුවීම නිසි ගමන් මඟට පිවිසීමක් බව කිව යුතුය. ජාතික සමඟිය, ආගමික සමගිය, දේශපාලන සමගිය අද ප්‍රබල ජාතික අවශ්‍යතාවයකි.

අද ලාංකීය සමාජය තුළ සැකය, බිය, අවිනිශ්චිතබව, අසමගිය වැනි රෝග ලක්‍ෂණ බහුලව ඇත. ත්‍රස්තවාදය, මත්උවදුර සමාජ සාරධර්ම නායයෑම වැනි උවදුරු වලට බියෙන් සමාජය හැරදා පලා යා යුතු තරමේ විපත්තියක් ඇතිව පවතින මේ මොහොතේ රාජ්‍ය පාලකයින්ටත් රටටත් ජනතාවටත් මගපෙන්වන්නා වියයුත්තේ භික්ෂු පරපුරටම යැයි අවධාරණයෙන් ප්‍රකාශ කළ යුතුව ඇත. සියලු විනාශයන්ට එරෙහිව නිවැරදි මාර්ගය හා බෞද්ධ ජීවන මාර්ගය තුළ අන්තර්ගතවී ඇති බැවින් සඟරුවන පොදු පෙරමුණකට පත් කිරීම ජාතික අවශ්‍යතාවයක් නොවේද?

ගරුතර මඩිහේ පඤ්ඤාසීහ නාහිමිපාණන් වහන්සේ සිංහල සමගිය ජාතියේ සමගියේ පදනම බැව් කීපවරක්ම ප්‍රසිද්ධියේ ප්‍රකාශ කොට ඇත්තාහ. කෙනෙකුට ඊ පහරක් වැදී අසාධ්‍ය වූ විටෙක පළමුව අවශ්‍ය වන්නේ ඊට වහාම බෙහෙත් ගල්වා ජීවිතය බේරා ගැනීම මිස ඊය ආවේ කොහි සිටද? එය සාදා ඇත්තේ කුමන රටකද? එය කවර වර්ගයේ ආයුධයක්දැයි පුහු තර්ක කරමින් සිට ලෙඩා මැරීයාමට සැළැස්වීම නොවේ යැයි උන්වහන්සේ උදාහරණ සහිතව පෙන්වා දී ඇත.

සියලු මිනිසුන්ට අවශ්‍ය ආහාර, ඇඳුම්, නිවාස හා සෞඛ්‍ය ගැන සාකච්ඡා කිරීමට පක්‍ෂ භේදය කුමටද? වර්ග භේදය කුමටද? මිනිසා උසස් වන්නේ නියම මිනිසෙකු වන්නේ ධාර්මික ක්‍රියාවෙන්ය. භේදය ධාර්මික නොව අධාර්මිකය. අධර්මය යම් තැනකද එතන භේදය ඇත. ධර්මය යම් තැනකද එතන භේදය නැත. සලකවිධ ජාතික දුර්භාග්‍යයන්ට එරෙහිව භික්ෂූ සමාජය නායකත්වයත්, පෙරමුණත් ගත යුත්තේය.

**රාණි ද සිල්වා**

# ධාර්මික රාජ්‍ය සංකල්පය

ධාර්මික රාජ්‍ය සංකල්පයක් ලෝකයා වෙත ඉදිරිපත් කළ ශ්‍රේෂ්ට ශාස්ත්‍රවරයා බුදුරජාණන් වහන්සේය. ඒ වෙනුවෙන් විවිධ සූත්‍රධර්ම දේශනාකර තිබේ. දීඝනිකායේ මහා ගෝවින්ද සූත්‍රයත්,අගඥ්ඥ සූත්‍රයත් චක්කවත්ති සීහනාද සූත්‍රයත් මේ අතර ප්‍රධාන තැනක් ගනී.

රාජ්‍ය සංකල්පය ගොඩ නැගෙන්නේ භූමිය එහි සම්පත් ජනගහනය යන කරුණු පදනම් කරගෙනය. රාජ්‍යයක් පාලනය කිරීමට ජනප්‍රධානියෙකු අවශ්‍ය විය. ජනප්‍රියත්වයට පත් වූ පුද්ගලයා ජනතාව විසින් ප්‍රධානියා ලෙස සම්මතකර ගනී.මෙය පාරම්පරිකව බලය ලබාගත් තැනැත්තාගෙන් තෝරා ගැනීමද සිදුවෙයි. රාජ්‍යනායකයා පාලකයාවන අතර ජනතාව පාලිකයන් බවට පත්වෙයි.මෙය රාජාණ්ඩු ක්‍රමයේ ලක්‍ෂණය වේ. පාලකයා සහ පාලිකයා අතර ඇතිවන ගැටලු විසදා ගන්නා ආකාරය පෙන්වා දෙන බුදුරජාණන් වහන්සේ සාකච්චාවෙන් සම්මුතියෙන් විසදා ගැනීමට උපදෙස් ලබාදුන් සේක.බුද්ධ කාලීන භාරතයේ එදා පැවැති ආණ්ඩු පිළිබදව සොයා බැලීමේදී දීඝ නිකායේ මහා ගෝවින්ද සූත්‍රයේ සදහන් වන්නේ ඉන්දියාවේ භූගෝලීය ලක්‍ෂණ අනුව බෙදා තිබූ ජනපද හතක් පැවැති බවයි. අන්ගුත්තර නිකායේ සදහන් වන්නේ ජනපද දහයකට බෙදා තිබුණු බවයි.මගධ,කෝසල,වත්ස,අවන්ති යන රාජ්‍ය ගණ තන්ත්‍ර,රාජාණ්ඩු ක්‍රම පැවැති බවයි. ලිච්ඡවීන් පරාජය කළ නොහැක්කේ ඔවුන් ආරක්‍ෂා කරන සප්ත අපරිහානිය ධර්‍මයන් නිසා බව බුදුරජාණන් වහන්සේ වදාළහ.මහා පරිනිර්වාණ සූත්‍රයේ එය මෙසේ විස්තර වේ.නිතර රැස්වීම සමගිව රැස්වීම,සමගිව විසිරයාම නොපැනවි නීති නොපැනවීමත් පනවල නීති කඩ නොකිරීමත්,ආගමික නායකයින්ගේ උපදෙස් පිළිපැදීමත් යන ප්‍රධාන කරුණු මෙයට අඩංගුවී තිබේ. මෙම අපරිහානිය ධර්‍මයන් ඕනෑම රාජ්‍ය නායකයෙකුට සාධාරණ වන බවද එම සූත්‍රයෙහි සඳහන් වේ.

''ධම්මිකො ධම්ම රාජා'' යන බුදු වදනින් පැහැදිලිකර ඇත්තේ රජතුමා දැහැමිව ක්‍රියාකළ යුතු බවයි.දස වැදෑරුම් සක්විතිවත් මෙයට ඇතුළත් කර තිබේ. දසරාජධර්‍මය අගතියෙන් තොරව ක්‍රියා කිරීමද දැහැමි රාජ්‍ය සංකල්පයට අදාලවන සේ දක්වා තිබේ.චන්දය,දෝෂය,භය,මෝහය සතර අගතියෙන් තොරව ක්‍රියා කිරීමේ ඇති වැදගත්කම විස්තර වේ.සතර සංග්‍රහ වස්තූන්ගෙන් යුක්තවීමද දැහැමි රාජ්‍ය සංකල්පයට ඇතුළත්වේ. දානය,ප්‍රිය වචනය,අර්ථ චරියාව සමානාත්මතාවය යන කරුණු සතර වේ.රාජ්‍ය පාලකයා තම රාජ්‍යතුළ දිලින්දන්ට අවශ්‍ය වන පරිදි ධනය ලබාදිය යුතුවේ.මෙම කරුණේදී ජනතාව අදහන සෑම ආගමකටම පොදුවේ ලබාදිය යුතු අතර වැඩි ජනගහණයක් අදහන ජනතාව වෙනුවෙන් වැඩි ප්‍රමාණයක් පරිත්‍යාග කිරීම සාධාරණ වේ. ''චක්කවත්ථි සීහනාද'' සූත්‍රයෙහි මේ ගැන විස්තර වේ.

රාජ්‍ය පාලකයා ජනතාවට ප්‍රියමනාවන පරිදි ඇමතීම කළ යුතුවේ. පැරණී රජවරු ජනතාව වෙනුවෙන් කැපවීම සිදුකර ඇති බව ඉතිහාසගත තොරතුරුවල සඳහන්වෙයි. දුකට පත්වූවන් තම රාජසභාවට කැඳවා විසඳුම් ලබාදුන් අවස්ථාවද දක්නට ලැබේ. ලංකාවේ දුක් විමසා බලා එයට පිළියම් යෙදූ බවයි.අර්ථචරියාව යන්නෙන් විස්තර වන්නේ ජනතාවට සෙත සැලසෙන පරිදි ක්‍රියා කිරීම වේ. ජනතාවගේ ආර්ථික දියුණුව ලඟාවෙන පරිදි පාලන තන්ත්‍රය සකස් කිරීම රාජ්‍ය පාලකයා සතු දැහැමි රාජ්‍ය සංකල්පයකි.තම රාජ්‍යය තුළ ජීවත්වන ජනතාවට සමාන ලෙස සැලකීම රාජ්‍ය පාලකයා සතු දැහැමි ක්‍රියාවලියකි.පක්‍ෂග්‍රාහි නොවී මැදිහත් බවින් යුක්තව කටයුතු කිරීම මෙයින් අදහස් කෙරේ. ''අග්ගඤ්ඤ සූත්‍රයේ''ද දැහැමි රාජ්‍ය පාලන සංකල්පයේ උච්චතම අවස්ථාව වන්නේ ''චක්‍රවත්ති'' රාජ්‍යත්වයයි.මේ තත්වයට පත් වූ රාජ්‍ය පාලකයාට ''රත්නයන්'' පහළවන බව සඳහන් ඇත.

චක්‍රවර්ති රාජ්‍යයන් ලබාගත් රජතුමා (පාලකයා) මියගියවිට ස්තූපයක් ගොඩ නැගීමට පවා යෝග්‍ය වන බව බුදු දහමෙහි සඳහන් කර තිබේ. රාජ්‍ය පාලකයා පරමාදර්ශී කෙනෙකු වියයුතු බව සඳහන් වෙයි. රාජ්‍යයක ජීවත්වන ජනතාව රාජ්‍ය පාලකයා දෙස විමසිලිමත්ව බලාසිටීම සාමාන්‍ය දෙයකි. එබැවින් බුදු දහමට අනුව ''දැහැමි රාජ්‍ය'' සංකල්පයට අනුව ක්‍රියා කිරීම රජුගේත් රාජ්‍යයේ වෙසෙන ංනතාවගේත් සුභ සිද්ධියට හේතු වන්නේය. දැහැමි රාජ්‍ය සංකල්පයෙන් බැහැර ක්‍රියාකිරීම රජුගේත් (පාලකයාගේත්) පිරිහීම සිදුවන්නේය.එමෙන්ම ජනතාවත් පිරිහීම සිදුවන්නේමය. එවිට රාජ්‍යයේ පිරිහීම අනිවාර්‍යයෙන්ම සිදුවීම වැළැක්විය නොහැකිය. අප ප්‍රාර්ථනාකළ යුත්තේ ''රාජාභවතුධම්මිකො'' රජු දැහැමි වේවා....

**ඇම්.ඩී. විජයවර්ධන**
**තලවත්තේගෙදර**

සාමාවතී, ඛුජ්ජුත්තරා සහ මාගන්ධියා චරිත ඇසුරිනි

# රැදුරු දිවිමඟ සොඳුරු කරවන අමා දම් දිව ඔසු

**අප සියල්ලෝම කරන්නාවූ සියළු පින්, පව් කරත්තය බැඳි ගොනුන්ගේ පා අනුව යන්නාවූ කරත්ත රෝද මෙන්ද, අප යන එන සියළු තැන්හී අප නොහැර යන සෙවනැල්ල මෙන්ද අප පසුපසින්ම එන්නේය**


කිසිවෙකුත් සසරෙහි දුක් විඳින්නට කැමති නැත. අපාදුක් විඳින්නටනම් කොහෙත්ම අකමැතිය. අපා දුක් විඳිනු තබා අපාය ගැන ඇසීමටද අකමැතිය. එහෙත් එයින් මිදීම සඳහා නොකළයුතු දේ ද අප නොදනිමු. දෙව් මිනිස් සැප ලැබීමට කළයුතු කම් ද අප හරියට නොදනිමු. අප මරණින් මතු යන්නේ කොතැනකටද කියා සිතීමට තබා මේ අප ගෙවන ජීවිතය ගෙන යන්නේ කොතැනකටද? මා යනු කවරෙක්ද? මා කළ යුත්තේ නොකළයුත්තේ මොනවාදැයි කියා හෝ ඔබ දන්නේ නැත. සමාජයේ කාලයෙන් කාලයට එන විලාසිතා අනුගමනය කරමින් එන සමාජ රැල්ල දිගේ ගසාගෙන යයි. එබැවින් ඔබට යායුතු තැනට යාමට ශක්තියක් නැත.

බුදු දහම වනාහී යන රැල්ලට යන්නාක් නොව 'පටිසෝතගාමී' ප්‍රතිපදාවකි. එනම් පසුපසින් හඹාඑන පීඩනයට හසුව ගඟ දිය ගලන්නාක් මෙන් ඉදිරියට තල්ලුවෙමින් අනන්ත සසරේ දුක් විඳිමින් නොඇවිද ප්‍රඥාව යොදා ගනිමින් අපාදුකට පත්නොවන සසර නිමා කරන අරි අටගි මඟ හෙවත් මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කළ යුතුය.

මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කරන්නට මත්තෙන් ඔබ ඔබගේ ජීවිතය සතර අපායෙන් තිරිසන්, ප්‍රේත, අසුර නිකායෙන් වලකාගෙන මේ මනුෂ්‍යත්වය ආරක්‍ෂා කරගත යුතුය. ඒ සඳහා අකුසලයෙන් පාපයෙන් තොර කුසලයෙන් පිනින් පිරිපුන් ජීවිතයක් ගත කළ යුතුය.

එම ජීවිතය සකසා බුද්ධ කාලීන උපාසිකා චරිතයක් උපයෝගී කරගනිමු. සම්බුදු පියාණෝ දිවමන් අවධියේ භද්‍රවතී නුවරට අහිවාතක නම් බෝවන රෝගයක් විය. මෙම රෝගය යම්කිසි නිවසකට පැමිණිය හොත් ගස්කොළ සතා සිවුපාවගේ පටන් සියළු දෙනා මරණයට පත්වන්නාහ. රෝගය හඳුනාගත් යමෙක් ගෙයි බිත්ති සිදුරු කොට පලාගියහොත් මරණයෙන් බේරිය හැකිය. භද්‍රවතී මැඳුරටද මෙම රෝගය පැතිරුණි. සිටුතුමා සිය බිරිඳ හා දියණියද කැටුව ගෙයි බිත්ති සිඳ නුවරින් නික්ම කොසඹෑනුවර විසූ ඝෝෂක නම් සිය මිතුරු සිටුතුමන් වෙත යෑමට පිටත් විය. දින කීපයක් පුරා පාගමනින් ගමන්කළ මොවුහු කොසඹෑ නුවරට පැමිණියහ. ගමන් විඩාවෙන් පසුවුණ ඔවුහු අපවිත්‍ර ඇඳුම් සේදා නා පිරිසිදුව මිතුරා හමුවීම සුදුසු බැවින් අම්බලමක නැවතී නා පිරිසිදුවී මිතුරා හමුවීම සුදුසු බැවින් අම්බලමක නැවතී ඝෝෂක සිටුතුමන් අසරණයන් උදෙසා ආහාර දෙනු ලබන දන්හලකින් ආහාර ගෙන අනුභවකිරීමට සිතීය. එසේ සිතා සිය දියණියන් දන්හලට යැවීය. ලැජ්ජාවෙන් මිරිකෙමින් දන්හලවෙත ගිය භද්‍රවතී සිටු කුමරිය තුන්දෙනෙකු සඳහා ආහාර ගෙනවිත් මව් පියන්ට දුනි. බොහෝ දිනකට පසු කුස පුරා ආහාර ගත් බැවින් පළමු දින සිටුතුමාද, දෙවන දින සිටුදේවියද කළුරිය කළහ. තෙවන දින එක් අයෙකුට පමණක් ආහාර ගනු දුටු මේ යෞවණිය කවරෙක්දැයි දන්හල් හිමියාට විමසන්නට සිතුනි. ඇගෙන් තතු විමසීමෙන් අනතුරුව දන්හල් හිමියා කුමරිය සිය නිවසට ගෙන ගොස් දියණියක සේ ඇති දැඩි කළේය.

මේ කුමරියට සසර යම් අකුසලයක් තිබූ බැවින් මෙසේ මව්පියන් අහිමි වුවද, කරතිබූ පුණ්‍ය මහිමයෙන් කාරුණික පියෙක් වහා ලැබගති. ඇය සසර කර තිබූ පින්මහිමයෙන් රූප සම්පත්තිය, කුල සම්පත්තිය පමණක් නොව ප්‍රඥා සම්පත්තියද නොඅඩුවම ලබා තිබුණි. පියා සමඟ දන් හලට පැමිණි ඇය දන්හලේ දිනපතා ඇති කෝලාහලය දක්නට ලැබුණි. එනම් දන් ලබන්නට එන අසරණයින්ට ඇතුල්වීමටත්, පිටවීමටත් තිබුණේ එකම දොරටුවක් බැවින් නිතර ඔවුහු කෝලාහල කරගනිති. එබැවින් ප්‍රඥාවෙන් යුතු මෙම කුමරිය මේ කෝලාහලය නතර කිරීම පිණිස පියතුමාට උපදෙස් ලබාදුණි. එනම් මේ මහා දොරටුව එක් අයෙකුට පමණක් ඇතුල් වීමට සලස්වා පිටවීමට අනෙක් පසකින් දොරටුවක් තබන ලෙසය. මෙම උපදේශය පිළිපැදීමෙන් දන්හලේ වසර ගණනාවක් තිබූ කලබලය ඝෝෂාව නිමා විය. සාමය සතුට ඇති විය. එබැවින් මෙම කුමරියට 'සමාවතී' යැයි නම් කළහ.



“ කිසිවෙකුත් සසරෙහි දුක් විඳින්නට කැමති නැත. අපාදුක් විඳින්නට නම් කොහෙත්ම අකමැතිය. අපා දුක් විඳිනු තබා අපාය ගැන ඇසීමටද අකමැතිය. එහෙත් එයින් මිදීම සඳහා නොකළයුතු දේ ද අප නොදනිමු. දෙව් මිනිස් සැප ලැබීමට කළයුතු පිංකම් ද අප හරියට නොදනිමු ”

දන්හලේ නිශ්ශබ්දතාවය නිසා දන්නොදෙන්නේ දැයි ඝෝෂක සිටුතුමාට සැකයක් ඉපිද ඒ පිළිබඳව දන්හල් හිමියාගෙන් අසා සාමාවතී කුමරියගේ ප්‍රඥාවෙන් දන්හලේ සාමය ඇති වූ බවත් මේ කුමරිය මිතුරු භද්‍රාවතී සිටුගේ දියණිය බව දූන සිටු මැඳුරට ගෙන්වා ඝෝෂක සිටුතුමාගේ දියණිය ලෙස එතැන්පටන් වාසය කළාය.

තමා කළ පින කිසිවෙකුටත් කිසිම හේතුවකින් නවතාලිය නොහැක. ඝෝෂක සිටු මැඳුරේ මහා සම්පත් විඳිමින් හැදෙන වැඩෙන මේ රූමත් ප්‍රඥාවන්ත කුමරිය ගැන දූනගන්නට ලැබුණු උදේන රජතුමා ඈ රජමැදුරට ගෙන්වා කුමරියන් පන්සියක් පිරිවරකොට අගමෙහෙසුන් කළාය.

මෙසේ රාජ අගමහේෂිකාවක් වීමට, රූප සම්පත් ලැබීමට, ප්‍රඥාවෙන් යුක්ත වීමට, නිරෝගි බව ලැබීමට රාජ යස ඉසුරු ලැබීමට ඈ සිදුකළ පිංකම් මොනවාද?

බුදු, පසේබුදු, මහරහතන් වහන්සේලා උදෙසා ඉතා ශ්‍රේෂ්ඨ ආකාරයෙන් අග්‍රකොට දානාමානාදිය, සිවුරු පිරිකර, බෙත්හේත් පූජා කිරීමටත් රෝගීන්ට උපස්ථාන කිරීමටත් ගරු කළ යුත්තන්ට ගරු කිරීමටත් මව්පියන්ට සුවච කීකරු වීමත්ය.

එහෙත් වත්මන් යුගයේ රැල්ලට ගසාගෙන යන ඔබ ඔබට නැති රූප සම්පත ලබාගැනීම සඳහා විවිධ උපක්‍රම, ආලේපන, ඖෂධ සෙවීමට වෙහෙසෙති. තමාට ගැලපෙන, නොගැලපෙන විවිධ ඇඳුම්, පැළඳුම් සෙවීමට අධික ලෙස මුදල් සොයති. ඒ සඳහා වෙහෙසෙති. මේ සෙවීම පිළිබඳ ඔබේ සිතට සහනයක් නැත. නැවත නැවත තව තවත් දේවල් සොයති. ඒ සඳහා වෙහෙසෙති. මේ සෙවීම පිළිබඳ ඔබේ සිතට සහනයක් නැත. නැවත නැවත තව තවත් දේවල් සොයති. මෙහි කෙළවර වන්නේ විවිධ රෝග පීඩාවන්ට ගෝචර වී මරණයට පත්වීම පමණි. ඒ හිස් මරණයෙන් පසු නැවත ඔබට යහපත් මනුෂ්‍ය ජීවිතයක් නැත. මනුෂ්‍ය ජීවිතයක් ලැබුණත් රුව,ණැන,ගුණ ලැබීමට ඔබ කළ පුණ්‍ය කර්මයක් නැත. එමනිසා ඔබට අවශ්‍ය කරන ලෞකික ලෝකෝත්තර සම්පත් ලබාගැනීම පිණිස උසස් මනසක් ඇති මිනිසුනි ඔබේ ප්‍රඥාව පුබුදුවා කළ යුතු යහපත් දේ සිදු කිරීමට වහා උත්සුක වන්න. නැතහොත් සිදුවන්නේ කුමක්දැයි සමාවතී චරිතයෙන්ම අවබෝධ කරගන්න.

මෙසේ උදේන රජුගේ අගමෙහෙසුන්ව රජුගේ සිත් දිනාගනිමින් රාජ සම්පත් විඳිමින් ගත කළ සාමාවතී ඇතුළු මේ බිසෝවරු පන්සිය එක් දෙනාට සසරෙහි කර තිබූ තවත් පුණ්‍යකර්මයක් විපාකදීමේ කාලය එළඹිණි. එනම් ලොව්තුරු අමා දහම පානය කොට මාර්ගඵල ලැබීමයි.

15 පිටුවට...

ඉතිරි කොටස ලබන කලාපයෙන්..

පූජ්‍ය වත්තේගම කුසලධම්මා මෙහෙණින් වහන්සේ


බෞද්ධ සාහිත්‍යයෙන්
1
ථේරී ගාථා ඇසුරෙනි
සැකසුම හා චිත්‍ර...
භද්‍රා කුණ්ඩලකේශී
අප සම්මා සම්බුද්ධ පියාණන් වහන්සේගේ කාලයේ.. භද්‍රාවෝ දඹදිව උසස් සිටු කුළයක.. උපත ලැබීය....! භද්‍රාගේ පියා එනුවර ධනවත් වෙළඳ.. සිටුවරයෙකි..... ඔහු එනුවර වෙළඳ කටයුතු වලින්... බොහෝ ධන සම්භාරයක් උපයා ගත්තේය
සැප සම්පත් වලින් පිරුණු සිටු පවුලක සිටු දියණිය ලෙස උපදුන "භද්‍රා" වන් හට .... ..කුඩා කල සිටම ...හිමිවූයේ..... ...යස ඉසුරින් ..පිරි... ජීවිතයකි

රංගිරි ශ්‍රී ලංකා
RSL NEWSPAPER

වප් අතිරේකය

සුභාවිත ගීයක ලස්ස මිහිර



# තෙලිතුඩක් නැති සිත්තරාවිය

# අම්මේ ඔබයි....



තෙලිතුඩක් නැති සිත්තරාවිය
නුඹ මගේ රුව මුලින් සිතුවම් කළයි
අතපය තනා පිරියම් කළෙත්
මෙවලමක් නැති වුව නුඹ තමයි
මහබඹු නොවේ අම්මේ නුඹයි.....

ඇළ දොලේ ගහ කොළේ හුස්මගෙන හදවත පණ පෙව්වා වාගෙයි
මල් සුවඳ සේ ඉව පවා මසිතට දුන්නයි
කවි නොලීවද කිවිඳායක සේ කවි ගීත මුවගට හුරු කළයි
මහ බඹු නොවේ අම්මේ නුඹයි....

ඔසුවකුදු නැති වෙදැදුරිය රෝ දුක් නසා හැදු හැටි අගෙයි
රැකවලෙකු නැති රන් රුවන් ගෙයි ඇති දැඩි කළා පුදුමත් හිතෙයි
දස මසක් මේ විස්කම් කළේ මහබඹු නොවේ අම්මේ නුඹයි
මහ බඹු නොවේ අම්මේ නුඹයි....

**ඇගේ සිතුවිලි සිත්තමට ජීවිය ලබාදුන්නේ ඇළ දොළේ ගහ කොළේ පිරිසිදු හුස්ම පොද තම සිරුරට ලබා ගනිමිනි. මා නිරෝගී වන්නට ගත යුතු ආහාර මොනවාද අත් හල යුතු ආහාර මොනවාද යන්න ඇය මැනවින් දැන සිටියාය**

ගේය පද :- රත්න කේ ප්‍රේමසිරි
තනුව හා සංගීතය :- නිලන්තසිරි පතිරණ
ගායනය :- ප්‍රේමවර්ධන කපුගේ

"අම්මා" යන වචනය ඇසෙත්ම අපේ සිතට දැනෙනුයේ වචනයෙන් විස්තර කළ නොහැකි සැනසුමකි. අම්මා ජීවත් වන තාක් අප මෙලොව හුදෙකලා වන්නේ නැත. ඈ සතු අපරිමිත දරු සෙනෙහස කරුණාව, දයාව හමුවේ අපි හැමදාමත් නොදරුවන්ය.

මගේ දෙඇස, නාසය, කණ, මුව, අත් පා ආදිය අම්මාගේම නිර්මාණයකි. කුඩා කළලයක්ව ඈ කුස පිළිසිඳ ගත් දින සිටම මගේ රුව කෙසේ විය යුතු දැයි අම්මා සිතුවිලි රූ මැව්වාය. ඒ සිතුවිලි රූ කිසිදු මෙවලමක් නැතිවම සජීවී ප්‍රතිමාවක් බවට පත්කළාය. තෙලි තුඩක් නොමැති වුව ඈ කළ සිතුවිලි සිත්තම අතිවිශිෂ්ට නිමැවුමකි.

ඇගේ සිතුවිලි සිත්තමට ජීවිය ලබාදුන්නේ ඇළ දොළේ ගහ කොළේ පිරිසිදු හුස්ම පොද තම සිරුරට ලබා ගනිමිනි. මා නිරෝගී වන්නට ගත යුතු ආහාර මොනවාද අත් හල යුතු ආහාර මොනවාද යන්න ඇය මැනවින් දැනසිටියාය. ඉතා අරපරෙස්සම් සහිතව තම සිතුවිලි සිත්තමේ මැවුණු දරුවාට ජීවය ලබාදෙන්නට ආහාර පාන පිළිවෙත් ආදිය කළාය.

ඇයට කවි ලියන්නට නොහැකි වුව පාරම්පරිකව පැමිණි කවි ගයමින් විටෙක මුමුණමින් කුස තුළ සිටම ඈ කවි ගීත හුරු කළාය. වෛද්‍යවරියක නොවුනද කුස තුළ සිටි මා නිරෝගීව, බුද්ධියෙන් නුවණින් මෙන්ම ශාරීරිකවද අඩුපාඩුවක් නොමැතිව තැනුවාය.

අම්මාගේ කුස නම් රුවන් ගෙයි ලා කිසිදු අතුරු අන්තරාවක් නොමැතිව මා රැක ගත් අයුරු පුදුම සහගතය.

අම්මාගෙන් ජීවිතය ලැබ මෙලොවට මා බිහි වන විට එය අරුමයක් ලෙස පෙනෙයි. ගුණ නුවණින් පිරිපුන් නිරෝගී දරුවෙකු තැනීම අම්මා විසින් කළ විස්කමකි.

මිනිසා ඇතුළු ජෛව ලෝකය මහ බඹුගේ මැවීමක් ලෙස වේද ග්‍රන්ථවල සඳහන් වේ. එහෙත් චාල්ස් ඩාවින් මැවුම් වාදය අසත්‍යක් බව විද්‍යාත්මකව ඔප්පු කළේය. ඩාවින්ට පෙර මහ බඹුගේ මැවුම්වාදය අසත්‍යක් බව ප්‍රකාශ කළේ සම්මා සම්බුදුරජාණන් වහන්සේය.

අනෙකුත් සතුන් බිත්තර මඟින් පැටවුන් බිහිකරද්දී මිනිසා ඇතුළු ක්ෂීරපායින් දරුවන් තම කුස තුළ වර්ධනය කර පෝෂණය කර මෙලොවට බිහි කරයි. බිත්තර වලින් පැටවුන් බිහි කරද්දී එම සතුන්ට තම පැටවුන් උවදුරු රැසකින් අරක්ෂා කරන්නට සිදු වේ. බිත්තර වලට නිසි උණුසුම ලබා නොදුන හොත් ඒවා පුපුරා විනාශ වෙයි. මාංශ භක්ෂක සතෙකුට හමුවුවහොත් මේ බිත්තර ගිල දමනු ලබයි. මේ නිසා කුස තුළ තම දරුවන් වර්ධනය කිරීම වඩාත් දියුණු ආරක්ෂක පියවරකි.

වෙනත් සතුන් තම පැටවුන් කුස තුළ තබාගෙන වැඩුණු පැටවෙකු මෙලොවට බිහි කළද ඒ පැටවා මවගෙන් යැපෙන්නේ ඉතා ස්වල්ප කාලයකි. එහෙත් මිනිස් ළදරුවාට ස්වාධීන වන්නට බොහෝ කාලයක් ගත වෙයි. මවගේ කිරෙන් මාස ගණනාවක් පොෂණය වන ළදරුවා සිනාසීම, පෙරළීම, ඇවිදීම කතාබහ කිරීම සඳහා වසර කීපයක් ගත වේ.

ළදරු අවධිය පසු කොට පාසල් අවධියටත් ඉන්පසු තුරුණු වියට එළඹී විවහාවනතුරු ද මිනිසා තම දෙමාපියන්ගෙන් යැපේ. බිළිදා පරිපූර්ණ මිනිසෙකුව සමාජයට පිවිසෙන තෙක් සසමාජානුයෝග කාර්යයෙහි වැඩි වගකීමක් දරන්නේ අම්මා විසිනි. ගීතයේ කියවෙන පරිදි මේ සමාජානුයෝජන කාර්ය අම්මා අම්මා ආරම්භ

කරන්නේ තම දරුවා මව් කුස තුළ සිටියදීය. තම දරුවා අනාගතයේ යහගුණ දම් පිරි දක්ෂ දරුවෙකු වනු සිතින් දැකීමෙන් ඒ සිතුවිල්ල කුසෙහි වැඩෙන දරුවාගේ මනසෙහි තැන්පත් වේ. මෙලොවට බිහි වූ දරුවා සිතන්නේත් ක්‍රියා කරන්නේත් කුස තුළ සිටියදී මවගේ සිතුවිල්ලක්ව තම මනසේ තැන්පත් වුණු අරමුණු අනුවය. තිලොවට නායක වූ අසම සම වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේ මෙලොවට බිහි කළේ මහාමායා නම් මැණියන් වහන්සේ විසින්ය. බෝසතාණන් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පිරූ පාරමී වලට අමතරව මැණියන්ගේ සිතුවිලිද අසම සම පුරුෂයෙකු තැනීමට හේතු වන්නට ඇත.

අම්මා" මේ තරම් විස්කම් රැසක් සිදු කර තිබියදීත් අප මැවූයේ මහ බඹු විසින් යැයි පැවසීම කෙතරම් අඥාන කමක්ද? අම්මාගේ ගුණස්කන්ධය මැනවින් අවබෝධ කළේ බුදු රජාණන් වහන්සේය. දෙවෙනි බුදුවරයෙකු ලෙස අම්මාට ගරු බුහුමන් කළ යුතු බව දේශනා කළේ ඒ නිසාය.


විද්වතුන් අම්මා" සහ අම්මාගේ ආදරය පිළිබඳ කෙතරම් අර්ථදැක්වීම් ඉදිරිපත් කළද මවගේ ගුණස්කන්ධය කියා නිම කළ හැකි කිසිවෙකුත් ලොව නැත.

රත්න කේ ප්‍රේමසිරි ''මව් ගුණ'' සිය පදරචනයට යොදාගන්නේ මෙතෙක් සාකච්ඡාවට බඳුන් නොවූ වෙනස්ම දෘෂ්ඨී කෝණයකින් බලමිනි. නිලන්තසිරි පතිරණගේ තනුව හා සංගීතයට අනුව සිය හඬ මුසු කරන ප්‍රේමවර්ධන කපුගේ අම්මා" පිළිබඳ වූ ගෞරවය සියදහස් ගුණයකින් වැඩි කරවයි. අම්මා කෙරෙහි වූ ස්නේහය දයා බවද තීව්‍ර කරවයි.

චාමිකා ජනානි ද සිල්වා

## පල්ලව සම්ප්‍රදය දැක්වෙන ලක්දිව එකම පුදබිම

# නාලන්ද ගෙඩිගෙය



නාලන්ද ගෙඩිගේ නමින් හැදින්වෙන ශිලාමය බුද්ධ මන්දිරය පුරාවිද්‍යාඥයින්ගේ හා ඉතිහාසඥයින්ගේ දැඩි අවධානයට ලක්වූ ස්ථානයකි. අද්විතීය සණයේ ප්‍රතිමා මන්දිරයක් වූ නාලන්ද ගෙඩිගේ විහාරය කවර වකවානුවක, කවරෙකු විසින් නිර්මාණය කරන ලද්දක් දැයි දැනගැනීම උගහටය. මෙම නිර්මාණය පිළිබඳව ලබාගත හැකි සෘජු ඓතිහාසික මූලාශ්‍ර නැතැයි කිවයුතු තරම්ය.

දකුණු ඉන්දියාවේ පල්ලව නිර්මාණවලට නෑකම් කියවෙන 'ගෙඩිගේ' මන්දිරයේ වාස්තු විද්‍යාත්මක ලක්‍ෂණ හා මෙම ස්ථානයෙන් සොයාගන්නා ලද එකඳු ශිලා ලිපියෙන් නාලන්දේ පැරණි සිද්ධස්ථානය පිළිබඳව කරුණු හැදෑරීමට ඉවහල් වී ඇත. ලංකාවේ මුල්ම පුරාවිද්‍යා කොමසාරිස් වූ එච්.සී.පී. බෙල් මහතා නාලන්ද පිළිබඳව මෙසේ ප්‍රකාශ කරයි.

"නාලන්ද ගෙඩිගෙය නොසළකා හරින ලදුව පිහිටුවා ඇති අතර කලාතුරකින් පමණක් මෙහි පැමිණෙන නරඹන්නෙකුගේ නෙතට ලක්වන්නේ එහි නිර්මාණය පිළිබඳව වාර්තාගත තොරතුරකින් හෝ සාම්ප්‍රධායික ජනවහර තුළින් හෝ හැඟීමක් පවා අප තුළ ඇතිකරන්නට අසමත්ය"

අනුරාධපුර සමයේ අවසාන භාගයේ දී නිමවන ලද බවට සාධක ඇති ඇලහැර, මැණික් දෙන ආදී බෞද්ධ ආගමික ස්ථානවලට සමීපව පිහිටීමට හේතු කොට ගෙන එක් නිගමනයකට

එලඹිය හැකිය. එනම් අදාළ වකවානුව තුළ සැළකිය යුතු බෞද්ධ ආරාමයක් වශයෙන් නාලන්ද වැදගත් ස්ථානයක් උසුලන්නට ඇති බවයි. ක්‍රි.ව. 9-10 සියවස් වලට අයත් සේ සැළකිය හැකි ටැම් ලිපියේ සඳහන් යම් යම් කරුණු වලින්ද ඒ බව සනාථ වේ. මෙහි වැඩි කොටසක් මැකී ගොස් ඇත මෙම ලිපියෙහි නොනිසි ලෙස විහාර කාර්මිකයන් විසින් භූමියෙන් නෙරපිය යුතු බවත්, සොරුන් මිනී මරුවන් වැන්නන් විහාරස්ථානයට ඇතුල් නොවිය යුතු බවත් ආරාමය පිළිබඳ වූ සියළු කටයුතු සංඝ සම්මුතියෙන් කළ යුතු බවත් මෙහි සඳහන් වේ. ඓතිහාසික හේතු කිහිපයක් නිසාම නාලන්දාව ලංකා ඉතිහාසයේ සුවිශේෂී ස්ථානයක් සේ සැළකේ. ක්‍රි.ව.7 වෙනි සියවසට අයත් ඉන්දීය මහාබලිපුරම් පල්ලව ගෘහ නිර්මාණ සම්ප්‍රදයේ අංග ලක්‍ෂණ වලින් යුක්තව ශ්‍රී ලාංකාවේ ශේෂව පවත්නා එකම බුද්ධ ප්‍රතිමා මන්දිරය මෙය වේ. අනෙක් කරුණක් නම් එක් අතෙකින් ථෙරවාද හා මහායාන වලඇදහිලි සම්බන්ධයක් බෞද්ධ හා හින්දු ආගම් වල සන්කලනයක් දක්නට ලැබෙන ස්ථානයක් වීමයි. දැනට විද්‍යාමාන පුරාවිද්‍යා සාධක වලින් පැහැදිළි වන්නේ ගෙඩිගේ නමින් හැදින්වන මෙම ප්‍රතිමා මන්දිරය 8 වන සියවසත් 10 වන කාලවකවානුවක ඉදිකරන්නට ඇති බවයි.

> " අනුරාධපුර සමයේ අවසාන භාගයේ දී නිමවන ලද බවට සාධක ඇති ඇලහැර හා මැණික් දෙන ආදී බෞද්ධ ආරාමික ස්ථානවලට සමීපව පිහිටීම හේතු කොට ගෙන එක් නිගමනයකට එළඹිය හැකිය. එනම් අදාළ වකවානුව තුළ සැළකිය යුතු බෞද්ධ ආරාමයක් වශයෙන් නාලන්දාව වැදගත් ස්ථානයක් උසුලන්නට ඇති බවයි "

අනුරාධපුරය පොළොන්නරුව හා මහනුවර යන පැරණි නගර දෙක ඇතුළත කේන්ද්‍රීය වනසේ පිහිටි නාලන්ද සිංහල රජු දවසත් බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේත් පැවති සංග්‍රාම වලදී වැදගත් ස්ථානයක් දැරූ බවට සාධක ඇත. මහාවංශයේ සඳහන් පළමුවැනි පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව. 1153-1186) රාජ්‍යත්වය ලබන්නට පළමුව පොළොන්නරුවේ විජයබාහු සමඟත් රුහුණේ මානාභරණ සමයන් තුළ සටන්වලදී නාලන්දෙහි බලකොටුවක් පිහිටුවාගෙන ඇත. පුරාණ ආලිසාර නමින් හැඳින්වූ වර්තමාන ඇලහැර ප්‍රදේශය පිහිටියේ නාලන්දාවනට නැගෙනහිරින්ය. පරාක්‍රමබාහු රජුවිසින් පොළොන්නරුව අත්පත් කරගැනීමට කළින් ඇලහැර ප්‍රදේශය යටපත් කර ගැනීමේදී නාලන්දා බලකොටුව ප්‍රධාන තැනක් උසුලන ලදි. යුධමය කටයුතු සඳහා මෙම ස්ථානයේ ඇති යෝග්‍යතාවය බ්‍රිතානයයන් විසින්ද මැනවින් අවබෝධ කරගන්නා ලදි. ක්‍රි.ව. 1818 උඩරට මහා කැරැල්ල කාලසීමාවේදී ඔවුන් විසින් නාලන්දාව මූලස්ථානයක් වශයෙන් පවත්වාගත් බවට තොරතුරු වාර්තාවී තිබීමෙන් එය පැහැදිළි වේ.

ඉහතකී බලකොටුව පිහිටි ස්ථානය අද හැඳින්වෙන්නේ කොටුවේ ගොඩැල්ල නමින්ය. එය කුඩාගමක පිහිටා තිබුණි.

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා අධිකාරිය 1890 දී පිහිටුවා නොබෝ කලකින් ප්‍රකට පුරා විද්‍යාඥයකු වූ එච්.සී.පී. බෙල් මහතා 1893 ආරම්භ කළ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේද සහය ඇතිව නාලන්දා විහාර කටයුතු ගවේෂනයට භාජනය කරන ලදි. ඉන් පසුව ලංකාවේ ප්‍රථම ලාංකීය පුරා විද්‍යා කොමසාරිස් වරයෙකු වූ මහාචාර්යය සෙනරත් පරණවිතාන මහතාගේ මෙහෙයවීම යටතේ 1953 වර්ෂයේදී ගෙඩිගේ පිහිටි මළුවේ සිට පනා බැම්ම තරමක් පාදාගන්නා ලදි. 1970 දශකයේදී රජය මගින් ක්‍රියාත්මක කළ කඩිනම් මහවැලි සංවර්ධනය හේතු කොට ගෙන ගෙඩිගෙය සහිත මුළු වෙල් යායම ජලයෙන් යටවිය.



පුරාවස්තුන්ට අයත්ව තිබූ ඉරණම හා සමානව දෙයක් මෙයටද සිදු විය.

ඓතිහාසික වශයෙන් සලකා බලන විට නාලන්දා ගෙඩිගෙය විහාරාරාමක ස්ථානයක් වශයෙන්ද සැළකිය හැකිය. මේ අනුව නාලන්දා ගෙඩිගෙය පිහිටි සම්පූර්ණ හතරැස් භූමි භාගය අඩි 23 ක් පමණ උසට නිර්මාණය වී ඇත. මහවැලි සංවර්ධන කටයුතු නිසා මෙම ස්ථානයේ ඇතැම් නටඹුන් වෙනස් වී ඇත. ඉතිරිව ඇති ගර්භගෘහ මණ්ඩපයක් සහිතව ගෙඩිගේ පරීක්‍ෂා කර බැලීමේදී ඉතා විශිෂ්ඨ නිර්මාණයක් ලෙස පැවති බවට කරුණු සඳහන් කළ හැකිය. නාලන්දා ගෙඩිගේ වර්තමානයේ ජලයෙන් වටවූ දකුම්කළු දර්ශණීය ස්ථානයක් බවට පත්වී ඇත.

විශ්‍රාමලත් සංස්කෘතික සහකාර අධ්‍යක්‍ෂ ඩී.එම්.කේ. කරුණාරත්න මහත්මාගේ අභාවයෙන් පසු උපහාර පිණිස පළකෙරේ.

# කරන කලට පව් මිහිරිය මීසේ විඳින කලට දුක් දැඩි වෙයි ගිණිසේ

ලොවට වැඩ සලසන ලෝවැඩ සඟරාව" නම් කාව්‍ය කෘතිය වීදාගම මහා මෛත්‍රිය ස්වාමීන්ද්‍රයාණන් වහන්සේගේ මා හැඟි ඉතා උසස් ග්‍රන්ථයකි. උන්වහන්සේ ලක්වාසී බෞද්ධ අබෞද්ධ සියලු දෙනාගේම දෙලොව සුභ සිද්ධිය උදෙසා සිය පන්හිඳ මෙහෙයවූයේ මිනිසා පවිටු අදහැමි මාවතෙන් දහැමි යහපත් මාවතකට රැගෙන යාමටය. මා මේ ලිපියෙහි මාතෘකාව ලෙසින් තෝරාගනු ලැබුවේ ඒ ශ්‍රේෂ්ඨ යතිවරයාණන් ලියූ ලෝවැඩ සඟරාවේ එන කවි පදයකි. මෙය අද සමාජයට කියා දිය යුතු පාඩමක් ලෙසින් මට හැඟෙන නිසාම ඒ කවි පදය විමසා බැලීම වටී.

වත්මන් සමාජයේ බොහෝ දෙනෙක් තීන්දු තීරණවලට එළඹෙන්නේ දුර දිග සිතා බලා නොවේ. තමතමන්ගේ හෝ අනුන්ගේ යහපත අයහපත ගැන සිතා නොවේ. යම් ක්‍රියාවක් කිරීමෙන් ඉන් තමාම පසුතැවිල්ලට පත්වනවානම් ඒවා නොකළ යුතු දෙය ලෙස බැහැර කිරීමට බොහෝ දෙනෙක් කල්පනාකාරී නොවන තත්වයකට අද සමාජය පත්ව ඇත. මෙය සුභදායි නොවන බව වටහා ගත යුත්තකි. බොහෝ දුරට අපගෙන් වැරදි සිදු වන්නේ සිත කය වචනය යන තුන්දොර සංවර කර නොගැනීමෙනි. මේ බව පැවසූ විට බහුතර පිරිසක් පවසන කරුණක් ලෙස දක්විය හැක්කේ වත්මනෙහි සංවරව සිටිය නොහැකි බවයි. එසේ සිතා ඕනෑම වැරදි දෙයක් කිරීමට පුද්ගලයා පෙළඹෙයි. නමුත් තමා කරන කටයුත්ත සිහි නුවණින් විමසා බලා කරන්නේ නම් කිසියම් පාපී ක්‍රියාවක් කරන විට අපි එය ඉතා විනෝදයෙන් අශාවෙන් සිදු කරන්නෙමු. ඉන් තමන්ගේ හැකියාවද ලොවට විදහා පාන්නෙමු. නමුත් එහි විපාක සිහි කිරීම පසුවට තැබීම නිසා නොයෙක් දුක්වලට පැමිණීමට අපට සිදු වෙයි. අප විසින් කරන සෑම ක්‍රියාවක්ම සිදු වන්නේ සිතින්, කයින් හා වචනයෙනි. ඒ තුන් දොරින් හොඳ හා නරක යන ක්‍රියාවන් දෙකම සිදු වේ. බොහෝ දුරට පාපී ක්‍රියාවන් සිදු වන්නේ තුන්දොර අසංවර වූ විටය. එම පව් දුරලීමට දෙන උපදේශය නම් සිත, කය, වචනය සංවර කර ගැනීම බව මා මාතෘකාව ලෙසින් තෝරාගත් කවියෙහි සඳහන් වෙයි.


කරන කලට පව් මිහිරිය මීසේ
විඳින කලට දුක් දැඩිවෙයි ගිණි සේ
ඇඳින එපව් දුරලන උපදේසේ
නුදුන මැනවි තුන් දොර අවකාසේ
(ලෝවැඩ සඟරාව)

අධික ලෙස කම් සැප විඳින වත්මන් මිනිසා තම සැප වඩා වර්ධනය කර ගැනීමට සුදුසු ඕනෑම පාපී ක්‍රියාවක් කිරීමට ඉතා යුහුසුළු වෙයි. එය කොතරම් දුරට හරිද වැරදිද යන්න සිතන්නේ නැත. එසේ ජීවත් වන මිනිසා හරියට දිය බඳුනකට දැමූ කකුළුවෙකු දිය බඳුන ලිප උඩතබා ගිණි ඇවිලී දිය රත්වන තුරු කකුළුවෙකු දිය කෙළියෙහි යෙදෙන්නා සේ තම පවෙහි විපා දෙන තෙක් තම හැකිකම ලෙවට පෙන්වීමට ක්‍රියා කරන බවත් මෙම කම් සැපය සැපයක් නොවන බවත් පෙන්වා දී තිබෙන්නේ මෙසේය.

ලිප ගිණි මොලවන තෙක් දිය සැලියේ
සැපයක් යැයි කකුළුවා දිය කෙළියේ
එපමණ තොප සිතතොත් නො පැකිලියේ
සැපයක් නම් නැත කම් සැප කෙළියේ

අප කරන අයහපත් දේ වල විපාක කෙදිනක හෝ අපට ලැබෙනු ඇත. එතෙක් සැපයෙන් සුවයෙන් කල් ගෙවීමට හැකි වෙයි. එහි විපාක ලැබුණු දිනට ඒ තැනැත්තා තමා කළ පාපය පිළිබඳ පසු තැවිලි වෙයි. පව විපාක දීමේ කාලයත් වාරයත් කිසි දිනෙක අපට තීරණය කළ නොහැක. නමුත් කර්මය විපාක දීමේ කාල 04ක් ඇති බව ධර්මයෙහි උගන්වයි. එහි සැප විපාක හා දුක් විපාක එම කාල සතරෙන් එක කලකදී ලැබෙන බවත් පවෙහි විපාකද එම කාලයන් ගෙන්ම ලැබීමට සිදු වන බවත් සිහිකළ යුතුය.

බොදුනුවන්වන අප කවුරුත් අසා ඇති අගසව් මුගලන් මහා රහතන් වහන්සේ සොරුන්ගෙන් පහර කෑමකට ලක්ව පිරිණිවුමට පත් වන්නට සිදු වූයේද පෙර කළ අකුසලයක විපාක වශයෙන් බව ශාසන ඉතිහාසයෙහි දක්වෙයි. එසේ නම් ලොව කොතැනක කුමන තරාතිරමක සිටියත් අප පාපී ක්‍රියාවක් කළ හොත් එහි විපාකයෙන් මිදීමට නොහැක. ඒ බව මැනවින් පසක් කර දෙන



න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ
න පබ්බතානං විවරං පවිස්ස
න විජ්ජතී සෝ ජගතිප්පදේසො
යත්ථට්ඨිතෝ මු ඤ්චෙය්‍ය පාපකම්මා
(ධම්ම පදය- පාප වර්ගය)



**අප විසින් කරන සෑම ක්‍රියාවක්ම සිදු වන්නේ සිතින්, කයින් හා වචනයෙනි. ඒ තුන් දොරින් හොඳ හා නරක යන ක්‍රියාවන් දෙකම සිදුවේ.**

යන ධම්ම පද ගාථාවෙන් දක්වෙන පරිදි පවෙහි විපාකයෙන් මිදිය හැකි නැතත් අහසෙහිත් පර්වත කුහරයකත් නැති අතර එබඳු තැනක් සමුදුර මධ්‍යයේද තබා ලොව කොහේවත්ම නැති බව පවසා බුදුන් වහන්සේ විසින් දේශනා කර ඇත.

අද සමාජයේ බොහෝ දෙනෙකු ජීවත් වන්නේ අද ගැන පමණක් සිතා ගෙනය. මෙලොවක් ගැන තබා පරලොවක් ගැනවත් කිසිසේත්ම සිතන්නේ නැත. එම නිසා පාපී ක්‍රියාවන් කරන්නේ ඉතා වැදගත් ක්‍රියාවක් කරන්නාක් මෙනි. තමන්ගේ සිතු මනාපයට අකුසල සිදු කරයි.

මෙහිදී සුභාෂිත කතුවරයා අපට කියා දුන් ඔවදනක් මා මනැසට නැගෙයි. එනම්,

ඇතත් නැතත් පරලොව සුදෙනෙනි මහත
හලොත් යෙහෙකි පව්කම් නොතබාම සිත
ඇතත් එපරලොවට ඉන්වන අවැඩ නැත
ඇතොත් නැතැයි පව්කළහට වෙයි විපත
(සුභාෂිතය-අලගියවැන්න මුකවැටි)

ඉන් කියවෙන පරිදි 'යහපත් වූ සත් පුරුෂයෙනි, පරලොවක් ඇතත් නැතත් පාපී ක්‍රියා සම්පූර්ණයෙන්ම අත් හැරීම යහපතකි. ඒ පරලෝකය නැති වුවත් එසේ කිරීමෙන් වන යහපතක් නැත. යම් හෙයකින් එබඳු පරලොවක් ඇත්නම් එවැන්නක් නැතැයි පව් කල අයට පැමිණෙන්නේ විපත්තියක්ම බවයි" එසේ නම් අප කළ යුත්තේ පරලොවක් ඇත නැත කියා ඉන් වන විපාක ගැන සිතමින් එය විපාක දෙන තෙක් සිටීම නොව මේ මොහොතේදීම තමා කරන ක්‍රියාව අනුන්ටත් තමන්ටත් යහපතක් ගෙන දෙනවාද යන්න පිළිබඳව සිතා එසේ යහපත් වනදෙය කිරීමටත් අයහපතක් වන දේ නොකිරීමටත්ය. එසේ වූ විට පරලොවක් තිබුණත් අපට සිදු වන්නේ යහපතක්මය. නොතිබුණත් නපුරක් සිදු නොවේ.

එම නිසා තමන් කරන හොඳ නොහොඳ ක්‍රියා හඳුනාගෙන තමා කරන ක්‍රියාවෙහි විපාක විඳිය හැක්කේ සතුටු සිතින් යුතුව නම් එය සිදු කිරීමටත් එහි විපාක විඳින්නට සිදුවන්නේ කඳුළු වැගිරුණ මුහණින් යුතව නම් එබඳු දෙය නොකිරීමටත් සිතට ගත යුතුය. පාපී ක්‍රියාව මිහිරි වන්නේ කරන වෙලාවට පමණි. එහි විපාක විඳීමට සිදුවන විට එය ගින්දර සේ දැඩි දුක් ගෙන දෙයි. එමනිසා පවෙහි විපාක දන හැඳින පාපී ක්‍රියාවෙන් අකුසලයෙන් දුරු වන්නේ නම් ලක්වැසි සමාජ සත්වයන් දැහැමි මිනිස් පිරිසක් වනවාට සැක නැත. එය බොදුණුවන් වන අප විසින් සමාජයට රටට රටෙන් මුළු ලෝකයටම කියා දෙන්නට ආදර්ශවත් වන්නේ නම් එය ඉතා අගනා වන බවද පවසන්නට කැමැත්තෙමි. එමගින් පාපී ක්‍රියාවෙන් තොර පිරිසක් ලොවට බිහි වනු ඇත.

දිල්රුක්ෂි අබේකෝන්

රංගිරි ශ්‍රී ලංකා
RSL NEWSPAPER




# දහම් අධ්‍යාපනය සෑම බෞද්ධ දරුවෙකුටම අනිවාර්ය විය යුතුයි

**මි**නිස් සංහතියේ ආරම්භයේ සිට මිනිස් සංහතියේ පැවැත්මට හා ඉදිරි ගමනට ඉවහල් වෙමින් විවිධ ස්වරූප ගනිමින් ක්‍රියාත්මක වූ පුළුල් ක්‍රියාදාමය අධ්‍යාපනය ලෙසින් හැඳින්විය හැකිය. එය දිනපතා පාසලේදී මෙන්ම දහම් පාසලේදී පමණක් නොව සෑම ස්ථානයකදීම ලබාගත හැකිවන්නකි.

අධ්‍යාපනය යන්න පිළිබඳව අධ්‍යාපනඥයින් දාර්ශනිකයින් ඉදිරිපත් කර ඇති විවිධ අදහස් ද මෙහිදී අපගේ අවධානයට භාජනය විය යුතුය.

"අධ්‍යාපනය ජීවත්වීමේ ක්‍රියාවලියයි"
(ඇමරිකන් ජාතික ආචාර්ය ජෝන් ඩිව්)

"අධ්‍යාපනය යනු ජීවත්වීම සඳහා ජීවන අත්දැකීම් මඟින් මුළු ජීවිතය පුරාම ක්‍රියාත්මක වන ඉදිරි වැඩීමක් ඇති කාර්යා වලියකි"
(මහත්මා ගාන්ධි)

"අධ්‍යාපනය යනු අත්දැකීමෙන් සහ සහභාගීත්වයෙන් පමණක් ලබාගත හැකි දෙයි"
(ප්ලේටෝ)

"අධ්‍යාපනය යනු ජීවන මාර්ගයක් සලසාදීමයි"
(එලියට්)

"අධ්‍යාපනය යන්න යාවජීව ක්‍රියාදාමයක්"
(පිලිප්ස් කැබ්ස්)

"අධ්‍යාපනය යනු සමාජ ජීවිතය සඳහා සූදානම් නොවූ පිරිසක් වෙනුවෙන් වැඩිහිටියන් විසින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාවලියකි"
(එමිල් ඩර්කි හයිම්)

මේ අනුව විමසා බලන විට පෙනී යන කාරණයක් වන්නේ අධ්‍යාපනය යන්නට නිශ්චිත වූ එකම අදහසක් දීම අපහසු බවයි. එසේ වුවත් ප්‍රධාන කරුණු දෙකක් කෙරෙහි අපගේ අවධානය යොමුකළ යුතුය. එනම්,

1. එය ජීවිත කාලය පුරා දිව යන අඛන්ඩ ක්‍රියාවලියක් වීම.
2. පුද්ගලයෙකු ඔහු වෙසෙන සමාජයට අනුව සකස් කිරීම.

යන කරුණු දෙකයි. ඒ අනුසාරයෙන් බලන විට අධ්‍යාපනයේ පරමාර්ථ පිළිබඳව කිසියම් සැහීමක් ඇතිකර ගත හැකි වේ.

අධයාපනය පටන් ගන්නේ උපන්දා සිටම ද්‍රව්‍ය හා පුද්ගලයන් ඇසුරිනි. අප ජීවත් වන සමාජය විෂමය. එහිදී මවකට. පියෙකුට, ගුරුවරයෙකුට තමාට වුවමනා අත්දැකීමක් පමණක් ලබා දීමෙන් ළමයෙකු වර්ධනය කරගැනීම කළ නොහැකිය. හොඳ නරක දෙකම සමාජය තුළ ක්‍රියාත්මකය. අපට කළ හැකි වන්නේ හොඳ අත්දැකීම් ලැබීමට දරුවා යොමු කර නරක අත්දැකීම් බැහැර කිරීමයි. එය රජයේ පාසල් හා දහම් පාසල් මඟින් ද වෙනත් අධ්‍යාපන ආයතන මඟින් ද ක්‍රියාත්මක වේ. ලංකාවේ අතීතය විමසා බලන්නෙකුට පෙනී යන කරුණක් වන්නේ එය සදාචාර සම්පන්න ගති පැවතුම් වලින් හෙබි ජනතාවක් වාසය කළ වකවානුවක් බවයි. එහෙත් අද දැකිය හැක්කේ ඊට හාත්පසින්ම වෙනස් වූ ස්භාවයකි. සොර මැරකම්, ජීවිත හානි කිරීම්, ළමා අපයෝජනද අද ඉතා සුලභය. මේ අවාසනාවන්ත තත්වයෙන් තරුණ පරපුර මුදා ගැනීම, ළමා පරපුර මුදා ගැනීම දෙමාපියන්ටත්, රජයේ පාසලටත්, විහාරස්ථානයේ දහම් පාසලටත් පැවරී ඇති උතුම් වගකීමකි.

1971 වර්ෂයේ ජනතා විමුක්ති පෙරමුණ මුල් වී සිදු කළ මහා කැරැල්ලට සම්බන්ධව සිටි තරුණ තරුණියන් වැඩි දෙනෙකු දහම් පාසල් අධ්‍යාපනයක් නොලද අය බව සමීක්ෂණ වලින් අනාවරණය වී තිබේ. මීට වසර 36 කට පමන පෙර නිගමනය කළ තත්වය එසේ වුවත් අද ඇත්තේ දහම් පාසල් කෙරෙහි අඩු තක්සේරුවකි. ඒ සම්බන්ධ දෙමාපියන්ගේ මෙන්ම ගුරු මහත්ම මහත්මීන්ගේ ද දැඩි අවධානය යොමු විය යුතුය.

මේ කාරණය ලංකාවට පමණක් සීමා වූවාක් නම් නොවේ. 1997 දී ඇමෙරිකානු ජනාධිපති බිල් ක්ලින්ටන් ප්‍රාන්ත රාජ්‍යයේ සම්මේලනයේදී ඇමෙරිකානුවන්ගේ අධ්‍යාපනය සඳහා මඟ පෙන්වන මූලධර්ම 10 ඉදිරිපත් කරන ලදි. එයින් එකක් වූයේ 'ඇමෙරිකානු පන්ති කාමරවල යහපත් සාරධර්ම හා යහපත් පුරවැසිභාවය පිළිබඳ ඉගැන්වීමේ අභියෝගය ගුරුවරුන් ජයගත යුතුය' යන්නයි.

> **අප ජීවත් වන සමාජය විෂමය. එහිදී මවකට. පියෙකුට, ගුරුවරයෙකුට තමාට වුවමනා අත්දැකීමක් පමණක් ලබා දීමෙන් ළමයෙකු වර්ධනය කරගැනීම කළ නොහැකිය. හොඳ නරක දෙකම සමාජය තුළ ක්‍රියාත්මකය. අපට කළ හැකි වන්නේ හොඳ අත්දැකීම් ලැබීමට දරුවා යොමු කර නරක අත්දැකීම් බැහැර කිරීමයි. එය රජයේ පාසල් හා දහම් පාසල් මඟින් ද වෙනත් අධ්‍යාපන ආයතන මඟින් ද ක්‍රියාත්මක වේ**

එම ප්‍රකාශනය අනුව හැඟී යන්නේ සාර ධර්ම හුරු පුරුදු කිරීමේ වගකීම ගුරුවරයා සතු කාර්ය භාරයක් බවයි. එය වඩාත් වගකීමෙන් යුතුව කළ හැක්කේ දහම්පාසල් ගුරුවරයාට හා විහාරස්ථාන වල වැඩ වෙසෙන භික්ෂූන් වහන්සේලාටයි.

යහපත් පුරවැසියෙකු බිහි කිරීම දහම් පාසලකින් අපේක්ෂා කරන වැදගත් ප්‍රතිඵලයකි. එය බිහි වූයේ සමාජ අවශ්‍යතාවයක් ලෙසිනි. බුදු දහම මෙරටට ලැබීමත් සමඟ ජනතාවගේ සියලු අධ්‍යාපන කාර්යයන් සිදුවූයේ විහාරස්ථානය මුල්කොටගෙන වුවත් විවිධ අංශයන්ගෙන් අධ්‍යාපනය ලබාදීමත් ජනග්‍රහනය වර්ධනයත් නිසා පන්සලේ පැවති පාසල වෙනත් ස්ථානයන්හි ආරම්භ කරන ලදි. අපහසුතා මැද හෝ බොහෝමයක් දහම්පාසල් මේ වන විටත් විහාරස්ථාන ඇසුරු කොටගෙන පැවතීම බෞද්ධ ජනතාවගේ සතුටට හේතුවක් වනු ඇත.

## පළමු දහම් පාසල

බටහිර ජාතීන් මෙරටට පැමිණ ඔවුන්ගේ අධ්‍යාපනය තහවුරු කරගැනීමට ගත් උත්සහය පිළිබඳව බොහෝ දෙනා අසා තිබේ. ඒ අයුරින් මෙරටට පැමිණි පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි ජාතිකයින් සියලු දෙනාටම අවශ්‍ය වූයේ ඔවුන්ගේ ආගම් පැතිරවීමට මඟ සලසා ගැනීමයි. භික්ෂූන් වහන්සේලා හා සාමාන්‍ය ජනතාව අතර පවතින දැඩි සබඳතාව මේ කාර්යයන්හිදී ඔවුනට දැඩි අපහසුතාවයක් විය. නොයෙක් රැකියා ලබා දෙමින් මිල මුදල් හා ත්‍යාග ලබා දෙමින් බෞද්ධ ජනතාව තම ආගම් වලට නැඹුරු කර ගැනීමට ඔවුන් අනුගමනය කළ ක්‍රමයයි. 19 වන ශත වර්ෂයේ අවසන් දශකයේ දී පමණ මෙරට වැඩ සිටි ශාසන වගකීම් භාරය ඉසිලූ ප්‍රධාන පෙළේ භික්ෂූන් වහන්සේලා කිහිප නමකගේ මෙහෙයවීමෙන් විදේශීය ජාතීන්ගේ ක්‍රියාකලාපයට එරෙහිව විවිධ මාදිලියේ බලපෑම් ඇති විය. පොත් පත් වෙනත් පත්‍රිකා හා දේශන වාද විවාද පවත්වමින් බෞද්ධ ජනතාව අන්‍යාගම් වලට ඇතුළත් කරගැනීමේ ව්‍යාපාරයට එය බලවත් තර්ජනයක් විය. මෙහි වැදගත්ම අවස්ථාවක් වූයේ පානදුරා වාදයයි.

15 පිටුවට...

ශාස්ත්‍රපති ලෙනදොර
සෝරත නායක හිමි

iv පිටුවෙන්....

# දහම් අධ්‍යාපනය

## සෑම බොදු දරුවෙකුටම අනිවාර්ය විය යුතුයි

**ඕල්කට් තුමා**

පානදුරා වාදයේ විස්තර ඇතුළත් පත්‍රිකා ලෝකයේ බොහෝමයක් රටවලට යවන ලද අතර ඇමෙරිකාවේ දී එම පත්‍රිකා කියවූ සෙන්පති ස්ටීල් ඕල්කට් තුමා බුදු සමය කෙරෙහි පැහැදී ලංකාවට පැමිණියේය. ඒ සමඟ රුසියන් ජාතික හෙලේනා වැව්ට්‍රොවිනා බ්ලැවැස්කි මැතිණියත් පැමිණියාය. ඔවුන්ගේ ලංකා ගමන සිදුවූයේ 1800 මැයි මස 17 වන දිනයි. ඕල්කට් තුමා විසින් පසු කාලයේදී ලියා තබන ලද එතුමාගේ අත් අකුරින් වූ සටහනක සඳහන්ව ඇත්තේ ගාල්ලේ විජයානන්ද විහාරස්ථානයේ විහාරාධිපතිව වැඩ විසූ අක්මීමන ධර්මාරාම හිමියන්ගෙන් පන්සිල් සමාදන්ව බුදු දහම වැළඳගත් බවයි.

ලාංකික බෞද්ධ ජනතාව මුහුණ දී සිටි අසහනකාරී තත්වයෙන් ඔවුන් මුදවා ගැනීමටත් ගුණ ගරුක දූ දරු පිරිසක් ඇති කරගැනීමටත් තිබූ දැඩි අවශ්‍යතාවය නිසා 1985 අගෝස්තු මස 03 වන දින ගාල්ලේ විජයානන්ද දහම් පාසල ආරම්භ විය. ඕල්කට් තුමාගේ දින පොතක වූ සටහනකට අනුව විහාරස්ථාන ඇසුරු කොට ගෙන ඉරිදා දහම් පාසල් ආරම්භ කිරීම කරන ලද්දේ උතුම් පරමාර්ථයක් අනුව බව පෙනී යයි. (ඕල්කට් දින පොත 111 කාණ්ඩය 143 පිටුව සිංහල පරිවර්තනය)'මාගේ හිතට වැදගත් අදහසක් පහළ විය. බෞද්ධ ළමයින් ඔවුන්ගේ ආගම දිවයිනේ තිබෙන හැම විහාරස්ථානයකටම ගොස් විශේෂ දිනවල නියමිත පැය ගණනක් උගත යුතුය. ඔවුන්ගේ දෙමාපියන් ආගමෙහි මූලික කරුණු පමණක් ඔවුනට ඉගැන්වුව හොත් ඔවුන් හොඳ බෞද්ධයින් වෙතැයි කෙසේ බලාපොරොත්තු විය හැකිද? ක්‍රිස්තියානිවරු ඔවුන්ගේ ළමයින්ට ආගම ඉගැන්වීම අතපසු නොකරද්දී බෞද්ධයෝ පමණක් ඔවුන්ගේ දරුවන්ට කුමක් නිසා එය අතපසු කරද්ද?

පසු කාලයේ දී ඇහැලේපොළ ජිනෝරස හිමියන්ගේ අනුශාසකත්වයෙන් විජයානන්ද සභාව පිහිටුවා පළමු පාසල ආරම්භ කිරීමේ වැඩකටයුතු සංවිධානය විය.

### සංස්කෘතික අමාත්‍යංශය ආරම්භය

ශ්‍රී ලංකාවේ එවකට බලයට පත්ව තිබූ රජය ක්‍රි.ව. 1956 පළමු වරට සංස්කෘතික අමාත්‍යාංශයක් ඇති කරන ලදි. ඒ යටතේ සංස්කෘතික දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක විය. මේ වන විට බොදු දහම් පාසල් ක්‍රියාත්මක කරන ලද්දේ කොළඹ තරුණ බෞද්ධ සංගමය මඟිනි. මෙයින් පසු සංස්කෘතික දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව වඩා ක්‍රමානුකූලව දහම් පාසල් කටයුතු කරගෙන යන ලදි. 1979 දී පමණ නැවත වරක් දහම් පාසල් විභාග ආදිය පැවැත්වීමේ වගකීම කොළඹ තරුණ බෞද්ධ සමිතියට පැවරීම අමාත්‍යාංශය මඟින් ගන්නා ලද තීරණයකි. එසේ වුවත් ඉතාමත් කෙටි කාලයකින් දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය හා බෞද්ධ ධර්මාචාර්යය විභාගය රජය මඟින් පැවැත්විය යුතු යැයි කරන ලද ඉල්ලීම අනුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් යථෝක්ත විභාග පැවැත්වීම ආරම්භ කරන ලදි.

ක්‍රි.ව. 1982 වර්ෂයේ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව පිහිට වූ අතර දහම් පාසල් වලට අදාළ සියළුම කාර්යයන් එතැන් සිට එම දෙපාර්තමේන්තුවට භාර විය. ප්‍රධාන වශයෙන් දහම් පාසල් ලියාපදිංචිය පොත් පත් සකසා මුද්‍රණයකර බෙදා හැරීම නාම ලේඛන හා අත්‍යවශ්‍ය උපකරණ ලබාදීම වැනි කාර්යභාරයන් එයට අයත් විය. අද දක්වාත් ඇත්තේ මේ ක්‍රමයයි.

### බාධක

දහම් අධ්‍යාපනය සාරධර්ම පෝෂණයට අත්‍යාවශ්‍ය බව සියලු අංශ වලින් ප්‍රකාශ වුවත් අද දෙමාපියන් හා තරුණ දූ පුතුන් අතර ඇත්තේ ඒ පිළිබඳව අවතක්සේරුවකි. මේ වන විටත් වසර ගණනාවක් පුරා බලයට පත්වූ ආණ්ඩු ගණනාවක් ඉරිදා දින පෞද්ගලික පන්ති පැවැත්වීම තහනම් කිරීමට උත්සහ කළත් කිසිදු රජයකට කළ නොහැකි විය. ඕනෑම තැනකින් ඉගෙන ගැනීමේ අයිතිය දරුවන්ටත් දෙමාපියන්ටත් ඇතැයි කියමින් මානව හිමිකම් ගැන කතාකරනවා විනා එයට පිළියමක් නැතිවීම බෞද්ධ රාජ්‍ය පාලනයක් ඇති රටක හැම දෙනා කණගාටු විය යුතු කාරණයකි.

දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය හා බෞද්ධ ධර්මාචාර්ය විභාග දැනට පවත්වනු ලබන්නේ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟිනි. මීට වසර ගණනාවකට ප්‍රථම අභ්‍යාසලාභී ගුරුවරුන් වශයෙන් රජයට ගුරු පිරිස බඳවා ගත් අවස්ථාවේ දහම් පාසල් අවසාන විභාගය සමත්වූවන්ට කිසියම් ලකුණු ප්‍රමාණයක් ලබාදීම විශේෂ අවස්ථාවකි. එහි ප්‍රතිඵලයක් ලෙස ඊළඟ වසරේදී දහම් පාසල් අවසාන විභාගයට අයදුම් කළ සංඛ්‍යාව 300% (සියයට තුන්සියයක්) පමණ විය. එහෙත් එයින් පසු ක්‍රමයෙන් විභාගයට අයදුම් කරන සංඛ්‍යාව අඩු වී ඇත. ගත වූ වසර කිහිපය තුළ පැහැදිළිව පෙනී ගොස් ඇත්තේ මෙම විභාගයට අයදුම් කරන ශිෂ්‍ය සංඛ්‍යාවෙන් තුනෙන් එකකට ද අඩු ප්‍රමාණයක් විභාගයට පෙනී සිටින බවයි. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විශාල මුදල් සම්භාරයක් මේ හේතුව නිසා නිකරුණේ වැය කරයි. මහජන මුදල් කන්දරාවක් අවුරුදු පතා අනවශ්‍ය ලෙස වැය කිරීමට සිදුව ඇත්තේ දහම් පාසල් විභාගය කෙරෙහි ඇති උනන්දුව මඳ වීම නිසාය. ධර්මචාර්‍ය විභාගයට අයදුම් කරන අපේක්ෂකයින් කෙරෙහි ද ඇත්තේ ද මේ තත්වයයි.

### වර්තමාන දියුණුව

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මඟින් අද දහම් පාසල් පාලනය කරයි. ගෙවී ගිය වසර කිහිපය තුළ දහම් පාසල් ගුරු සිසු සංවර්ධනය උදෙසා යොදවූ වැඩ පිළිවෙළ රැසකි. ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය අනුබද්ධිතව දහම් සරසවිය පිහිටු වීම, පාලි භාෂා ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය, දහම් පාසල් පොත් නව මුහුණුවරකින් සකසා දහම් පාසල් වෙත බෙදා හැරීම, ශිෂ්‍ය කාර්ය සාධක වාර්තාවක් දහම් අධ්‍යාපනයෙන් පසු සිසුනට ලබාදීම ආදිය මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතින විශේෂ වැඩසටහන් කිහිපයකි.

මෙවැනි වැඩසටහන් රාශියක් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයක් ලෙස ආසන්න වසර කිහිපය තුළ දහම් පාසල්වල වර්ධනයක් වූ බව බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අනුව පැහැදිළි වේ.

**2005/03/21 දිනට**

| | |
|---|---|
| දහම් පාසල් සංඛ්‍යාව | 7,557 |
| ගුරු සංඛ්‍යාව | 96,380 |
| ශිෂ්‍ය සංඛ්‍යාව | 1919,723 |

**2006 වසර අවසන් වන විට**

| | |
|---|---|
| දහම් පාසල් සංඛ්‍යාව | 9,5127 |
| ගුරු සංඛ්‍යාව | 104,294 |
| ශිෂ්‍ය සංඛ්‍යාව | 2,190,500 |

2007 වසරේ සිට ක්‍රියාත්මක කළ දහම් පාසල් ගුරු පිරිස සඳහා පුස්තකාල දීමනාවක් ලබාදීම, දහම් පාසල් ගුරුවරුන් දිරිමත් කිරීමට යොදා ඇති ඵලදායි වූ වැඩසටහනකි.

වැඩිම ජනග්‍රහණය බෞද්ධයින් වන ශ්‍රී ලංකාවේ දහම් පාසල් අධ්‍යාපනය සෑම බොදු දරුවෙකුටම අනිවාර්ය කළයුතු කාලය අද උදා වී තිබේ. දිනපතා දහම් පාසල් අධ්‍යාපනය සියළු සිසු දරුවන්ට අනිවාර්ය කිරීමට තරම් උනන්දුවන අධ්‍යාපන අමාත්‍යාංශය පාසල් අධ්‍යාපනයද අනිවාර්ය කිරීමට එවැනිම උනන්දුවක් දැක්විය යුතුව ඇත.

---

04 පිටුවෙන්....

### යහපත් ගුණවත් දිවියකට නොවරදින බොදු මඟ ...

එනම් ලැබෙන ආදයම (වැටුප) කොටස් හතරකට බෙදන්න. එක් කොටසක් එදානෙදා ජීවත්වීම පිණිස යොදවන්න. ධනය ඉපැයීමේ කර්මාන්තයන් සඳහා කොටස් දෙකක් වැය කරන්න. ඉතිරි කොටස ඉදිරි කාලයේ ප්‍රයෝජනය සඳහා ඉතිරි කරන්න.

මීටත් වඩා සරල ආර්ථික සූත්‍රයක් තවත් තිබිය හැකිද? රජයේ රැකියාවක් කරන කෙනෙකුට පවා ස්වයං රැකියාවක් හෝ අමතර ආදයම් මාර්ගයක් තිබිය යුතු බව අද කාගේත් පිළිගැනීමය. වසර 2500 කටත් ඔබ්බෙන් බුදුරජාණන් වහන්සේ අපට පෙන්වූ මේ ආර්ථික න්‍යාය අදට මෙන්ම හෙටටත් ප්‍රයෝජනවත්ය. ධනවාදී හෝ සමාජවාදී හෝ දේශපාලනික ක්‍රමයන්ට මෙන්ම විවෘත හා ආවෘත්ත අර්ථික රටාවන්ටද, එය පොදුය.

ආර්ථිකය ගැන කතා කිරීමේදී බුදුරජාණන් වහන්සේ දේශනා කළ තවත් ධර්ම කරුණක් සිහිකළ යුතු වේ. එනම් සම්මා ආජීවය යටතේ දක්වෙන යහපත් (නිවැරදි) ජීවනෝපාය මාර්ගයන්ය.වැරදි වෙළදාම් පිළිබඳවද එහිම සඳහන්ය.

යමෙකුට මෙකී ගුණ ධර්ම අනුව කටයුතු කළ හැකිනම් චරිත සංවර්ධනයද සමාජ සංවර්ධනයද නිතැතින්ම හිමිවනු ඒකාන්තය. අදම අරඹන්න. අදම හුරුවන්න හෙටම ප්‍රතිඵල නිසැකය. බුදුමඟ හැර අන්මඟක් නැත.

13 පිටුවෙන්...

### රුදුරු දිවිමඟ සොඳුරු කරවන අමාදම් දිවඔසු ....

සමාවතී ඇතුළු පිරිසට මල් ගෙනවිත් දීම ආදී මෙහෙකිරීමට බුජ්ජුත්තරා නම් දාසියක් විය. ඈ දිනපතා සුමන මාලාකරුගේ නිවසට ගොස් බිසෝවරුන්ට පැළඳීමට මල් ගෙනෙන්නීය. මෙම දාසිය උපතින්ම කුදුවූ කාන්තාවකි. දාසියකි. ඇගේ නම උත්තරාය. කුදුබැවින් ඈ හැඳින්වූයේ බුජ්ජුත්තරා නමිනි. මහා පුණ්‍යකර්මයක හේතුවෙන් ඈ මිනිසත් භවයක් ලැබුවද කුදු වීමට හා මෙහෙකාරියක් වීමට තරම් අවාසනාවන්තද විය. කළකම් පලදේමය. සිටුකුමාරියක්ව සිටි ආත්මයක ඈ භික්ෂු භික්ෂූණීන් ලඟින් ඇසුරු කළාය. ධර්මයද ඇසුවාය. දන් පැන් ද පිදුවාය. සීලයද රක්ෂා කළාය. සුචරිතයෙහි යෙදුනාය. දිනක් සුවිශේෂී උත්සවයකට යෑමට සූදානම් වෙමින් ඈ සිටින විට කුළුපගව ඇසුරු කළ රහත් මෙහෙණින් වහන්සේ නමක් ඇගේ නිවසට වැඩම කළාය. ගමන යෑමට හදිසියෙන් සිටි ඇයට යම් ආභරණයක් ළඟට ගැනීමට අවශ්‍ය විය. ළඟ කිසිවෙකුත් නැති බැවින් එය ගෙනත් දෙනමෙන් රහත් මෙහෙණින් වහන්සේට දැන්වීය. එම මොහොතේ එය සිදුනොකළොත් කුමරිය අමනාප සිත් ඇති කරගෙන අපාගත වන බවත් එය කළොත් දාසියක් වන බවත් දත් තෙරණින් වහන්සේ අපාගතවීමට වඩා දාසියක් වීම යහපත් බැවින් එම ආභරණය ගෙනවිත් දුන්නාය. මෙහි අකුසල කර්ම හේතුවෙන් ඈ සාමාවතී ඇතුළු පිරිසට දාසියක් විය.

මේ තැනැත්තියම එක් භවයක රාජ කුමාරිකාවක්වී සිට රජගෙට වැඩමකොට වදාළ පසේබුදුවරුන් වහන්සේලාට දන්පූජා කළ අතර මහළුව කුදුගැසුන පසේබුදුරජාණන් වහන්සේ නමක් දැක උන්වහන්සේ වඩින විලාෂය කුදුගැසී පෙන්වීමේ විපාකයෙන් කුදුගැසී උපන්නාය.

මෙසේ කුදුවීගිය උත්තරා දාසිය දිනක් මල්ගෙන ඒමට සුමනමාලාකරුගේ නිවසට යන විට එහි බුදුපාමොක් මහසඟනට දනක් පිළියෙල වෙමින් තිබුණි. එය මහත් භාග්‍යවන්ත අවස්ථාවක් බව දැනුන බුජ්ජුත්තරාවෝද දානයට සහභාගීවී අවසානයෙහි දෙසූ ධර්මය මැනවින් ශ්‍රවණය කළාය.

කල්‍යාණ මේව මුද්වෙය්‍යනහි මුඤ්චෙය්‍ය පාපකං - පරුෂ වචන අතහැර හොඳ වචන පවසන්න

" ඉවසීම ද කීකරු බව ද ශ්‍රමණයන් දැකීම ද සුදුසු කළ ධර්ම සාකච්ඡාව ද උතුම් මංගල කරුණුය "

- මංගල සූත්‍රය -

රංගිරි
ශ්‍රී ලංකා
සත්‍ය ගවේෂී බෞද්ධ හඬ
රංගිරි ශ්‍රී ලංකා 2020 ඔක්තෝම්බර් - 2564 වප් කලාපය

# පින් කළ තැනැත්තා දෙලොව සතුටු වෙයි



**ඉධ මෝදති පෙච්ච මෝදති**
**කත පුඤ්ඤො උභයත්ථ මෝදති**
**සෝ මෝදති සෝ පමෝදති**
**දිස්වා කම්ම විසුද්ධි මත්තනෝ**

පින්කළ තැනැත්තා මොලොවත් පරලොවත් සතුටුවෙන බව පැහැදිලි කර දෙමින් තථාගතයන් වහන්සේ මෙම ගාථාධර්මය ධම්මික නම් උපාසක තුමෙකු අරභයා දේශනා කළ බව සඳහන් වේ. ධම්මපදයේ යමකවර්ගයට අයත් 16 වෙනි ගාථාව මෙයයි.

ධම්මික උපාසක තුමා ජීවත්වුනේ සැවැත්නුවර. එතුමා නිතර නිතර බුදු හාමුදුරුවෝ දකින්නට ගියා. බණ ඇසුවා. පින්දහම් කළා. මිනිස් ලොව උපතලද සත්වයෙකුට අයිති ව ඇති සාධු සම්මත යහජීවන පැවැත්මෙන් එතුමා නියම ඵල ප්‍රයෝජන ගත්තා. අන්තිමේ මරණමංචකයට පත්ව සිටියදී එතුමාගේ ඉල්ලීම පරිදි භික්ෂූන් වහන්සේලා වැඩම කරවා මහාසතිපට්ඨාන සූත්‍රය දේශනා කරවාගත්තා. උන්වහන්සේලා සතිපට්ඨාන දේශනාව සිදුකරන අතර උපාසක තුමාට ගති නිමිති පහළ විය. එනම් ඊළඟ භවයේ ලබන්නාවූ භවය පිළිබඳ තොරතුරු දැකීමයි.

පින්කළ තැනැත්තා මොලොවදී සතුටින් ජීවත්වී පරලොව ද සතුටින් ජීවත් වන බැවින් ධම්මික උපාසක තුමාගේ ඊළඟ උපත සිදුවන්නේ සදෙව් ලොවින් එක් ලොවකයි. මේ නිසා සදෙව් ලෝ වැසි දෙවියෝ පැමිණ තම තමන්ගේ දිව්‍ය ලෝකවලට පැමිණෙන ලෙස ආයාචනා කරන ආකාරයත්, දිව්‍ය රථ පැමිණ අහසේ නවතා තිබෙන ආකාරයත් ධම්මික උපාසක තුමාට පෙනෙන්න වුණා. ඒවා පෙනෙන්නේ ගති නිමිති ලෙස අදාළ පුද්ගලයාට පමණයි.

මෙසේ දෙවියන්ගේ ආයාචනා බලවත් වූ විට උපාසක තුමා භික්ෂූන් වහන්සේලා දේශනා කරන සතිපට්ඨාන දේශනාව අවසන් වනතුරු සිටින්නැයි (ඉවසන්නැයි) දෙවියන්ට අතින් සංඥා කළේය. ඒ දුටු භික්ෂූන් වහන්සේලා එය තමන් වහන්සේලාට කළ සංඥාවක් ලෙස සිතූහ. බණ අවසන් කරන්නැයි කරන ඉල්ලීමක් ලෙස සිතා දේශනාව අවසන්කොට උන්වහන්සේලා විහාරයට වැඩම කළහ.

නැවත උපාසක තුමා පියවි සිහිය ලැබ භික්ෂූන් වහන්සේලා නොදැක තොරතුරු විමසීය. සිදුවූ දේ දරුවන් විසින් පැහැදිලි කරදෙන ලදී. එවිට උපාසක තුමා තමා දුටු ගති නිමිති විස්තර කර දී ඒ බව සනාථ කිරීමට මල්දමක් අහසට දැමීය. ඒ මල් දම දිව්‍ය රථයක රැඳී අහසෙහි නතර විය. මෙම අසිරිය තම දරුවන්ට පෙන්වා තමා කළ පින් දහම් නිසා මරණින් මතු දෙව් ලොව උපදින බව ප්‍රකාශ කොට දරුවන්ට අවවාද දී මියගොස් තව්තිසා දෙව්ලොව උපත ලදහ.

සිදුවූ සියල්ල භික්ෂූන් වහන්සේලා විසින් බුදුරජාණන් වහන්සේට ප්‍රකාශ කළ කල්හී බුදුරජාණන් වහන්සේ ධම්මික උපාසක තුමා මිය ගොස් තව්තිසා දෙව්ලොව උපත ලද බව පෙන්වා දෙමින් කුසල් දහම් වල අප්‍රමාදව යෙදෙන ගිහි පැවිදි කවුරුන් වුවද මොලොව පරලොව දෙකෙහි බොහෝ සේ සතුටුවන බව දේශනා කොට වදාළහ.

පින්වත් සත්පුරුෂයිනි, මේ තථාගත දේශනාවට අනුව අප තේරුම් ගත යුතු වැදගත් කරුණු රාශියක් තිබෙනවා. අපිට සතුටු විය හැකි ක්‍රම කොතෙක් තිබුණත් නිවැරදි හා අර්ථවත් සතුට, පින්දහම් තුළින් ලබන සතුටයි. ඉහත ගාථාවට අනුව මේ අර්ථවත් සතුට ලබන්නා හඳුන්වන්නේ 'කත පුඤ්ඤො' යනුවෙනි. ඔහු සිත - කය - වචනය යන තුන්දොරින් සංවර වී දස පින් ක්‍රියාවන්හි යෙදෙන තැනැත්තාය.

දස පුණ්‍යක්‍රියා යනු මොනවාදැයි සැකෙවින් හඳුනාගැනීම ධම්මික උපාසක තුමා මෙන් දොලොව දියුණුව හා සතුට ලඟා කර ගැනීම පිණිස ඉවහල් වනු ඇත.

01: දාන   ආහාර, වස්ත්‍ර, නිවාස, බෙහෙත්හේත් ආදී මිනිසුන්ගේ මූලික අවශ්‍යතා ලෙස සැලකෙන, ශාසනික වශයෙන් ගත්කළ භික්ෂුවගේ චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන්පස යන අවශ්‍යතා දාන විෂයෙහි පරිත්‍යාග කිරීම හෝ පූජාකිරීම කළ හැකිය. ඒවා අයත් වන්නේ ආමිෂ දානයටයි. මීට අමතරව අභය දාන හෙවත් ජීවිත නොනසා රැක ගැනීමට උපකාරී වීමත් සද්ධර්මයට අදාළ පරිත්‍යාග ධර්ම දානය ලෙසටත් හඳුන්වනවා.

02: සීල   සතුන් මැරීම, සොරකම් කිරීම ආදි දස අකුසල්වලින් දුරුවී තුන්දොර සංවර කරගෙන පිළිවෙත් පිරීම සීලයයි.

03: භාවනා   සිත අපිරිසිදු කරන රාග, ද්වේශ, මෝහ ආදී කෙලෙස් යටපත් කිරිමට හා ප්‍රහාණයට හේතුවන කුසල සිතුවිලි වල පිහිටා සිත ඒකාග්‍රතාවයක පිහිටුවා ගැනීම භාවනාවයි.

04: අපචායන   උඩගු නොවී, මානයෙන් දුරුවී, ගුණධර්මවල පිහිටා තමාට කළ උපකාර පිළිබඳ සිහිකරමින් බුද්ධාදී උතුමන් හටත් දෙමව්පියන්ටත් ගුරුවරුන්ටත් ගෞරවයෙන් කරනු ලබන පූජා අපචායන නම් වේ.

05: වෙය්‍යාවච්ච   ගිලන්වූ අයට, වැඩිමහල් අයට ගුණවන්තයින්ට උවටැන් කිරීම වෙය්‍යාවච්ච ලෙස සැලකේ.

06: පත්තිදාන   අනුන්කෙරෙහි කරුණා සිතින් තමා කළ පින් ඔවුන්ට අනුමෝදන් කිරීම පත්තිදානයයි.

07: පත්තානුමෝදනා   යම් කිසි පුද්ගලයෙක් දානාදී පින්කම් කරන විට ඔහුගේ කුසල් මහිමයට ඊර්ෂ්‍යා නොකොට තමන්ද ශ්‍රද්ධාව උපදවාගෙන එම කුසල් අනුමෝදන් වීම පත්තානුමෝදනාවයි.

08: ධම්ම සවණ   ධර්මය අසා එය මැනවින් දරා එහිම හැසිරී තම ජීවිතය ලෞකික වශයෙන් ද ලෝකෝත්තර වශයෙන් ද යහපත් කරගෙන ඵල ලබාගැනීම ධම්මසවණ නම් වේ.

09: ධම්මදේශනා   ලාභ අපේක්ෂාවන්ගෙන් තොරව සත්හට මෙත් සිතින් යුතුව ධර්මය කියාදීම, ධම්මදේශනා නම් වේ. මෙහිදි භික්ෂූන් වහන්සේ නමක් විසින් ගිහියන් උදෙසා පවත්වනු ලබන ධර්මදේශනා පිළිබඳව පමණක් අදහස් නොකෙරේ. භික්ෂු - භික්ෂූණී - උපාසක - උපාසිකා යන සිව් පිරිසෙන් කවුරුන් විසින් වුවද සිල්වත්ව ගුණවත්ව තමන් ධර්මයෙහි පිහිටා අනුන්ට කියාදීම ධම්මදේශනා නම් පුණ්‍ය ක්‍රියාවට අයත් විය හැකිය.

10: දිට්ඨුජ්ජුකම්ම   දානාදී පුණ්‍ය ක්‍රියාවන්හි ඵලයක් ඇතැයි ආදි ලෙසින් සිතා, ධර්මයෙහි නියම තතු දැන සිත පිරිසිදු කරගෙන වාසය කිරීම දිට්ඨුජ්ජුකම්ම නම් වේ. දැක්මෙහි ඇති ඍජුභාවය හෙවත් චපල නොවූ ස්ථිර දැක්මක් තමා සතු බව සිතා සතුටුවීම මෙහි සරළ අදහසයි.

මෙවැනි පුණ්‍යක්‍රියාවන්හි යෙදෙන බෞද්ධයා තමා කළ කී යහපත් දේ ගැන සිතමින් කාලය ගතකරයි. ඒ නිසා ඔහු මෙලොව සතුටුවන්නෙකි. මරණින් මතු ලබන්නා වූ ආත්ම භාවය ද මරණාසන්න මොහොතේ ඇතිවන කර්ම නිමිති හා ගති නිමිති අනුව යහපත් වන්නේය. මිනිසත්බව ලබා උපන් අප සැම මේ ලද අවස්ථාව ප්‍රයෝජනයට ගෙන කුසලයෙහි පිහිටා පුණ්‍ය ධර්ම රැස්කොට සැපසේ වෙසෙමු.

කුරුණෑගල විසුද්ධායන විද්‍යායතන පිරිවෙනේ ආචාර්ය,
ශාස්ත්‍රපති වික්‍රමසිංහ අතපත්තු